# සිංහල

# 04

## මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය - 2013
දෙවන මුද්‍රණය - 2014
තෙවන මුද්‍රණය - 2015
සිව්වන මුද්‍රණය - 2016
පස්වන මුද්‍රණය - 2017
සයවන මුද්‍රණය - 2018
සත්වන මුද්‍රණය 2019

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978 - 955 - 25 - 0451 - 8

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ ,අංක, 49, දරන ස්ථානයේ පිහිටි,
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් (පුද්.) සමාගමේ හි
මුද්‍රණය කර ප්‍රකාශයට පත්කරන ලදි.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා

ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

පිළිගනු මැන අප භක්ති පූජා

නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා

ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති

ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ

ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා

ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා

එක මවකගෙ දරු කැල බැවිනා

යමු යමු වී නොපමා

ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නොව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

-ආනන්ද සමරකෝන්-



## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

පිරිවෙන් මගින් ගිහි පැවිදි දෙපක්ෂයට ම භාෂා, ආගමික හා සාරධර්ම අධ්‍යාපනය ලබා දීම චිරාත් කාලයක සිට පැවත ආ බැවින්, පිරිවෙන යනු ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එය දේශීය ගිහි පැවිදි ශිෂ්‍ය පරම්පරාව පමණක් නොව විදේශීය විද්‍යාර්ථීන් ද ඥානනය කළ විශ්වවිද්‍යාලයක් බඳු ස්ථානයක් විය. එක් එක් යුගයේ අවශ්‍යතා අනුව සකස් වූ විෂයමාලාවක් පිරිවෙන් අධ්‍යාපනය මඟින් සිසුන් වෙත ප්‍රදානය කරනු ලැබිණි. එබැවින් ම එවැනි අධ්‍යාපන මධ්‍යස්ථාන විශ්ව සම්භාවනාවට පත් විය.

විදේශීය ආක්‍රමණ හමුවේ - විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ - පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් හීන වී ගිය බව සැබෑ ය.

එහෙත් 1753 දී ශ්‍රී ලංකාවේ මහණ උපසම්පදාව යළි පිහිටුවීමට ක්‍රියාකළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ කැපවීම මත පිරිවෙන නැමැති අධ්‍යාපන ආයතනය ශීඝ්‍ර දියුණුවකට පත් ව දෙස් විදෙස් කීර්තියට පත්වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට ද නිදහස් අධ්‍යාපන සංකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අර්ථවත් කිරීම අපගේ පරම අපේක්ෂාවයි. පිරිවෙන් පෙළපොත් නොමිලයේ සැපයීමෙන් රජය ඉහළ වැයක් දැරුව ද එමගින් සමස්ත ජනතාවගේ විනය, සදාචාරය හා යහපැවැත්ම පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙතින් ඉටු වනු ඇතැයි උදක් ම අපේක්ෂා ඇති ව මෙම පොත ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකන අතර මෙම පොත පරිහරණය කිරීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නැණ ගුණ දියුණු වේවායි ද පතමි.



**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

සම්භාව්‍ය අධ්‍යාපනයේ සුවිශේෂී සලකුණ පිරිවෙන් අධ්‍යාපනයයි. ථෙරවාදී සම්ප්‍රදාය කේන්ද්‍ර කරගත් විෂය මාලාව, පුළුල් විෂය ක්ෂේත්‍ර කරා ව්‍යාප්තව ඇත. ලාංකේය සමාජීය අවශ්‍යතා ඉටුකරනු වස් පිරිවෙන් අධ්‍යාපනය ද නව මාන ඔස්සේ සමාජය ආකර්ෂණය කරගෙන සිටියි. පිරිවෙන් අධ්‍යාපනය මඟින් ඉටු කළ යුත්තේ සමාජ අවශ්‍යතා ය. සමාජ අවශ්‍යතා වෙනස් වන විට පිරිවෙන ද, විෂය මාලාව ද, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ඇතුළු පිරිවෙනේ සමස්ත ක්‍රියාවලිය ද අනන්‍යතාව සුරැකෙන අයුරින් වෙනස් විය යුතු ය. එය සමාජයට සම්ප්‍රේෂණය විය යුතු ය. පිරිවෙන් අධ්‍යාපනයෙහි ශාසනික සම්ප්‍රදායන් රැකගනිමින් සසුනේ චිරස්ථිතිය සඳහා ඇවැසි පදනම ගොඩනැගිය යුතු ය.

වර්තමාන ගෝලීය ප්‍රවණතා හමුවේ හුදකලා වූ තැනක පිරිවෙන තිබිය යුතු නැත. විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ කාර්යයෙන් බැහැරවීමට පිරිවෙන් අධ්‍යාපනයට ද නොහැකි ය. එසේ විය යුතු ද නැත. සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය රැකගනිමින්, පිරිවෙන් අධ්‍යාපනය යාවත්කාලීන කිරීම උදෙසා නව ඉගෙනුම් ක්‍රියාකාරකම්, ක්‍රම ශිල්ප හා තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගත යුතු අතර ඒවායින් බැහැර වීම සිදු නොවිය යුතුය.

නිපුණතා පාදක විෂයමාලා ප්‍රතිසංස්කරණය අනුව මෙම පෙළ පොත ද සම්පාදනය කර ඇත. පිරිපුන් සමාජයක් ගොඩනැගීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේද මඟින් නූතන ලෝකයේ ශීඝ්‍ර ලෙස ප්‍රසාරණය වන දැනුම යාවත්කාලීන කිරීමට උනන්දු විය යුතු ය. හුදෙක්ම අධ්‍යාපනය යනු ආර්ථික සංවර්ධනය සඳහා ම සීමා වූවක් නොවේ. එය දැනුම් ආර්ථිකයක් පදනම් කරගත් සංකල්ප ඔස්සේ ගමන් කරන ආධ්‍යාත්මික සංවර්ධනයෙන් සතුටු වන පුරවැසියකු නිර්මාණය කිරීමට ද ඉවහල් කොට ගත යුතුය.

ශිෂ්‍ය මිතුරු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අනුව සකස් කර ඇති මෙම පෙළ පොත ඔබට මාර්ගෝපදේශයකි. එය යළි භාවිත කළ හැකි අයුරින් පරිශීලනය කිරීම ඔබගේ යුතුකමක් මෙන් ම වගකීමකි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## පෙරවදන

ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා බුද්ධිමත් ගුණවත් භික්ෂු භික්ෂුණී පරපුරක් මෙන්ම ධර්මානුධර්ම පටිපන්න උවසු උවැසියන් පිරිසක් ද සිටිය යුතු ය. ඒ සඳහා මැනවින් අධ්‍යාපනය ලබා ශික්ෂණය විය යුතු ය. ශික්ෂිත පුරවැසියා ලෝකයට සම්පතකි. පිරිවෙන් අධ්‍යාපනයෙන් ලබන දැනුම පමණක් නොව භාවනා ක්‍රම පුහුණු වීම ආදියෙන් ලබන මානසික සංවර්ධනය, මිනිස් ජීවිතයේ ලැබිය හැකි ලෞකික හා ලෝකෝත්තර සියලු පුරුෂාර්ථ සාධනය කිරීමෙහිලා පිටිවහලකි.

ත්‍රිවිධ ශාසනයේ ගැඹුර හා එහි අනේකවිධ වටිනාකම් පිළිබඳ ලබන අවබෝධය අතිශය වැදගත් වේ. අප හමුවේ ඇති අනාගත අභියෝග සාර්ථකව ජයග්‍රහණය කරනු වස් ඒ සඳහා අවැසි දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත යුතු ය. ලෝකයේ විශිෂ්ටතම දාර්ශනික වූත් ඓතිහාසික වූත් ජීවන රටාවක හිමිකම අපට ඇත. පිරිපුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාර්යක්ෂමව ඵලදායී අයුරින් කටයුතු කළ යුතු ය. විශ්වීය පුරවැසියකු ලෙස ඔබගේ උත්සාහය, කැපවීම හා අධිෂ්ඨානශීලීව කටයුතු කිරීම, තිරසර සංවර්ධනයට ද රුකුලකි.

මෙම පොත සම්පාදනය කිරීම සඳහා කටයුතු කළ ලේඛක හා සංස්කාර මණ්ඩලයේ සියලු දෙනාටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාව හිමිවේ.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය, බත්තරමුල්ල.
2019-04-10

**නියාමනය හා අධීක්ෂණය**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**මෙහෙයවීම**

| | | |
|---|---|---|
| විජිත වෙලගෙදර | - | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**සම්බන්ධීකරණය**

| | | |
|---|---|---|
| පූජ්‍ය රංවල පඤ්ඤාවාස හිමි | - | පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ<br>නිලධාරී<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩී.එම්.ජේ. පුෂ්පකුමාර | - | නියෝජ්‍ය කොමසාරිස් (පාලන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**උපදේශක මණ්ඩලය**

| | | |
|---|---|---|
| මහාචාර්ය විමල් ජී. බලගල්ලේ | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය රත්න විජේතුංග | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන | - | සිංහල අධ්‍යයන අංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය |

**ලේඛක මණ්ඩලය**

| | | |
|---|---|---|
| පූජ්‍ය නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි (සභාපති) | - | පරිවේණාචාර්ය<br>විද්‍යාලංකාර පිරිවෙන<br>කැලණිය |
| පී. එල්. ලලිත් අබේසේකර | - | ගුරු උපදේශක (පිරිවෙන්)<br>මහ/ ශ්‍රී සංඝරාජ පිරිවෙන<br>මහනුවර |
| ආර්. එම්. තේමිය චන්ද්‍රරත්න | - | පරිවේණාචාර්ය<br>මහ/ ශ්‍රී සංඝරාජ පිරිවෙන<br>මහනුවර |
| ආර්. එම්. සීලවංශ | - | පරිවේණාචාර්ය (විශ්‍රාමික)<br>සිරිධම්මරතන පිරිවෙන<br>බොවාගම<br>නාවලපිටිය |

**සංස්කරණය**

| | | |
|---|---|---|
| පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කැලණිය විශ්වවිද්‍යාලය |

**සෝදුපත් කියවීම**

| | | |
|---|---|---|
| කුසුමලතා ලංකාමුල්ල | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සිංහල සහ ජන සන්නිවේදන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

**පිට කවරය :-**

| | | |
|---|---|---|
| ඩී. එච්. මිතිල උදාර | - | පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |


**පරිගණක තාක්ෂණය**

| | | |
|---|---|---|
| කේ. පී. ජනිත් හර්ෂාන් සිල්වා | - | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | |
|---|---|---|
| 01 | අක්ෂර මාලාව | 01 |
| 02 | නාම පද | 15 |
| 03 | සන්ධි | 23 |
| 04 | සමාස | 34 |
| 05 | ප්‍රත්‍යයාර්ථ නාම | 45 |
| 06 | ආඛ්‍යාත පද | 55 |
| 07 | නෛපාතික කෘදන්ත | 69 |
| 08 | වාක්‍ය නිර්මාණය | 79 |
| 09 | රචනය | 93 |
| 10 | සාරාංශකරණය | 98 |
| 11 | විරාම ලක්ෂණ | 106 |
| 12 | පද බෙදීම | 116 |
| 13 | අර්ථාවබෝධය | 123 |
| 14 | ප්‍රදේශීය භාෂා | 127 |
| 15 | ප්‍රායෝගික ලේඛන | 138 |
| 16 | සාහිත්‍ය රසාස්වාදය | 146 |
| 17 | සාහිත්‍ය විචාර මූලධර්ම | 153 |

# 1 අක්ෂර මාලාව



ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමග මිනිසුන් සිය අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාවිත කළ ප්‍රධාන මාධ්‍යය වූයේ භාෂාව යි. එහි දී ඔවුන් සිය අදහස් මූලික වශයෙන් ශබ්ද පදනම් කරගෙන අන් අයට ඇසීමට සලස්වා ඇත. ක්‍රමයෙන් භාෂාව ලේඛනයට නැගීමේ අවශ්‍යතාව මතුවීමත් සමග එය කිසියම් දෘශ්‍ය සංකේත විශේෂයක් ඇසුරෙන් ඉදිරිපත් කරන්නට විය. අක්ෂර යනුවෙන් හැඳින්වෙන්නේ ඒ විශේෂ ශබ්ද සංකේත යි.

දුරාතීතයේ සිට එසේ සකස් වෙමින් ආ අක්ෂර සමූහ සිංහල භාෂාවේ දී අක්ෂර මාලාව, වර්ණ මාලාව, හෝඩිය යන නම්වලින් හැඳින්වේ.

## 1.1 අක්ෂර මාලාව

අක්ෂ + ර යන පද විග්‍රහයට අනුව අක්ෂ යනු සලකුණ යි. ර යනු හඬ යි. සලකුණකින් යුත් හඬ, අක්ෂර යන්නෙහි අර්ථය යි.

ශබ්ද සංකේත ලේඛනයේ දී හා භාෂණයේ දී කෙතරම් භාවිත කළත් ක්ෂය වීමක් හෝ අවසන් වීමක් සිදු නොවේ. එම අර්ථයෙන් ද අක්ෂර යන නම යෙදී ඇති බව

**නාක්ෂරන්තීති අක්ෂරම්**

යන විග්‍රහයෙන් පැහැදිලි වේ.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

භාෂාව යනු අදහස් හුවමාරු කර ගැනීමට තිබෙන මාධ්‍යයකි. භාෂාව, ඒකක තුනක් ඔස්සේ භාවිත කිරීමෙන් අදහස් හුවමාරු කර ගැනීම සිදු වේ. එම ඒකක තුන නම් අක්ෂර හෙවත් අකුරු, වචන සහ වාක්‍ය යි. මේ භාවිතයට අනුව අක්ෂර භාෂාවක කුඩා ම ඒකකය යි.

මේ ආකාර විවිධ ශබ්ද ඇති අක්ෂර, අතීතයේ සිට විවිධ හැඩ ඔස්සේ පරිණාමය වෙමින් වර්තමාන භාවිතයට පැමිණ ඇත. එහි දී අක්ෂරවල හැඩය පමණක් නොව ප්‍රමාණාත්මක වෙනස්කම් රාශියක් ද සිදු ව ඇති බව දක්නට ඇත. සිංහල අක්ෂර මාලාව අතීතයේ පටන් විවිධ නම්වලින් හැඳින්වී තිබීමෙන් එය තහවුරු වේ.

* බ්‍රාහ්මී අක්ෂර මාලාව
* සිදත් සඟරා අක්ෂර මාලාව
* අමිශ්‍ර (ශුද්ධ) සිංහල අක්ෂර මාලාව
* මිශ්‍ර සිංහල අක්ෂර මාලාව
* නූතන සිංහල අක්ෂර මාලාව

මේ වෙනස්වීම්වලට භාජනය වෙමින් ආ සාම්ප්‍රදායික අක්ෂර මාලාව, අක්ෂර 54කින් යුක්ත ය. ඉංග්‍රීසි භාෂාවෙන් එක් වූ F / Ph අක්ෂරය ඇතුළත්....

Toffee (ටොෆී)
Floride (ෆ්ලෝරයිඩ්)
Fernando (ෆර්නැන්ඩු)
Pharmacy (ෆාමසි)

වැනි වචන සිංහලෙන් ලිවීමේ දී F/Ph වෙනුවට මෑතක් වන තුරු ම භාවිත කළේ ''ඵ'' යන මිශ්‍ර සංකේතය යි. ඒ සඳහා මේ වන විට ''ෆ'' යන සංකේතය සම්මත ව ඇති බැවින් සිංහල අක්ෂර මාලාවට ''ෆ'' සංකේතය අක්ෂරයක් ලෙස එක් වී ඇත. ඒ අනුව එම ''ෆ'' අක්ෂරයත්, සඤ්ඤකාක්ෂර හෙවත් අර්ධානුනාසික යනුවෙන් හැඳින්වෙන,

| | | | | |
|---|---|---|---|---|
| ඟ | ඦ | ඬ | ඳ | ඹ |

යන අක්ෂර 5ත් ඇතුළත් කරමින් සිංහල අක්ෂර මාලාව අක්ෂර හැටක් (60) වශයෙන් සම්මත ව ඇත. පහත දක්වෙන්නේ එකී අක්ෂර මාලාව යි.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

## ක්‍රියාකාරකම 1.1.1

කෙටි පිළිතුරු ලියන්න.

1. භාෂාව යනු කුමක් දැ’ යි සරල ව දක්වන්න?
2. ශබ්ද සඳහා සංකේත භාවිත කිරීමට සිදු වූයේ ඇයි?
3. අක්ෂර යනු මොනවා ද?
4. අක්ෂර මාලාව හැඳින්වීම සඳහා තිබෙන තවත් නම් මොනවා ද?
5. අක්ෂර යන්නෙහි පදාර්ථ ලියන්න.
6. භාෂාව සෑදී ඇති ඒකක තුන මොනවා ද?
7. සිංහල අක්ෂර මාලාව අතීතයේ සිට භාවිත වී තිබූ ආකාර නම් කරන්න.
8. සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ අක්ෂර කීය ද?
9. නූතනයේ සම්මත කර ඇති අක්ෂර මාලාවේ සංකේත කීය ද? එය ලියා දක්වන්න.
10. ඉංග්‍රීසි භාෂාවෙන් අක්ෂර මාලාවට එකතු වූ අක්ෂරය කුමක් ද?
11. අර්ධානුනාසිකාක්ෂර නම් කරන්න.
12. ‘‘ෆ’’ අක්ෂරය ඇතුළත් වචන තුනක් ලියන්න.

## ක්‍රියාකාරකම 1.1.2

සිදත් සඟරා හෝඩිය ඇසුරෙන් හිස්තැන් පුරවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | --- | ඉ | --- | උ | --- |
| එ | --- | --- | ඕ | | |
| ක | --- | ජ | | | |
| ට | ඩ | --- | | | |
| ත | --- | න | | | |
| ප | --- | --- | | | |
| ය | ර | --- | ව | | |
| --- | හ | ළ | (අ)ං | | |

## ක්‍රියාකාරකම 1.1.3

සාම්ප්‍රදායික සිංහල අක්ෂර මාලාවෙන් නූතන සම්මත සිංහල අක්ෂර මාලාව වෙනස් වන්නේ කවරාකාරයකින් දැ’ යි දක්වන්න.

## ක්‍රියාකාරකම 1.1.4

සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ ඇති, සිදත් සඟරා අක්ෂර මාලාවේ නැති අක්ෂර ලියා දක්වන්න.

## 1.2 ලිඛිත අක්ෂර ව්‍යවහාරය

ලිඛිත අක්ෂර ව්‍යවහාරය යනු අක්ෂර මාලාව යටතේ ඉගෙන ගත් අක්ෂර, ලේඛනය සඳහා භාවිතයට ගන්නා ආකාරය යි. සිංහල අක්ෂර මාලාව ආකාර හතරකින් එසේ භාවිතයට හෙවත් ව්‍යවහාරයට ගැනේ. පහත දැක්වෙන්නේ එය යි.

### අක්ෂර ව්‍යවහාරය

1. **කේවල ස්වර**

   වචනයක තනි ව යෙදෙන ස්වර කේවල ස්වර යි.

   අ ආ ඇ ඈ ඉ ඊ ආදිය යි.

   අම්මා, ආතා

2. **කේවල ව්‍යඤ්ජන**

   වචනයක තනි ව යෙදෙන ව්‍යඤ්ජන කේවල ව්‍යඤ්ජන යි.

   ග් ට් ප් ශ් ආදිය යි.

   අම්මා, අප්පච්චි

3. **ස්වරාරූඪ ව්‍යඤ්ජන**

   වචනයක යෙදෙන ස්වරයක් සහිත ව්‍යඤ්ජන ස්වරාරූඪ ව්‍යඤ්ජන යි.

   ග් + අ = ග / ද් + අ = ද

   ගඟ , දහම්

4. **සංයුක්ත ව්‍යඤ්ජන**

   ව්‍යඤ්ජන දෙකක් හෝ තුනක් ස්වරයකින් අන්ත ව සැකසෙන්නේ සංයුක්ත ව්‍යඤ්ජන යි. මේවා බැඳි අකුරු ලෙස ද හැඳින්වේ.

   න් + ධ + අ = න්ධ, සන්ධි

   ර්+ ත් + ථ් + අ = ර්ත්ථ, අර්ත්ථ



නොමිලේ බෙදා හැරීම පිණිසයි

අක්ෂර ව්‍යවහාරයේ දී සංයුක්තාක්ෂර (බැඳි අකුරු) සැකසෙන ආකාර කීපයක් ඇත. ඒවා පහත දැක්වේ.

1. පූර්ව ව්‍යඤ්ජනාක්ෂරයේ හල් සවභාවය දැක්වීම සඳහා ඊළඟ ව්‍යඤ්ජනාක්ෂරය සමග ස්පර්ශ වන සේ ලිවීම.

උදා :- ග් + ග = ගග
ස් + ස = සස
ෂ් + ට = ෂට
ෂ් + ඨ = ෂඨ

2. පූර්ව ව්‍යඤ්ජනාක්ෂරයේ අඩක් ඊළඟ ව්‍යඤ්ජනාක්ෂරයේ බැඳ ලිවීම.

උදා :- ජ් + ඤ් + අ = ඥ
න් + ද් + අ = න්‍ද
ක් + ෂ් + අ = ක්‍ෂ
ත් + ව් + අ = ත්‍ව

3. අර්ධානුනාසිකය හා ව්‍යඤ්ජනාක්ෂරය බැඳී ඇතිවිට අර්ධානුනාසිකය සඳහා වක්‍ර රේඛා අර්ධයක් මුලින් යෙදීම.

උදෘ :- ඞ් + ග් + අ = ඟ
න් + ද් + අ = ඳ
ණ් + ඩ් + අ = ඬ

4. සංයුක්ත ව්‍යඤ්ජනාක්ෂරවල අවසාන අකුර ''ය්'' වූ විට ''ය'' සඳහා යංශය යෙදීම.

උදා :- ත් + ය් + අ = ත්‍ය
ශ් + ය් + අ = ශ්‍ය
ද් + ය් + අ = ද්‍ය/ද්‍ය

5. සංයුක්ත ව්‍යඤ්ජනාක්ෂරවල මුල් "ර්" කාරය රේඵයෙන් දැක්වීම.

උදා :- ර් + ධ් + අ = ර්‍ධ
ර් + ප් + අ = ර්‍ප
ර් + ම් + අ = ර්‍ම


නොමිලේ බෙදා හැරීම පිණිසයි

6. සංයුක්තාක්ෂරවල අවසානයේ "ර්" වූ විට එය රකාරාංශයෙන් දැක්වීම.

උදා :- ශ් + ර් + අ = ශ්‍ර
ග් + ර් + අ = ග්‍ර
හ් + ර් + අ = හ්‍ර

## ක්‍රියාකාරකම 1.2.1

පහත දැක්වෙන වචනවල සංයුක්තාක්ෂර උපුටා ඒවායේ සංයුක්ත ව්‍යඤ්ජන හා ස්වර වෙන් කර දක්වන්න.

උදා :- ලකුණ්ඨක - ණ්ඨ - ණ් + ඨ් + අ

1. සද්ධි විහාරික
2. සන්ධි
3. ලක්ෂණ
4. සද්ධර්ම
5. ස්වදේශවාත්සල්‍යය
6. ව්‍යඤ්ජනාක්ෂර
7. සම්බුද්ධත්ව ජයන්තිය
8. ප්‍රාර්ථනා
9. විශ්වවිද්‍යාලයය

## ක්‍රියාකාරකම 1.2.2

පහත සඳහන් වචන සංයුක්තාක්ෂර භාවිත කර ලියන්න.

1. සත්‍ය
2. කාර්යාලයය
3. තත්වජ්ඤ
4. ඡන්දශ්ශාස්ත්‍රය
5. පරිකල්පන ශක්තිය
6. කණ්ඨක චෛත්‍යය
7. විද්‍යා පීඨය
8. නෂ්ටප්‍රාප්ත
9. පරනිම්මිත වසවත්තිය
10. ධර්ම ශාස්ත්‍රීය



නොමිලේ බෙදා හැරීම පිණිසයි

## 1.3 පිලි භාවිතය

අක්ෂර ව්‍යවහාරයේ දී පිලි භාවිතය ද වැදගත් වේ. ව්‍යඤ්ජනාක්ෂර භාවිතයේ දී ක්‍රම දෙකක් අනුගමනය කෙරේ. ඉන් පළමු ක්‍රමය හල් අකුරු වශයෙන් යෙදීම යි.

උදා :- ක් - අක්කා
ත් - තාත්තා
න් - සන්ධි

දෙවන ක්‍රමය නම් ස්වරාරූඪ ව්‍යඤ්ජනයක් වශයෙන් යෙදීම යි.

උදා :- ශ් + ආ = ශා - ශාලාව
ග් + ඊ = ගී - ගීත
න් + ඇ = නැ - නැණ

ව්‍යඤ්ජනයකට ස්වරාරූඪ වී ඇති බව දැක්වීම සඳහා ඒ ඒ ස්වර සලකුණු භාවිත කෙරේ. ඒ ස්වර සලකුණු පිලි යනුවෙන් හැඳින්වේ.

පිලි භාවිතයට අදාළ පහත සඳහන් නිදසුන් වගුව බලන්න.

### පිලි යෙදීම

| ස්වරය | පිල්ලම | පිල්ලමේ නම | උදාහරණ |
|---|---|---|---|
| අ | නැත | ව්‍යඤ්ජනයේ හල් ලකුණ ඉවත් කෙරේ. | ග් + අ = ග |
| ආ | ා | ඇලපිල්ල | ග් + ආ = ගා |
| ඇ | ැ | ඇදය | ග් + ඇ = ගැ |
| ඈ | ෑ | දීර්ඝ ඇදය | ග් + ඈ = ගෑ |
| ඉ | ි | ඉස්පිල්ල | ග් + ඉ = ගි |
| ඊ | ී | දීර්ඝ ඉස්පිල්ල | ග් + ඊ = ගී |
| උ | ු | පාපිල්ල | ප් + උ = පු |
|  | ු | කෙටි වක් පාපිල්ල | ග් + උ = ගු |
| ඌ | ූ | දීර්ඝ පාපිල්ල | ප් + ඌ = පූ |
|  | ූ | දීර්ඝ වක් පාපිල්ල | ග් + ඌ = ගූ |
| ඍ | ෘ | ගැට ඇලපිල්ල | ග් + ඍ = ගෘ |
| ඎ | ෲ | ගැට ඇලපිලි දෙක | ග් + ඎ = ගෲ |
| ඏ | ෟ | ගයනුකිත්ත | ග් + ඏ = ගෟ |
| ඐ | ෳ | ගැටය සහිත ගයනුකිත්ත | ග් + ඐ = ගෳ |
| එ | ෙ | කොම්බුව | ග් + එ = ගෙ |
| ඒ | ේ | කොම්බුව හා දීර්ඝත්ව ලකුණ | ග් + ඒ = ගේ |
| ඓ | ෛ | කොම්බු දෙක | ග් + ඓ = ගෛ |
| ඔ | ො | කොම්බුව හා ඇලපිල්ල | ග් + ඔ = ගො |
| ඕ | ෝ | කොම්බුව හා දීර්ඝත්ව ලකුණ සහිත ඇලපිල්ල | ග් + ඕ = ගෝ |
| ඖ | ෞ | කොම්බුව හා ගයනුකිත්ත | ග් + ඖ = ගෞ |

## ක්‍රියාකාරකම 1.3.1

1. අදාළ පිල්ලම යොදා නැවත ලියන්න.

ක් + ඉ =

ස් + උ =

ජ් + ඇ =

න් + ආ =

ක් + ෂ් + ඊ =


ව් + ර් + ආ =

හ + ර් + ඌ =

ක් + ඎ =

ත් + ඍ =

2. පහත වෘත්තය; ස්වරය, පිල්ලම, පිල්ලම සහිත ව්‍යඤ්ජනය යොදා සම්පූර්ණ කරන්න.



3. පහත දැක්වෙන වචන පිලි භාවිතයෙන් තොර ව ලියා දක්වන්න.

(අනුරාධපුර, මිහින්තලය, මුනිදාස, කුමාරගුප්ත, පෘථිවිය, කෛලාසනය)

උදා :- අ + න් + උ + ර් + ආ + ධ් + අ + ප් + උ + ර් + අ

4. ලේඛනයේ දී පිලි භාවිතයේ ඇති අවශ්‍යතාව පිළිබඳ ව ඔබේ අදහස ලියන්න.

## 1.4 අක්ෂර වින්‍යාසය

අක්ෂර වින්‍යාසය යනු වචනාර්ථයට අදාළ අක්ෂරය නියමිත තැන යෙදීම යි. අක්ෂර භාවිතයේ දී අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධය භාෂාව නිවැරදි ව හැසිරවීමට උපකාර වේ. එසේ නොමැති වූ විට වචනවලින් අපේක්ෂිත අර්ථ වෙනස්වීම ස්වාභාවික ය.

ලේකම් තුමා ධර්මෝදය පිරිවෙනේ
ත්‍යාග ප්‍රධානෝත්සවයට සහභාගි විය.

මෙම වාක්‍යයෙන් අදහස් කර ඇත්තේ තෑගි දීමක් පිළිබඳ උත්සවයකට ලේකම්තුමා සහභාගි වූ බවකි. එහෙත් ප්‍රධානෝත්සවය යන වචනයේ යෙදී ඇති "ධා" අක්ෂරය නිසා එම අදහස වෙනුවට ප්‍රධාන තෑගි පිළිබඳ අදහසක් මතු වේ.

ඒ අනුව ඉහත වාක්‍යය පහත සඳහන් පරිදි වෙනස් කළ විට ඉන් අපේක්ෂා කළ අදහස මතු වේ.

ලේකම් තුමා ධර්මෝදය පිරිවෙනේ
ත්‍යාග ප්‍රදානෝත්සවයට සහභාගි විය.

මේ ආකාරයට සමාන හඬ හා හැඩ ඇති අක්ෂර සිංහල අක්ෂර මාලාවේ ඇති බැවින් ඒවා අදාළ ස්ථානවල ලිවීම වැදගත් වේ.

නිදසුන් වශයෙන් සිංහල අක්ෂර මාලාවේ, අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති කීපයක් විමසා බලමු.

## ශ, ෂ, ස සම්බන්ධ රීති

1. තාලුජ අක්ෂරයක් සමග සංයුක්ත වන්නේ ශ කාරය යි.

   නිශ්ශබ්ද

   දුශ්චරිත

2. මූර්ධජාක්ෂරයකට මුලින් ෂ කාරය යෙදේ.

   විෂ්ණු

   ශිෂ්ට

3. දන්තජාක්ෂරයකට මුලින් ස කාරය යෙදේ.

   පුස්තකාලය

   ඉඩප්‍රස්තාව

4. කණ්ඨජාක්ෂරයකට පූර්වයෙන් ස කාරය යෙදේ.

   සකස්කඩය

   නමස්කාරය

5. දන්තජ න කාරයට පූර්වයෙන් (බොහෝවිට) ශ කාරය යෙදේ.

   විකාශනය          දේශනය

   විමර්ශනය          ශාසනය

## ඓ ඖ සම්බන්ධ රීති

1. ඓ ස්වරය ව්‍යඤ්ජනයක් සමග යෙදෙන විට කොම්බු දෙකක් (ෛ) යෙදේ. ''ඓ'' ස්වරයේදී එක කොම්බුවක් පමණක් යෙදේ.

උදා :- වෛද්‍ය | ඓතිහාසික
නෛතික | ඓරාවණ
මෛත්‍රිය | ඓක්‍යය
ශෛලිය | ඓශ්චර්ය

2. ඖ ස්වරය ව්‍යඤ්ජනයක් සමග යෙදෙන විට මුලින් කොම්බුව ද (ෙ) අගින් ගයනුකිත්ත ද (ෟ) යෙදේ. ''ඖ'' ස්වරය ලියන විට මුලින් කොම්බුව ලියනු නොලැබේ.

උදා :- නෞකාව | ඖෂධ
කෞතුක | ඖදර්ය
සෞඛ්‍යය | ඖචිත්‍යය
ගෞරවය | ඖරස

### ක්‍රියාකාරකම 1.4.1

සුදුසු ඌෂ්මාක්ෂර යොදා හිස්තැන් පුරවන්න

1. දු____චරිත
2. විනි____චය
3. නි____පාදනය
4. විකර්____ණය

5. විමර්....නය
6. ඉ....ටාර්ථය
7. විකා....නය
8. ප්‍ර....තාරය
9. විකා....ය
10. දර්....කය
11. විලා....ය
12. පා....ණ

## ක්‍රියාකාරකම 1.4.2

ඓ, ඖ ස්වර දෙක ව්‍යඤ්ජනාරූඪ ව යෙදී ඇති වචන 10 බැගින් ලියන්න.

### පුහුණුවට

**පණකුරු ගතකුරු ඈ නම් ලකුණෙන් හඳුන්වනු සන් නම්**
-සිදත් සඟරාව-

ප්‍රාණාක්ෂර ගාත්‍රාක්ෂර ආදි නාම ලක්ෂණයන්ගෙන් හැඳින්වීම සංඥා නම් වේ.

**පණකුරු පසෙක් එද - ලුහු ගුරු බෙයින් දස වේ**
**ගතකුරු ද වේ විස්සෙක් - වහරට යුහු සිය බසැ.**
-සිදත් සඟරාව-

සිංහල භාෂාවේ ව්‍යවහාරයට යෝග්‍ය වූ ප්‍රාණාක්ෂර පහකි. ඒවා ලඝු-ගුරු භේදයෙන් දහයක් වේ. ගාත්‍රාක්ෂර ද විස්සක් වේ.

*සංකල්පනා*

**ධෛර්යය සම්පන්න පුද්ගලයා ආත්ම විශ්වාසයෙන් ද පරිපූර්ණ වූවෙකි.**



නොමිලේ බෙදා හැරීම පිණිසයි

# 2 නාම පද

කිසියම් ප්‍රාණියෙකු හෝ දෙයක් හෝ ස්ථානයක් හෝ සංකල්පයක් හැඳින්වීම සඳහා යොදනු ලබන පද නාම පද නම් වේ. මෙම පාඩමෙන් නාම පද හා නාමපද වර්ග පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට ඔබට පුළුවන.

ඤාණවිමල පණ්ඩිත හාමුදුරුවන් පෙර දිනෙක ලබා දුන් උපදෙස් අනුව සමිත, විමල සහ සුජාත යන ශිෂ්‍ය හිමිවරු පන්තිය ඉදිරියට පැමිණ සාකච්ඡා මණ්ඩපයක ස්වරූපයට අසුන් ගත්හ.

**සමිත හිමි :-** අද අපි සාකච්ඡා කරන්නේ භාෂාව භාවිතයේ දී අපට නිරන්තරයෙන් හමුවෙන පද විශේෂයක් පිළිබඳව යි. එනම්, නාමපද පිළිබඳව යි. අප හැමෝට ම හඳුනා ගැනීම සඳහා නමක් තියෙනවා. වට පිටාවේ තියෙන හැම දේකටමත් නමක් තියෙනවා. පිරිවෙනට, පිරිවෙන පිහිටලා තියෙන ගමට හෝ නගරයටත් නමක් තියෙනවා. නමක් දීලා තියෙන්නේ වෙනත් දේවලින් වෙන්කර හඳුනා ගැනීමට යි. ඒ නිසා නාම පද මේ විදියට හඳුන්වන්න මම කැමතියි.

අයෙක්, තවත් අයෙකුගෙන් වෙන් කර ගැනීමටත්, යම් දෙයක් වෙනත් දේවලින් වෙන් කර ගැනීමටත්, යම් ස්ථානයක්, සංකල්පයක් අනෙක් තැන් වලින් වෙන්කර ගැනීම පිණිසත් යොදන පද නාම පද නම් වේ.

**විමල හිමි :-** හැම දෙයක ම හට ගැන්මක් තියෙනවා. ඒ වගේ නාම පදවලටත්, හට ගැන්මක් තියෙනවා. නාම පද හැදෙන්නේ කොටස් දෙකක එකතුවෙන්. බලන්න මේ වගුව;

| නාමය + | විභක්ති ප්‍රත්‍යය | නාම පදය |
|---|---|---|
| මිනිස් + | ආ | මිනිසා |
| මිනිස් + | උන් | මිනිසුන් |
| මිනිස් + | ආගේ | මිනිසාගේ |

නාමය හා විභක්ති ප්‍රත්‍යය එකතු වීමෙන් තමයි නාම පද හැදෙන්නේ. නාමය සාමාන්‍යයෙන් වෙනස් වෙන්නේ නැහැ. එය ශබ්ද ප්‍රකෘති නමින් ද හඳුන්වනවා. විභක්ති ප්‍රත්‍යයට අනුව නාමය වෙනස් ස්වරූපවලට නැමෙන නිසා මේවා නාම්‍ය නමින් ද හඳුන්වනවා. මේ පත්‍රිකාව හොඳින් කියවන්න. එවිට ඔබ වහන්සේලාට නාම පදවල තවත් ලක්ෂණ කීපයක් හඳුනා ගත හැකියි.

| නාම පදය | ලිංගය | වචනය | විභක්තිය |
|---|---|---|---|
| මිනිසා | පුරුෂ | ඒකවචන | පෙර |
| මිනිසුන් | පුරුෂ | බහුවචන | කම් |
| ශිෂ්‍යාවෝ | ස්ත්‍රී | බහුවචන | පෙර |
| ශිෂ්‍යයාවගේ | ස්ත්‍රී | ඒකවචන | සබඳ |
| රටෙහි | නපුංසක | ඒකවචන | ආධාර |
| රටවලින් | නපුංසක | බහුවචන | කරණ |

හැම නාම පදයක් ම ලිංග, වචන, විභක්ති, නියෝජනය කරන බව මේ සටහනෙන් ඔබට පැහැදිලි වෙනවා ඇති. නාම පදවල තවත් ලක්ෂණයක් හඳුනා ගැනීමට පහත දක්වෙන කවිය අවධානයෙන් යුතු ව කියවන්න.

අහස ලස්සනයි තරුකැට දිලෙන විට
මුහුද ලස්සනයි රළ පෙළ නැගෙන විට
මුහුණ ලස්සනයි හසරැලි නගන විට
ලොවම ලස්සනයි ළමයින් සිටින විට

ඉරි ඇඳි නාම පද විමසිල්ලෙන් බලන විට ඒවා ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද වශයෙන් දෙකොටසක් ඇති බව පෙනෙයි.

**සුජාත හිමි :-** මා සූදානම් වෙන්නේ නාමපදවල තවත් ලක්ෂණ කීපයක් ඉදිරිපත් කිරීමට යි. මේ වගුව දෙස බලන්න.

| ලිංග | නාමය | නාම පදය |
|---|---|---|
| පුරුෂ ලිංග | මිනිස්, උරුලෑ | මිනිසා, උරුලෑවා |
| ස්ත්‍රී ලිංග | දෙන්, ගැහැනු | දෙන, ගැහැනිය |
| නපුංසක ලිංග | ගස්, රට | ගස්, රට |

මෙහි මිනිස්, දෙන්, ගස්, යන නාම හල් අකුරුවලින් අවසන් වී තිබේ. එසේ හල් අකුරුවලින් අවසන් වන නාම **හලන්ත නාම** ලෙස හැඳින්වේ.

උරුලෑ, ගැහැනු, රට යන නාම අවසන් වී ඇත්තේ ස්වරයකිනි. ස්වරයක් අන්තයේ යෙදෙන නාම **ස්වරාන්ත නාම** නම් වේ.

පහත වගුවෙන් නාම ප්‍රභේද කීපයක් දැක් වේ.

| | |
|---|---|
| නාම නාම | වලස්, ගොන් |
| සර්ව නාම | මම, ඔහු |
| සමාස නාම | පින්හාල්, දිගැසි |
| තද්ධිත නාම | නැණවත්, දිගටි |
| කෘදන්ත නාම | ගයන, බලන |

දැන් අපි නාමයක් විභක්ති ගන්වන ආකාරය විමසා බලමු. මෙය නාම වරනැගීම ලෙස හැඳින්වේ.

### 1. ප්‍රාණවාචී පුරුෂ ලිංග ස්වරාන්ත නාම - දරු ශබ්දය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර | දරුවා | දරුවෝ |
| කම් | දරුවා | දරුවන් |
| කතු | දරුවා විසින් | දරුවන් විසින් |
| කරණ | දරුවා කරණකොට | දරුවන් කරණකොට |
| සපදන් | දරුවාට | දරුවන්ට |
| අවදි | දරුවාගෙන් | දරුවන්ගෙන් |
| සබඳ | දරුවාගේ | දරුවන්ගේ |
| අදර | දරුවා කෙරෙහි | දරුවන් කෙරෙහි |
| අලප් | දරුව | දරුවෙනි |

බලු, කුරුලු, වඩු, ඌරු වැනි ශබ්ද මෙසේ විභක්ති ගැන්විය හැකි ය. පුරුෂ ලිංග ස්වරාන්ත නාමවල අගට යෙදෙන ස්වරය අනුව වරනැගීමේ දී ඇතැම් රූපවල වෙනස්කම් පවතී.

(අ) අකාරාන්ත ශිෂ්‍ය ශබ්දය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර (ප්‍රථමා) | ශිෂ්‍යයා | ශිෂ්‍යයෝ |
| කම් (කර්ම) | ශිෂ්‍යයා | ශිෂ්‍යයන් |
| කතු (කර්තෘ) | ශිෂ්‍යයා විසින් | ශිෂ්‍යයන් විසින් |

(ආ) ඉකාරාන්ත නරි ශබ්දය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර (ප්‍රථමා) | නරියා | නරියෝ (නරි) |
| කම් (කර්ම) | නරියා | නරියන් |
| කතු (කර්තෘ) | නරියා විසින් | නරියන් විසින් |

(ඉ) 'ආ' කාරාන්ත ගිරා ශබ්දය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර (ප්‍රථමා) | ගිරවා | ගිරවු |
| කම් (කර්ම) | ගිරවා | ගිරවුන් |
| කතු (කර්තෘ) | ගිරවා විසින් | ගිරවුන් විසින් |

## 2. ස්ත්‍රීලිංග ස්වරාන්ත ශබ්ද - අකාරාන්ත අඟන ශබ්දය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර (ප්‍රථමා) | අඟන | අඟනෝ |
| කම් (කර්ම) | අඟන | අඟනන් |
| කතු (කර්තෘ) | අඟන විසින් | අඟනන් විසින් |
| කරණ (කරණ) | අඟන කරණකොට | අඟනන් කරණකොට |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | |
|---|---|---|
| සපදන් (සම්ප්‍රදාන) | අඟනට | අඟනන්ට |
| අවදි (අවධි) | අඟනගෙන් | අඟනන්ගෙන් |
| සබඳ (සම්බන්ධ) | අඟනගේ | අඟනන්ගේ |
| අදර (අධාර) | අඟන කෙරෙහි | අඟනන් කෙරෙහි |
| අලප් (ආලපන) | අඟන | අඟනනි |

ස්ත්‍රී ලිංග ස්වරාන්ත නාමවල ද අගින් යෙදෙන ස්වරයට අනුව වරනැගීමේ දී ඇතැම් විභක්ති රූපවල වෙනස්කම් පවතින බව පහත දැක්වෙන නිදසුන්වලින් වටහා ගත හැකි ය.

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර (ප්‍රථමා) | කාන්තාව | කාන්තාවෝ |
| පෙර (ප්‍රථමා) | ස්ත්‍රිය | ස්ත්‍රීහු |

### 3. නපුංසක ලිංග ස්වරාන්ත නාම - අකාරාන්ත රට ශබ්දය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර (ප්‍රථමා) | රට | රටවල් |
| කම් (කර්ම) | රට | රටවල් |
| කතු (කර්තෘ) | රට | රටවල් |
| කරණ (කරණ) | රටින් | රටවලින් |
| සපදන් (සම්ප්‍රදාන) | රටට | රටවලට |
| අවදි (අවධි) | රටින් | රටවලින් |
| සබඳ (සම්බන්ධ) | රටේ | රටවල |
| අදර (අධාර) | රටෙහි | රටවල |
| අලප් (ආලපන) | - | - |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

නපුංසක ලිංග නාම වරනැගීමේ දී ප්‍රධාන වශයෙන් දැකිය හැකි ලක්ෂණ කීපයක් පහත දක්වේ.

* පෙර, කම්, කතු විභක්ති රූපවල සමාන බවක් තිබීම.
* ඇතැම් ශබ්ද ප්‍රකෘතිවලට ''වල්'' ප්‍රත්‍යය එකතු වී බහුවචන පද සෑදීම.
  උදා :- ගෙවල්, පාරවල්
* සමහර ප්‍රකෘති හා ප්‍රත්‍යය අතරට ව්‍යඤ්ජන අකුරු ආගම වීම.
  උදා :- වෑ ශබ්දය වෑය
  කුරුලෑ ශබ්දය කුරුලෑව

## නාම විභක්ති ප්‍රත්‍යය

නාමයක් විභක්තිවල වරනැගෙන්නේ, නාම මූලයට විභක්ති ප්‍රත්‍ය එක් කිරීමෙනි. විභක්ති නාමයට අදාළ විභක්ති ප්‍රත්‍ය හා ඊට අනුව නාම වරනැගෙන ආකාරය පහත වගුවෙන් ඔබට හඳුනා ගත හැකි ය.

| විභක්ති | අර්ථය | නාමය | ප්‍රත්‍යය | පදය |
|---|---|---|---|---|
| ප්‍රථමා | ලිඞ්ගාර්ථය<br>උක්ත කර්තෘ අර්ථය<br>උක්ත කර්ම අර්ථය | මිනිස් | + ආ<br>+ හු | මිනිසා<br>මිනිසා/මිනිස්සු<br>මිනිසා/මිනිස්සු |
| කර්ම | අනුක්ත කර්ම අර්ථය | මිනිස් | + ආ<br>+ උන් | මිනිසා<br>මිනිසුන් |
| කර්තෘ | අනුක්ත කර්තෘ අර්ථය | මිනිසා | + ආ<br>+ උන් | මිනිසා (විසින්)<br>මිනිසුන් (විසින්) |
| කරණ | කරණාර්ථය | අත් | + ඉන්<br>+ වල් + ඉන් | අතින්<br>අත්වලින් |
| සම්ප්‍රදාන | සම්ප්‍රදානාර්ථය | මිනිස් | + ආ + ට<br>+ උන් + ට | මිනිසාට<br>මිනිසුන්ට |
| අවධි | අවධි අර්ථය | අත් | + ඉන්<br>+ වල් + ඉන් | අතින්<br>අත්වලින් |


නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | | | |
|---|---|---|---|---|
| සම්බන්ධ | සම්බන්ධ අර්ථය | මිනිස් | + ආ + ගේ<br>+ උන් + ගේ | මිනිසාගේ<br>මිනිසුන්ගේ |
| ආධාර | ආධාරාර්ථය | අත් | + එහි<br>+ හි<br>+ වල් + ඇ | අතෙහි<br>අත්හි<br>අත්වලැ |
| ආලපන | ආලපනාර්ථය | මිනිස් | + අ<br>+ උනි | මිනිස<br>මිනිසුනි |

## ක්‍රියාකාරකම 2.1

පහත දී ඇති වගුව තුළ දැක්වෙන නාම පද අතුරින්, අසා ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු තෝරා ලියන්න.

කපුටා/ මල/ දෙවඟන/ පහන
රිලව්/ දීපාලෝක/ කුමරිය/
පොල්/ ආරාමය/ සිවුර/
කම්කරුවන්/ ක්‍රීඩකයා/
විද්‍යාල

1. ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද වෙන් කර දක්වන්න.
2. නපුංසක ලිංග ඒකවචන නාම පද වෙන් කරන්න.
3. ප්‍රාණිවාචී බහුවචන නාම පද ලියන්න.
4. කුමරිය/ ආරාමය/ සිවුර/ මල මේවායේ ශබ්ද ප්‍රකෘතිය ලියන්න.
5. පහන/ කපුටා මේ නාම පදවල නාමය හා ප්‍රකෘතිය වෙන්කර දක්වන්න.

## ක්‍රියාකාරකම 2.2

1. බෝධි, රිලා, පොරෝ යන ශබ්ද වරනැගීමේ දී පෙර, කම්, කතු, යන විභක්තිවල යෙදෙන බහුවචන රූප ලියන්න.

2. පහත දැක්වෙන ප්‍රකෘති ස්වරාන්ත හා හලන්ත භේදය අනුව වර්ග කරන්න. පිහි/ ගල්/ කපුටු/ වැඳිරි/ පා/ පිය/ මල්/ පැන්



නොමිලේ බෙදා හැරීම පිණිසයි

## ක්‍රියාකාරකම 2.3

අහස ලස්සනයි තරුකැට දිලෙන විට
සයුර ලස්සනයි රළපෙළ නැගෙන විට
මුහුණ ලස්සනයි හසරැලි නගන විට
ලොවම ලස්සනයි ළමයින් සිටින විට

1. ඉහත පද්‍යයේ ඇතුළත් නාම පද වෙන් කර දක්වන්න.
2. අහස/ සයුර/ මුහුණ යන පදවලට සමානාර්ථ පදය බැගින් ලියන්න.
3. සයුර, මුහුණ, යන පදවල ශබ්ද ප්‍රකෘතිය ලියන්න.
4. අහස/ ළමයින් යන මේ පදවල විභක්ති නම් කරන්න.

### පුහුණුවට

''අත්ථාභිමුඛං නමතීති නාමං''

අර්ථයට අභිමුඛ ව අර්ථයට අනුකූල ව නැමෙන්නේ ''නාම'' නම් වේ.

### සංකල්පනා

**අතීතය දෙස බලා ළත නොවන්න.**
**වර්තමානය ශ්‍රද්ධානාන්විත ලෙස ප්‍රයෝජනයට ගන්න.**

# 3 සන්ධි

ශබ්ද දෙකක් අතර පරතරයක් ඇති නොවන සේ එනම්, එක ශබ්දයක් වන සේ ගැළපීම සන්ධිය යි. ප්‍රකෘති හා ප්‍රත්‍යය අතරත්, පද දෙකක් අතරත් සන්ධි කාර්යය සිදු වේ. භාෂාවේ පද සන්ධි කෙරෙන ආකාරයත්, සන්ධි ප්‍රභේද හා සන්ධිවලින් ඇති ප්‍රයෝජන පිළිබඳවත් මෙම පාඩමෙන් අවබෝධයක් ලබාගත හැකි වේ.

වෙන් වෙන් ව තිබුණු දුව දඬු කැබලි දෙකක් තම වඩු පට්ටලය මතට ගත් වඩු කාර්මිකයා, මොහොතක් කල්පනාවේ යෙදුණි. ඇසිල්ලකින් ඔහු ක්‍රියාත්මක විය. ඇලිස්කටුව, නියන, මිටිය, යතු කැටය ඇතුළු උවමනා උපකරණ සමීපයට ගෙන ඔහු වැඩ ඇරඹී ය. තමන් සිතූ පරිදි අවශ්‍ය තැන් සලකුණු කර කපා කොටා, දඬු කැබලි දෙක එකට යා කළේ ය. වෙන් ව තිබුණු දඬු කැබලි දෙක වෙනුවට දැන් ඇත්තේ සන්ධි වූ දඬු කැබැල්ලකි.

ඉහත ඡේදයේ දැක්වෙන්නේ අප දැක ඇති, හුරු-පුරුදු සිද්ධියකි. විහාරස්ථානයේ, පිරිවෙනේ, ගෙදර-දොරේ පාවිච්චි කෙරෙන දුව භාණ්ඩවල, වහළයේ පරාල හා රීප්පවල සන්ධි කළ අවස්ථා ඔබ දැක ඇත. ඇතැම් සන්ධි මනා ලෙස ගැළපුණු අවස්ථා මෙන් ම නොගැළපෙන අවස්ථා ද ඒ අතර තිබේ.

භාෂාව භාවිතයේ දී, විශේෂයෙන් ලේඛනයේ දී, සන්ධි වූ පද අපට හමු වේ.

''පෙර' පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්''

ඒ, සන්ධි අධිකාරියේ දී, සිදත් සඟරාව සන්ධි හඳුන්වා ඇති ආකාරය යි. ඒ අනුව ''වෙන් වෙන් ව ඇති අක්ෂර (ශබ්ද) දෙකක් පරතරයක් ඇති නොවන පරිදි සුදුසු ලෙස ගැළපීම සන්ධි නම්'' වේ.

දැන් අපි වඩු කාර්මිකයාගේ ක්‍රියා පිළිවෙළ භාෂාවේ සන්ධි කාර්යය සමග ගළපා බලමු.

| වඩු කාර්මිකයා | පද සන්ධි කරන්නා |
|---|---|
| * සුදුසු දැව දඬු තෝරා ගැනීම.<br>* කියත, නියන වැනි උපකරණ සමීපයට ගැනීම.<br>* උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය.<br>* යෝග්‍ය පරිදි සැකසීම (එකට ගැළපීම). | * යෝග්‍ය පද තෝරා ගැනීම.<br>* ලෝප, ආදේශ, ආගම වැනි සංකල්ප සමීප කර ගැනීම.<br>* භාවිත කළයුතු සන්ධි ප්‍රයෝගය පිළිබඳ අවබෝධය.<br>* සුදුසු පරිදි සන්ධි කිරීම. |

සන්ධිවලින් භාෂාවට ලැබෙන ප්‍රයෝජන,

1. භාෂාව සරල වීම.
2. භාෂාව රසවත් වීම.
3. උච්චාරණයට පහසු වීම.
4. ලිවීමට පහසු වීම.

පද සන්ධි කිරීමට පෙර, සන්ධි කාර්යයේ දී යොදා ගනු ලබන සන්ධි විධි හඳුනා ගනිමු.

- ලෝපය
- ආගමය
- වෘද්ධිය
- ආදේශය
- ද්විත්ව රූප ගැන්වීම
- පෙර රූ ගැන්වීම
- පර රූ ගැන්වීම

* ලෝපය නම් අකුරු නොකියා හැරීම යි.

දහවල, පොහොය, මැති උතුමා වැනි පද භාවිතයේ දී දාවල, පෝය, මැතිතුමා යනුවෙන් භාවිත වේ. මෙහි දී ඇතැම් අකුරු නොකියා හැරේ. ඒ ලෝපය යි.

* ආදේශය යනු පැවති අකුරක් වෙනුවට වෙනත් අකුරක පැමිණීම යි.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

සර්වෝදය, බුත්සරණ වැනි පදවල විසන්ධි පද වන්නේ සර්ව + උදය, බුදු + සරණ යන්න යි. පිළිවෙළින් ඕ, ත් අකුරු ආදේශ වී තිබේ.

* පවතින අකුරක් ඇසුරු කරගෙන අමුතුවෙන් අකුරක පැමිණීම ආගම වීම යි.

  තුන් + රුවන්, දෙ + උර යන විසන්ධි පද තුනුරුවන්, දෙවුර යනුවෙන් සන්ධි වේ. මෙහි විසන්ධි පද අතරට පිළිවෙළින් උ හා ව් ආගම වී තිබේ.

* ද්විත්වය නම් එක් අකුරක් දෙකක් බවට පත්වීම යි.

  පොල් + අත්ත යන විසන්ධිය පොල්ලත්ත ලෙස සන්ධි වී තිබේ. වල් + අම්බලම යන විසන්ධිය වල්ලම්බලම යැයි සන්ධි වෙයි. මෙහි දී එක් අකුරක් (ල) දෙකක් බවට පැමිණ ඇති බව පෙනෙයි.

* හ්‍රස්ව ස්වරයක් දීර්ඝ වීම මාත්‍රා දීර්ඝය යි.

  සු + අසු, එක් + අසු යන විසන්ධි පද සුවාසු, එකාසු ලෙස සන්ධි වෙයි. මේ දෙපදයේ ම ''අ'' ස්වරය ''ආ'' වීමෙන් (මාත්‍රාවක් වෘද්ධි වීමෙන්) සන්ධි පදය සෑදී තිබේ.

* පෙර රූ ගැන්වීම යනු සන්ධි වන දෙපදයේ මුල් පදයේ අග අකුර පසු පදයේ මුල් අකුර ගැන්වීම යි.

  අත් + කම්, සිත් + කම් යන විසන්ධි පදවල පළමු පදයේ අග ''ත්'' යන්න පසු පදයේ මුල් අකුර වන ''ක්'' යන්නට පැමිණීමෙන් අත්තම්, සිත්තම් යනුවෙන් සන්ධි වී තිබේ.

* සන්ධි වන දෙපදයේ පසු පදයේ මුල් අකුර පළමු පදයේ අග අකුරට ගැන්වීම පර රූ ගැන්වීම යි.

  මේ නිදසුන් පරීක්ෂා කරන්න. වප් + කඩ, යන්න වක්කඩ ලෙස සන්ධි වේ. ලිප් + ගල සන්ධි වූ විට ලිග්ගල වේ.


මේ විසන්ධි පදවල පසු පදයේ මුල් අකුර පෙර පදයේ අග අකුරට ගැන්වී ඇත.

1. සිදත් සඟරාවේ සන්ධි හඳුන්වා ඇත්තේ කෙසේ ද?
2. භාෂාවේ ''සන්ධි'' යන්න ඔබේ වචනයෙන් හඳුන්වන්න.
3. ලෝපය, ආදේශය යන මේවා නිදසුන් මගින් පැහැදිලි කරන්න.
4. පහත සඳහන් විසන්ධි පදවල සන්ධි පද ලියන්න.

    දුක් + පත්, පුන + උත්, පිළි + කම්, රජ + උතුමා

## ස්වර සන්ධි හා ව්‍යඤ්ජන සන්ධි

සන්ධි කාර්ය සිදුවන්නේ භාෂාවේ එකම පදයෙහි හෝ දෙපදයක හෝ අතර යි. අකුරු, ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් දෙකොටසක් ඇති බව ඔබ දන්නෙහි ය. ඒ අනුව ස්වර හා ව්‍යඤ්ජන අකුරු ඇසුරු කරගෙන සිදුවෙන සන්ධි කොටස් දෙකක් ලෙස දක්වේ. එනම්,




පළමුවෙන් ස්වර සන්ධි හඳුනා ගනිමු. සන්ධි සිදුවෙන ආකාරය අනුව එහි ප්‍රභේද හතරකි. එනම්,

1. ස්වර සන්ධිය.
2. පූර්ව ස්වර ලෝප සන්ධිය.
3. පර ස්වර ලෝප සන්ධිය.
4. ස්වරාදේශ සන්ධිය.

යනුවෙනි.

දැන් අපි ස්වර අකුරු සම්බන්ධ වී සන්ධි පද සෑදෙන ආකාරය ලබමු.

## 1. ස්වර සන්ධිය

උපාසිකාවෝ විහාරයෙහි <u>මලසුන</u> මත මල් තැන්පත් කරති.

මෙහි මලසුන යන පදය සෑදී ඇත්තේ මල් + අසුන යන දෙපදය සන්ධි වීමෙනි.

| | | |
|---|---|---|
| මල් + අසුන | = | විසන්ධිය |
| ම(ල් + අ)සුන | = | පෙර පදයේ අග ව්‍යඤ්ජනය පසු පදයේ මුලින් ඇති ස්වරය සමග ගැළපීම |
| මලසුන | = | සන්ධිය |

**සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ව්‍යඤ්ජනය පසු පදයේ මුල් ස්වරය සමග ගැළපීමෙන් සෑදෙන සන්ධිය ස්වර සන්ධිය යි.**

එකින් + එක / උපන් + උපන් / මියුල් + ඇසි / පස් + ඇස් එලෙස සන්ධි කළ හැකි පද කීපයකි.

## 2. පූර්ව ස්වර ලෝප සන්ධිය

''ගෙවුයන සුවඳැති මලින් පිරී ඇත.''

මෙහි සුවඳැති යන සන්ධිපදය සෑදී ඇති අයුරු බලන්න

| | | |
|---|---|---|
| සුවඳ + ඇති | = | විසන්ධිය |
| සුවඳ් + ~~ඇ~~ + ඇති | = | පෙර පදයේ අග ස්වරය වෙන් කර ගැනීම |
| සුවඳ් + ඇති | = | වෙන් කළ ස්වරය ලොප් කිරීම |
| සුවඳැති | = | ගැළපීම (සන්ධිය) |

පෙර පදයේ අග ස්වරය (පූර්ව ස්වරය) ලොප් කිරීම මෙහි ප්‍රධාන සන්ධි කාර්යය යි.

සන්ධි වන දෙපදයෙන් පළමු පදයේ අග ඇති ස්වරය (පූර්ව ස්වරය) ලොප්කොට, ඉතිරි වන ව්‍යඤ්ජනය පසු පදයේ මුල් ස්වරය සමග ගැළපීමෙන් පූර්ව ස්වර ලෝප සන්ධිය සෑදේ.

දකුණු + අත, යන + එන, සිය + ඇසින්, ඒ අනුව සන්ධි කළ හැකි විසන්ධි පද කිහිපයකි.

## 3. පර ස්වර ලෝප සන්ධිය

සුරඟන සිරි සිලූ
වරඟන කෙළින සඳලූ

මෙහි සුරඟන, වරඟන යන පද සෑදී ඇත්තේ සුර + අඟන, වර + අඟන, යන විසන්ධි පද සන්ධි වීමෙනි.

| | | |
|---|---|---|
| සුර + අඟන | = | විසන්ධිය |
| සුර + අ + ඟන | = | පරස්වරය ලොප් කිරීම |
| සුරඟන | = | ගැළපීම (සන්ධිය) |

සන්ධි කිරීමට යොදා ගන්නා පද දෙකෙන් පර පදයේ මුල් ස්වරය ලොප් කිරීමෙන් ගළපන සන්ධිය පර ස්වර ලෝප සන්ධිය යි.

මුනි + ඉඳු, ගන + අඳුර, දිව + අග වැනි පද ද මෙලෙස සන්ධි කළ හැකි පද වේ.

## 4. ස්වරාදේශ සන්ධිය

''දෑගසව් වහන්සේ ඇඳිලි බැඳ පිළිවදන් දුන්හ.''

මෙහි දෙ + අගසව් යන්න සන්ධි වී දෑගසව් යනුවෙන් සෑදී තිබේ.

| | | |
|---|---|---|
| දෙ + අගසව් | = | විසන්ධිය |
| ද් (එ + අ)ගසව් | = | පූර්ව ස්වරය වෙන් කිරීම |
| ද් + ඇ + ගසව් | = | (එ + අ වෙනුවට) වෙනත් ස්වරයක් (ඇ) ආදේශ වීම |
| දෑගසව් | = | ගැළපීම (සන්ධිය) |

සිංහලයේ ස්වරාදේශය බහුලව සිදුවන අක්ෂර කිහිපයක් පහත දැක්වේ.

අ + ඉ = එ
අ + උ = ඔ / ඕ
එ + අ = ඈ
එ + ඇ = ඈ
ඒ + ඈ = ඈ

දෙ + ඇස, සූර්ය + උදය, දෙ + ඇඟිලි වැනි පද ද මෙලෙස සන්ධි වෙයි.

## ක්‍රියාකාරකම 3.2

1. පහත සඳහන් විසන්ධි පදවල සන්ධි පද ලියන්න

| | | |
|---|---|---|
| 1. සුවඳ + ඇති | = | ........................................ |
| 2. සුර + ඉන්ද්‍ර | = | ........................................ |
| 3. උපන් + උපන් | = | ........................................ |
| 4. නර + ඊශ්වර | = | ........................................ |
| 5. යථා + උක්ත | = | ........................................ |

2. පහත දැක්වෙන සන්ධි පද කවර සන්ධියකට අයත් දැ' යි දක්වන්න.

   1. පිනැති
   2. උදරාබාධ
   3. සියැසින්
   4. නැණැති
   5. ගිලානෝපස්ථාන

3. පෙළ පොතෙන් මෙවැනි සන්ධි පද සොයා ඒවායේ එකතුවක් සකසන්න.

## ව්‍යඤ්ජන සන්ධි

ව්‍යඤ්ජන අකුරු මුල් කරගෙන සන්ධි කාර්යය කෙරෙන බැවින් මේවාට ව්‍යඤ්ජන සන්ධි යන නම යෙදේ. ව්‍යඤ්ජන සන්ධි ප්‍රභේද හයකි.

1. ව්‍යඤ්ජනා දේශ හෙවත් ගාත්‍රාදේශ සන්ධිය
2. ගාත්‍රාක්ෂර හෙවත් ව්‍යඤ්ජන ලෝප සන්ධිය
3. ආගම සන්ධිය
4. පූර්ව රූප සන්ධිය
5. පර රූප සන්ධිය
6. ද්විත්ව රූප සන්ධිය

මෙතැන් සිට ව්‍යඤ්ජන සන්ධි සෑදීමේ හුරුව ලබමු.

### 1. ව්‍යඤ්ජනා දේශ හෙවත් ගාත්‍රාදේශ සන්ධිය

සන්ධි වන පද දෙකෙහි පවතින ව්‍යඤ්ජනයක් වෙනුවට වෙනත් ව්‍යඤ්ජනයක පැමිණීමෙන් ගැළපෙන සන්ධිය මේ නමින් හැඳින්වේ.

නිදසුන :- පිළි + කම් = විසන්ධිය
පිළි + යම් = ක වෙනුවට ය ආදේශ වීම
පිළියම් = ගැළපීම (සන්ධිය)

දඩ + කම්, ගිනි + කම්, බුදු + සරණ, දඬු + කම්, වැනි පද සන්ධි කර බලන්න. එම පද ද ගාත්‍රාදේශ සන්ධි පද වේ.

### 2. ගාත්‍රාක්ෂර හෙවත් ව්‍යඤ්ජන ලෝප සන්ධිය

මෙම සන්ධි කාර්යය සිදු වන්නේ සන්ධි වන පද දෙකේ පළමු පදයේ අග අකුර සඤ්ඤකාක්ෂරයක් නම් පමණි. සඤ්ඤකාක්ෂරයේ ස්වරය හා ව්‍යඤ්ජනය ලොප් කොට, ශේෂ වන අර්ධ අනුනාසිකාය (ං) පූර්ණ නාසිකායකට පත් කිරීමෙන් ගැළපෙන සන්ධිය ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය යි.

නිදසුන :- ළිඳ + මැඩි = විසන්ධිය
ළි + ං + ද් + අ + මැඩි = සංයුක්තාක්ෂරයේ ස්වර, ව්‍යඤ්ජන වෙන් කිරීම


නොමිලේ බෙදා හැරීම පිණිසයි

ළි + ( + ද් + අ + මැඩි = වෙන් කළ ස්වරය හා ව්‍යඤ්ජනය ලොප් කිරීම

ළිං + ද් + මැඩි = අනුනාසිකාය පූර්ණ නාසිකායක් කිරීම

ළිං + මැඩි

ළිංමැඩි

ළිම්මැඩි = සන්ධිය

මඟ + මුලා, ළිඳ + පතුළ, මුගු + පියලි මේවා සන්ධි කර හුරුව ලබන්න.

## 3. ආගම සන්ධිය

සන්ධි වන පද දෙක අතරට අමුතුවෙන් ම ව්‍යඤ්ජන අකුරක් පැමිණීමෙන් ගැළපෙන සන්ධිය ආගම සන්ධිය යි.

නිදසුන :-

| | | |
|---|---|---|
| වී + ඇට | = | විසන්ධිය |
| වී + ය් + ඇට | = | ය කාරාගමය |
| වීයැට | = | ගැළපීම (සන්ධිය) |
| වීයැට | | |

නො + එක්, නි + අවුල්, දෙ + උර, වැනි පද සන්ධිකර හුරුවන්න.

## 4. පූර්ව රූප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ඇති අකුර පූර්ව රූපය යි. එම පූර්ව රූපය පසු පදයේ මුල ඇති රූපයට පැමිණ වීමෙන් ගළපනු ලබන සන්ධිය පූර්ව රූප සන්ධිය යි.

නිදසුන :-

| | | |
|---|---|---|
| කම් + හල | = | විසන්ධිය |
| කම් + මල | = | පූර්ව රූපය පර රූපයට වීම |
| කම්මල | = | සන්ධිය |

මෙලෙස පහත සඳහන් විසන්ධි පද සන්ධි කරන්න.

සිත් + කම්, පන් + කම්, සිත් + කරු, අත් + කම්

## 5. පර රූප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පසු පදයේ මුලින් ඇති අකුර පර රූපය යි. එම පර රූපය පූර්ව රූපයට වීම පර රූප සන්ධිය යි.

| | | | |
|---|---|---|---|
| නිදසුන :- | අත් + සත | = | විසන්ධිය |
| | අස් + සත | = | පර රූපය පූර්ව රූපයට වීම |
| | අස්සත | = | සන්ධිය |

දුක් + පත්/ ලිප් + ගල/ අත් + ගලා/ හක් + ගල / වක් + පිහිය වැනි පද ද මේ ලෙස සන්ධි කළ හැකි ය.

### 6. ද්විත්ව රූප සන්ධිය

ද්විත්ව වීම යනු දෙකක් බවට පැමිණීම යි. පෙර පදයේ අග ව්‍යඤ්ජනය ද්විත්ව වීම මෙහි සන්ධි කාර්‍ය්‍ය යි.

| | | | |
|---|---|---|---|
| නිදසුන :- | පොල් + අත්ත | = | විසන්ධිය |
| | පොල් + ල් + අත්ත | = | ද්විත්ව වීම |
| | පොල්ලත්ත | = | ගැළපීම (සන්ධිය) |
| | පොල්ලත්ත | | |

රැක් + අත්තන / වල් + අම්බලම / වැලි + අම්පිටිය/ ඉනි + අල වැනි පද මෙලෙස සන්ධි කරන්න.

## ක්‍රියාකාරකම 3.3

1. නිදසුන් මගින් පැහැදිලි කරන්න.

   1. ''සන්ධිය'' නම් කිමෙක් ද?
   2. පෙර වර්ණය (පෙර'කුර), පර වර්ණය (පර'කුර) පෙර පදය, පර පදය මේවා පැහැදිලි කරන්න.

2. පහත සඳහන් සන්ධි පදවල විසන්ධි පද ලියන්න.

   1. දෙවුර  2. දිනිඳු  3. කම්මල
   4. දහවල්  5. මලසුන

3. පහත දැක්වෙන විසන්ධි පදවල සන්ධි පද ලියන්න. සන්ධි නාමය ද ලියන්න.

   1. දින + ඉසුරු  2. පස් + ඇස්  3. වට + උර
   4. සුර + ඉඳු  5. විස් + කම්  6. ගඟ + දිය



නොමිලේ බෙදා හැරීම පිණිසයි

4. මෙම විසන්ධි පද සන්ධි කරන්න.

1. පරම + උදය　　2. දෙව් + ඉඳු　　3. බලු + ආ
4. මිහිඳු + තලය　　5. අත් + සන

2. එම සන්ධි පද යොදා අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.

5. පහත පාඨයේ ඇති සන්ධි පද වෙන් කර දක්වන්න.

දිනිඳු සදිසි තෙදැති බලැති
සක්දෙව් රජුනේ
ගුණැති, නැණැති, හෙළ දන වෙත
දෙනෙත් යොමන්නේ

### පුහුණුවට

පෙරපර වණන් නිසි - විදිනි ගළපනු සඳනම්
වණලොප් අදෙස් ඈ එහි - ලැකියනුසරෙන් දන්නේ
-සිදත් සඟරාව-

පූර්ව අපර වර්ණ සුදුසු ආකාරයෙන් ගැළපීම සන්ධි නම් වේ.
ලෝපය, ආදේශය ආදිය, භාවිතය ඇසුරෙන් දැනගන්න.

### සංකල්පනා

**ලෝකයේ සෑම නිර්මාණයක් ම බලාපොරොත්තුව විසින් නිර්මාණය කළ දෑ බව සිතන්න.**

# 4 සමාස

භාෂා ව්‍යවහාරයේ දී අදහස් නිරවුල් ව ඉදිරිපත් කිරීම සඳහා උක්තාඛ්‍යාත යෝගය වැනි වාක්‍ය රීතීන් ගැන සැලකිලිමත් විය යුතු මෙන් ම, ඒ සඳහා භාවිත වන පද ගැන ද සැලකිලිමත් විය යුතු ය. එහි දී අදහසට ගැළපෙන අර්ථවත් පද උපයෝගී කරගත යුතු වන අතර ඒවා චිත්තාකර්ෂණීය වීම අතිශය වැදගත් ය. වාක්‍යයත් ඉන් කියවෙන අදහසත් චිත්තාකර්ෂණීය කර ගැනීම සඳහා සකසා ගන්නා පද විශේෂයක් ලෙස **සමාස** හැඳින්විය හැකි ය.

මතු දැක්වෙන්නේ දඹදෙණිය පතිරාජ පිරිවෙනේ බිත්ති පුවත්පතේ ''**වියරණ හුරුව**'' තීරුවේ ලිපි පළ කිරීම සඳහා, එහි සංස්කාරක පූජ්‍ය තොටගමුවේ උදිත ශිෂ්‍ය හිමියන් විසින් එම පිරිවෙනේ 4 වන වසරේ සිසුන් වෙත ලබා දෙන ලද දැනුම් දීමේ පත්‍රිකාව යි.

# විද්‍යාප්‍රභා බිත්ති පුවත්පතේ ලිපි පළකිරීම

'විද්‍යාප්‍රභා' බිත්ති පුවත්පතේ 'වියරණ හුරුව' තීරුව මෙවර වෙන් වන්නේ 4 වන වසරේ සිසුන් සඳහා ය. **සිංහල සමාස** යන මාතෘකාවෙන් ඉදිරි දින හයක් තුළ පළ කිරීම සඳහා අනුමාතෘකා හයක් යටතේ තොරතුරු සකස් කොට මා වෙත ලබා දෙන්න. ඒවා A4 ප්‍රමාණයේ සුදු කඩදාසිවල සකස් කළ යුතු ය.

සැ. යු. සකස් කරන එම ලිපි පිරිවෙනේ සිංහල විෂය භාර ගුරු හිමියන්ගේ අනුමැතිය ඇතිව මා වෙත ලබා දීමට කටයුතු කරන්න.

මෙයට,
පූජ්‍ය තොටගමුවේ උදිත හිමි.
බිත්ති පුවත්පත් සංස්කාරක.

සමාස අංක 01

# සමාස හඳුනා ගනිමු

'සං + ආස' යන පද එක්වීමෙන් 'සමාස' යන පදය සෑදී ඇත. මනාව එකතු කිරීම යනු එහි අර්ථය යි. මනාව එකතු කරන්නේ පද යි. එසේ එකතු වන පද 'යුක්තාර්ථවත්' පද විය යුතු ය. යුක්තාර්ථවත් පද යනු අර්ථයෙන් එකිනෙකට සම්බන්ධතාවක් ඇති පද යි. ඉන් තහවුරුවන්නේ ඕනෑ ම පද කීපයක් එකතු කිරීම සමාස නොවන බව යි.

**පොලෙහි තෙල් = පොල්තෙල්**

යනුවෙන් සමාස කළ විට එහි අර්ථයට ගැළපෙන පද එක් වී ඇති බව පෙනේ. එහෙත්,

**පොලෙහි ඇති සුද = පොල්සුද**

යනුවෙන් සමාස කිරීමට උත්සාහ ගත්ත ද එහි සමාස වීමක් සිදු නොවන්නේ අර්ථයෙන් සම්බන්ධතාවක් නොමැති නිසා ය.

**විවිධ අර්ථ ඇති විවිධ ශබ්ද ඇති පද සමූහයක් එක ශබ්දයක් වන සේ ගැළපීම සමාස නම් වන බව....**

සිදත් සඟරාවේ සඳහන්,

'නේ සදත් සියොවැ එක සද අයුරක් වන සේ ගළපනු සමස් නම්'

යන විග්‍රහයෙන් පෙන්වා දී ඇත. මෙය එක්තරා අයුරකින් පද හකුළුවාලීමක්, කෙටි කිරීමක් ලෙස ද හැඳින්විය හැකි ය.

**සමාස වන විට සිදුවන ලක්ෂණ**

* අර්ථයෙන් සම්බන්ධ වචන ගැළපීම.
* මුල්පද විවිධ විභක්ති ගත්තත් සමාස වූ විට එකම විභක්තියක් ගැනීම.
* එක්වන පද කෙටි වීම.
* පද කෙටි වන විට උච්චාරණය හා ලේඛනය පහසු වීම.

**සමාස ප්‍රභේද**

* අව්‍යය සමාසය (අවිය)
* විභක්ති සමාසය (විබත්)
* විශේෂණ සමාසය (වෙසෙසුන්)
* අන්‍යාර්ථ සමාසය (අන් අරුත්)
* ද්කාරාර්ථ සමාසය (ද අරුත්)

සැකසීම :- පූජ්‍ය අපරැක්කේ ධම්මරතන හිමි.
4 වසර.

මෙය අනුමත කරමි.

..........................................

සිංහල විෂය භාර ගුරු හිමි.

## මතකයට

★ කියොලත එක අරුත - සබඳවැ සදන් නනරුත්
එවියු සමස් විදිනම් - එහි බේ දුන් පවස්මෝ

-සිදත් සඟරාව-

(නොයෙක් නොයෙක් අර්ථ ඇති ශබ්ද සම්බන්ධ වී එක් අර්ථයක් ප්‍රකාශ කරන කල්හි එය සමාස විධි නම් වේ. එහි ප්‍රභේද දුන් පවසමු.)

★ සමාසෝති භින්නත්ථානං පදානං එකත්ථතා

-රූප සිද්ධිය-

(සමාස යනු වෙනස් වූ අර්ථ ඇති පදයන්ගේ ඒකාර්ථවත් බව යි.)

★ සමාසො පද සංඛෙපො

-රූප සිද්ධිය-

(සමාස යනු පද හකුළුවා ලීම යි.)

★ නාම්නාම් සමාසො යුක්තාර්ථඃ

-සාරස්වත-

(යුක්තාර්ථවත් පදයන්ගේ එක් කිරීම සමාස නම් වේ.)

සමාස අංක 02

## සමාස ප්‍රභේද

### 1. අව්‍යය සමාසය

අව්‍යය පද සේ හඳුන්වන උපසර්ග හෝ නිපාත පදයක් පූර්වයෙන් යෙදී පරපදයක් හා එක්ව ගැළපී සැකසෙන සමාසය අව්‍යය සමාසය නම් වේ.

න + කුසල් = අකුසල් (නිපාත)

අති + ජාත = අතිජාත (උපසර්ග)

> **පෙරකඩ උසුරුවන - යව්කුපන ඈ අවියන්**
> **පරපද සබඳ ලද හොත් - අවිය සමසැ'යි එවියූ**

යන සිදත් සඟරා පාඨයට අනුව සමාස වන පදවල පූර්ව පදය ලෙස ගැළපෙන යව්, කු, ප, න වශයෙන් අව්‍යය පද වර්ග හතරක් ඇත.

1. **යව් ආදී වර්ගය (ගණය).**
   යව් + දිව් = යව්දිව් (යාවජීව) - දිවි ඇති තෙක්.
   අනු + රූ = අනුරූ - රූවට අනුව.

2. **කු ආදී වර්ගය (ගණය).**
   කු+ පුරිස් = කුපුරිස් (කාපුරුෂයා) - නින්දිත පුරුෂයා.
   දු + දන = දුදන - අයහපත් ජනයා.

3. **ප ආදී වර්ගය (ගණය).**
   ප + බල = පබල - ඉතා බලවත්.
   උප + වන = උපවන - සමීප වනය.

4. **න + ආදී වර්ගය (ගණය).**
   න + ගුණ = අගුණ (ගුණ නොවන්නේ).
   න + අදර = අනදර (ආදරයක් නැත්තේ).

සැකසීම :- පූජ්‍ය බලපිටියේ සාසනජෝති හිමි.
4 වසර.

මෙය අනුමත කරමි.

[signature]

..................................................
සිංහල විෂය භාර ගුරු හිමි.

සමාස අංක 03

## සමාස ප්‍රභේද

### 2. විභක්ති සමාසය

විභක්ත්‍යන්ත පදයක් පූර්ව පදය වී පර පදයක් හා ගැළපී සමාස වන්නේ විභක්ති සමාසය යි.

> **පෙර පසු විබත් හැර - සෙසු සත් විබත් අත් පද**
> **පර පද හා සමස් වත - එවිබත් සමස් නම් වේ.**

යන සිදත් සඟරා පාඨයට අනුව ප්‍රථමා හා ආලපන (පෙර,පසු) යන විභක්ත්‍යන්ත පද හැර සෙසු විභක්ති හත හා ගැළපී මේ සමාස පද සකස් වේ.

පහත දැක්වෙන්නේ ඒ විභක්ති හතේ ගැළපී සමාස පද සකස්වන ආකාරය යි.

1. කර්ම විභක්ති සමාසය
   * මෙහෙ කරනුයේ = මෙහෙකරු
   * ලිපි කරනුයේ = ලිපිකරු

2. කර්තෘ විභක්ති සමාසය
   * සඟුන් විසින් කියන පිරිත් = සඟපිරිත්
   * ගිහියන් විසින් කියන පිරිත් = ගිහිපිරිත්

3. කරණ විභක්ති සමාසය
   * අතින් කරන කම් = අත්කම්
   * කිරෙන් පිසූ බත් = කිරිබත්

4. සම්ප්‍රදාන විභක්ති සමාසය
   * බුදුන් පිණිස පවත්වන පූජා = බුද්ධපූජා
   * ශිෂ්‍යයන්ට දෙන ආධාර = ශිෂ්‍යාධාර

5. අවධි විභක්ති සමාසය
   * සතුරන්ගෙන් වන බිය = සතුරුබිය
   * ග්‍රහයන්ගෙන් වන දෙස් = ග්‍රහදෙස්

6. සම්බන්ධ විභක්ති සමාසය
   * මුවාගේ හම = මුවහම
   * හෙළයන්ගේ බස = හෙළබස

7. ආධාර විභක්ති සමාසය
   * වනයේ ඇති මල් = වනමල්
   * දියෙහි සෙවෙල් = දියසෙවෙල්

සැකසීම :- පූජ්‍ය දීගල විජිතදේව හිමි.
4 වසර.

මෙය අනුමත කරමි.

.....................................................
සිංහල විෂය භාර ගුරු හිමි.

# සමාස ප්‍රභේද

## 3. විශේෂණ සමාසය

යම් විශේෂත්වයක් පවසන්නේ විශේෂණය යි. එයින් විශේෂණය කරන්නේ (විස්තර කරන්නේ) විශේෂ්‍යය යි. විශේෂණ පදයක් හා විශේෂ්‍ය පදයක් ගැළපී සමාස වන්නේ විශේෂණ සමාසය යි.

> "විදැවතින් තොර - සිය දෑ වතට සමවත
> වෙසෙසා සද සබඳවත - වෙසෙසුන් සමස් එවියූ"

යන සිදත් සඟරා පාඨයට අනුව විශේෂණයෙන් හා විශේෂ්‍යයෙන් වෙන් වූ වස්තු දෙකක් කියවෙන අතර, ඒ දෙපදය සමාස වූ විට වෙනත් විශේෂ වස්තුවක් කියැවෙන්නේ නම් එය විශේෂණ සමාසය යනුවෙන් හැඳින්විය හැකි ය.

"වැලිතලප"

යන්නෙහි වැලි යනු විශේෂණය යි. තලප යනු විශේෂ්‍යය යි. මෙයින් වස්තු දෙකක් කියවෙයි. එහෙත්, එය සමාස වීමේ දී "වැලිතලප" නම් විශේෂ රසකැවිල්ලක් පිළිබඳ අදහස පළ වෙයි.

නිදසුන් :-

- ★ නිල් + උපුල් = නිලුපුල්
- ★ වතු + සුද්ද = වතුසුද්ද
- ★ මී + අඹ = මීඅඹ
- ★ පුංචි + අම්මා = පුංචිඅම්මා

සංඛ්‍යාවක් විශේෂණය ලෙස යෙදීමෙන් ද විශේෂණ සමාස පද සැකසේ.

නිදසුන් :-

- ★ පන් + සිල් = පන්සිල්
- ★ අට + පිරිකර = අටපිරිකර
- ★ නව + දෙර = නවදෙර

සැකසීම :- පූජ්‍ය ජයන්තිපුර නන්දරතන හිමි.
4 වසර.

මෙය අනුමත කරමි.

..........................................

සිංහල විෂය භාර ගුරු හිමි.

සමාස අංක 05

## සමාස ප්‍රභේද

### 4. අන්‍යාර්ථ සමාසය

වෙන් වෙන් වූ අර්ථ ඇති පද දෙකක් හෝ කීපයක් සමාස වී, එසේ එක් වූ පදවල ඇති අර්ථයට වෙනස් වූ අර්ථයක් ප්‍රකාශ වේ නම් ඒ අන්‍යාර්ථ සමාසය යි.

| | |
|---|---|
| කියොලත අන් | අරුත් |
| පදනත් අනේ වැ | සියෝ |
| එසමස් අන් අරුත් | නම් |
| එහි බේ සත් විබැතැ | වේ |

යන සිදත් සඟරා පාඨයෙන් කියැවෙන්නේ එය යි.

දින + කර = දිනකර

මෙහි දින යනු දවස යන අර්ථය යි. ''කර'' යනු ''කරන'' යන අර්ථය යි. මේ වෙන් වෙන් අර්ථ ඇති දින සහ කර යන පද දෙක එකතු වී දිනකර යනුවෙන් සමාස වේ. එහෙත්, එම සමාස පදයෙන් මතුවෙන අර්ථය ඒ පද දෙකෙන් ලැබෙන අර්ථයට වෙනස් ය. එනම් සූර්යයා ය.

නිදසුන් :-

- ★ දමනය වූ ඉඳුරන් ඇති = (දැමිඳුරු) බුදුරජ
- ★ ඇස් තුනක් ඇත්තේ = ති + නෙත් (තිනෙත්) ඊශ්වර
- ★ හිරු නැගෙන දිසාව = (නැගෙනහිර) පෙරදිග
- ★ තරු අතර පති = තාර + පති (තාරපති) සඳ

සැකසීම :- පූජ්‍ය විජයපුර ගුණසාර හිමි.
4 වසර.

මෙය අනුමත කරමි.

.................................................

සිංහල විෂය භාර ගුරු හිමි.

# සමාස ප්‍රභේද

## 5. දකාරාර්ථ සමාසය

එක් කිරීමෙහි අර්ථයෙහි (සමුච්චයාර්ථයෙහි) යෙදෙන "ද" නිපාතයෙන්, එක්වුණු පද දෙකක් හෝ වැඩි ගණනක් ද නිපාතය ඉවත් කිරීමෙන් ගළපා සමාස කරනුයේ දකාරාර්ථ සමාසය යි.

නිදසුන් :-

★ මුතු ද මැණික් ද = මුතුමැණික්
★ බඹ ද සුර ද නර ද = බඹසුරනර

> අඟ පාමොක් වත - සමුදා මැ හෝ එපදන්
> ද අරුතැ වූ පද සමාම් - ද අරුත් සමස් නම් වේ.

යන සිදත් සඟරා පාඨයට අනුව දකාරාර්ථ සමාසය කොටස් දෙකකි.

1. අවයව ප්‍රධාන දකාරාර්ථ සමාසය (අඟපාමොක්)
   මෙහි ලක්ෂණය නම් එක් එක් අවයව වෙන වෙන ම ප්‍රධානත්වය ගැනීම යි.
   නිදසුන් :- මව් ද පිය ද = මව්පිය

2. සමූහය ප්‍රධාන දකාරාර්ථ සමාසය (සමුදාමැ)
   මෙහි ලක්ෂණය නම් පද සමූහය ම ප්‍රධානත්වය ගැනීම යි.
   නිදසුන් :- අත් ද පා ද = අත්පා
   පොත් ද පත් ද = පොත්පත්

සැකසීම :- පූජ්‍ය බටගල්ලේ වජිර හිමි.
4 වසර.

මෙය අනුමත කරමි.

..........................................
සිංහල විෂය භාර ගුරු හිමි.

## ක්‍රියාකාරකම 4.1

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සමාස යන්නෙහි අර්ථය ලියන්න.
2. යුක්තාර්ථවත් පද යනු මොනවා ද?
3. සමාස යන්න සිදත් සඟරාවේ දී කෙටියෙන් හඳුන්වා ඇත්තේ කෙසේ ද?
4. සමාස වන විට සිදුවන ලක්ෂණ 3ක් නම් කරන්න.
5. සමාස ප්‍රභේද නම් කරන්න.

## ක්‍රියාකාරකම 4.2

පහත සඳහන් වාක්‍යවල ඇති සමාස පද තෝරා කිනම් ප්‍රභේදයකට අයත් දැ' යි ලියා දක්වන්න.

1. සැඳෑ සමයේ බටහිර දිග අහස පැහැයෙන් බබළයි.
2. අතීත රාජ්‍යයන් සතු ව ඇත්අස්රියපාබල යන සිවුරඟ සේනා සංවිධානය වී තිබිණි.
3. සුරන් සහ සහසැස් නොකර සිටියේ අහස් කුස් හිස්.
4. ඇයට ඇත්තේ ගල්හිතක් යැ' යි ඔහු නිතර මැසිවිලි නගයි.
5. දුදනන් ගිනිපුපුරුවලට සමාන කර දක්වා ඇත.
6. ගහකොළ නොවවන රට ආගාධයට පත් වෙති' යි ඔවුහු පැවසූ හ.
7. සාංඝික දනයක දී අටපිරිකරක් පූජා කරන්නට බොදුනුවෝ අමතක නොකරති.
8. සත්සමුදුර තරණය කර ආවා, සත්කුළු පව් අතරින් දිව ආවා.....
9. පවුලේ දේපළ පිළිබඳ ව බාප්පා නිහඬ ව සිටියත් පුංචිඅම්මා නිතර දෙවේලේ තම අයිතිය ගැන කතා කළා ය.
10. අප මිතුදම සදාකල් රැඳේවා!

## ක්‍රියාකාරකම 4.3

පහත සඳහන් සමාස පද යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න.

1. කහකුරුල්ලා
2. විදේශාධාර

3. සහසකර
4. ඇස්වහ
5. ගම්නියම්ගම්
6. වතුසුද්ද
7. සැත්කම්
8. සහසකර
9. අෂ්ටපාන
10. අකල්
11. නවදොර

සංකල්පනා

**ඔබ ඉහළට යන්නට සිතන්නේ නම් පහළින් ගමන් ආරම්භ කිරීමට අමතක නොකරන්න.**

# 5 ප්‍රත්‍යයාර්ථ නාම

ප්‍රති + අය යන විග්‍රහයට අනුව පදයක අග සිට එම පදයේ අර්ථයට බලපෑම් කිරීම ප්‍රත්‍යයවල ලක්ෂණය යි. එවැනි විශේෂ ප්‍රත්‍යය සමූහයක් ඇසුරෙන් සකසා ගනු ලබන නාම, ප්‍රත්‍යයාර්ථ නාම යනුවෙන් හැඳින්වේ. ඒ විශේෂ ප්‍රත්‍යය නිසා එම නාමවලට විශේෂ අර්ථයක් ලැබීම ප්‍රත්‍යයාර්ථ නාමවල ලක්ෂණය යි. ප්‍රත්‍යයාර්ථ නාම තද්ධිත හා කෘදන්ත වශයෙන් කොටස් දෙකකි.

## තද්ධිත

**ගැමියා හා තොටියා අතර ඇතිවූ හබය නැවියා මැදිහත්වීමෙන් සන්සිඳිණි.**

මේ වැකියේ කළු අකුරින් යෙදී ඇති ගැමියා, තොටියා, නැවියා, යන පද විමසමු. මේ සියල්ල ම නාම පද බව පැහැදිලි ය. ගම, තොට, නැව පදත් ගැමියා, තොටියා, නැවියා යන පදත් අතර ඇත්තේ, කවර සබඳතාවක් ද' යි විමසමු. ඒ අනුව ගැමියා, තොටියා, නැවියා යන පද උපදින්නේ මෙසේ ය.

| |
|---|
| ගම් + ඉ = ගැමි |

ගම් යන නාමයට ඉ ප්‍රත්‍යය එක් වීමෙන් ගැමි යන්න සැකසී ඇත. ගමෙහි වූ තැනැත්තා, ගමෙහි වසන්නා, ගමෙහි වූයේ යන අදහස් ගැමි යන්නෙන් ලැබේ. මෙසේ 'ඉ' ප්‍රත්‍යය නිසා ගම් යන නාමයට විශේෂ අර්ථයක් එක් වූ බව පෙනේ.

| |
|---|
| තොට + ඉ = තොටි |

තොටෙහි නියුතු තැනැත්තා හෙවත් තොටෙහි නියුතු වූයේ තොටියා ය. නැවි යන්න ද මේ අයුරින් සැකසී ඇත. මෙසේ සකසා ගන්නා තද්ධිත නාමවලට නැවත විභක්ති ප්‍රත්‍යය එක් කිරීමෙන් සියලු විභක්තිවල වර නැගිය හැකි ය.

| | | | | |
|---|---|---|---|---|
| තොට + ඉ + ආ | = | තොටියා |
| තොට + ඉ + ඕ | = | තොටියෝ |

ආදී වශයෙනි. මේ ආකාරයට නාම මූලයකට විශේෂිත වූ තද්ධිත ප්‍රත්‍යය එක් කිරීමෙන් තද්ධිත නාම සකසා ගත හැකි බව පැහැදිලි ය.

## විවිධ අරුත් දෙන තද්ධිත ප්‍රත්‍යයෝ

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉ | මුවා | තර | තම | වත් | මත් | ඉති | අටි | අටු | අස් |
| අත් | බ | තා | අ | උ | අළ | ආණ | අණු | අණි | |

නාම මූලයකට විවිධ අරුත් සහිත තද්ධිත ප්‍රත්‍යයන් එක් වී සෑදෙන අයුරු බලන්න.

| නාම මූලය | තද්ධිත ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| ගම් | ඉ | ගැමි | ගමෙහි වසන්නා |
| තොට | ඉ | තොටි | තොටෙහි නියුක්ත වූයේ |
| නකත් | ඉ | නැකති | නැකත් දන්නේ |
| දහම් | ඉ | දැහැමි | දහම්හි හැසිරෙනුයේ |
| සෙල් | මුවා | සෙල්මුවා | සෙලින් කරන ලද්දේ |
| ගුණ | වත් | ගුණවත් | ගුණ ඇත්තේ |
| දිරි | මත් | දිරිමත් | දිරිය ඇත්තේ |
| මිහිරි | තම | මිහිරිතම | අතිශය මිහිරි වූයේ |
| ප්‍රිය | තර | ප්‍රියතර | වඩා ප්‍රිය වූයේ |
| පොඩි | ඉති | පොඩිති | ඉතා පොඩි වූයේ |
| දිග | අටි | දිගටි | දිගට හුරු |
| ඉහ | අටි | ඉහටි | ඉහ පෙදෙස |
| වක | අටු | වකුටු | වක බොහෝ වූයේ |
| වරල් | අස් | වරලස් | වරල ම |
| මුදුන් | අත් | මුදුනත් | මුදුන ම |
| මෙ | බ | මොබ | මෙතැන |
| මුදු | තා | මුදුතා | මෘදු බව |

| | | | |
|---|---|---|---|
| ගම් | අ | ගම | ගමෙහි උපන් |
| නෙත් | උ | නෙතු | නෙත් ම |
| ඉස් | අළ | ඉහළ / ඉසළ | ඉස් පෙදෙස |
| පිය | ආණ | පියාණ | ගරු කටයුතු පියා |
| පුත් | අණු | පුතණු | ගරු කටයුතු පුතා |
| මා | අණි | මෑණි | ගරු කටයුතු මව |

## ක්‍රියාකාරකම 5.1

පහත සඳහන් පාඨවල ඇති තද්ධිත පද තෝරා ලියන්න.

* ''සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා
  සැරියුත් මහ මුගලන් පිළිවෙළිනා''

* ''වැඳ මුනිඳු සරණත
  මුදුන් මලසුන් මුදුනත''

* ''පියාණෙනී මා නැවත උපන්නොත්
  අපාර වූ මේ සංසාරේ ඔබේ ම පුතු වේවා''

* ''අනෝතප්ත විල නෙළුම නෙළාලා
  පීරා වරලස හිස ගවසාලා''

* ''මනමත් කරවන දන මුළු දෙරණා
  රසවත් වන වෙණ නද නද කරනා''

* ''අරිටු ලිය තුගුණය නිසා
  වකුටු මිණ ලක් මෙන් කුසා''

* ''අඩවන් වූ දෙනෙතින් ගලනා
  මෙත් මුදිතා කරුණා දහරා''

## ක්‍රියාකාරකම 5.2

පහත සඳහන් අර්ථ ප්‍රකට කරන තද්ධිත නාම ලියන්න.

1. දැවයෙන් කරන ලද =
2. කර ප්‍රදේශය =
3. කැඳ ටික =
4. පින් ඇත්තේ =
5. නගරයෙහි වසන්නේ =
6. සුව බව =
7. ගරු කටයුතු පුතා =
8. නෙත් ම =
9. වඩාත් ම රළු වූයේ =
10. ඉසුරු ඇත්තේ =

## මාතෘ භාෂාගත තද්ධිත ප්‍රත්‍යයෝ

ඉහත දැක්වූ, සිංහල භාෂාවට ආවේණික තද්ධිත ප්‍රත්‍යය හා තද්ධිත පදවලට අමතර ව සංස්කෘත භාෂාවට අයත් තද්ධිත ප්‍රත්‍යය හා තද්ධිත පද රාශියක් සිංහල භාෂාවේ යෙදෙන බව දක්නට ඇත. පහත දැක්වෙන්නේ එයින් කිහිපයකි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඊය ප්‍රත්‍යය | - | විදේශ | + | ඊය | = | විදේශීය |
| ඉෂ්ඨ ප්‍රත්‍යය | - | ධර්ම | + | ඉෂ්ඨ | = | ධර්මිෂ්ඨ |
| ය ප්‍රත්‍යය | - | අධිපති | + | ය | = | ආධිපත්‍යය |
| ඊන ප්‍රත්‍යය | - | කුල | + | ඊන | = | කුලීන |

## ක්‍රියාකාරකම 5.3

පහත සඳහන් තද්ධිත පදවල නාම මූලය හා තද්ධිත ප්‍රත්‍යය වෙන්කර දක්වන්න.

1. මාණ්ඩලික
2. ප්‍රාචීන
3. කෞශල්‍යය
4. විද්‍යාලයීය
5. ඖදාර්යය
6. දක්ෂතා
7. ජානපදික
8. ශිෂ්‍යත්ව
9. පෞද්ගලික
10. ජ්‍යෙෂ්ඨ

## කෘදන්ත

බැලූ බැලූවන්ගේ, ඇසූ ඇසූවන්ගේ, **සිතූ සිතූවන්ගේ**, සිත් බුද්ධාලම්බන ප්‍රීතියෙන් **පොබයන** ශ්‍රී දළදා පෙරහැරේ, **කස පුපුරවන්නෝ** ඉදිරියෙන් ම ගමන් කරති. ඉන් පසු **බෙර වයන්නෝ** ද කොඩි සේසත් **ගත්තෝ** ද ගමන් කරති. **වැයෙන** බෙර තාලයට **නටන නැට්ටුවෝ** පසුව පැමිණෙති. **නැටුම්, ගැයුම්, වැයුම්**වලින් ද විවිධ පෙරහැර **සැරසිලි**වලින් ද සමන්විත මේ මහා පෙරහැර සියල්ලන්ගේ සිත් ඇඳ බැඳ ගනියි.

ඉහත ඡේදයේ තද කළු අකුරින් මුද්‍රණය වී ඇත්තේ නාම පද රාශියකි. එහෙත් ඒ නාම පද සියල්ල ම සාමාන්‍ය ව්‍යවහාරයේ දැකිය හැකි නාම පදවලට වඩා වෙනස් ය. ඒවායෙහි පවතින විශේෂත්වය නම් ඒ හැම නාම පදයක් ම සැකසී ඇත්තේ නාම මූලයකින් නොව ක්‍රියා මූලයකින් වීම යි. ක්‍රියා මූලයකට ප්‍රත්‍යය එක් වී ඒ නාම පද සැකසී ඇති අයුරු බලන්න.

| ක්‍රියා මූලය | කෘදන්ත ප්‍රත්‍යය | කෘදන්ත නාමය |
|---|---|---|
| බල | උෟ | බැලූ |
| අස | උෟ | ඇසූ |
| සිත | උෟ | සිතූ |
| පොබය | න | පොබයන |
| පුපුර+ව | න | පුපුරවන |
| වය | න | වයන |
| වය+එ | න | වැයෙන |
| නට | න | නටන |
| නට | උ | නැට්ටුවෝ |
| නට | උම් | නැටුම් |
| ගය | උම් | ගැයුම් |
| වය | උම් | වැයුම් |
| සරස | ඉලි | සැරසිලි |

**මේ ආකාරයට ක්‍රියා මූලයකට කෘදන්ත නම් විශේෂ ප්‍රත්‍යයන් එක් වී සැකසෙන නාම කෘදන්ත නාම ලෙස හැඳින්වේ.**

කෘත් + අන්ත යන පද සන්ධි වීමෙන් කෘදන්ත යන්න සෑදී ඇත. කෘත් යනු ක්‍රියා මූලයකට අගින් යෙදෙන ප්‍රත්‍යය විශේෂයකි. එම විශේෂ ප්‍රත්‍යය අන්තයේ යෙදී කෘදන්ත නාම සැකසෙන නිසා එම නාමවලට කෘදන්ත යන නම යෙදී ඇත.

කෘදන්ත නාම ද සෙසු නාම මෙන් විභක්තිවල වරනැගිය හැකි ය.

| ක්‍රියා මූලය | කෘදන්ත ප්‍රත්‍යය | කෘදන්ත පදය | විභක්ති ප්‍රත්‍යය | කෘදන්ත නාම පදය |
|---|---|---|---|---|
| ලිය | න | ලියන | ආ | ලියන්නා |
| ලිය | න | ලියන | ඕ | ලියන්නෝ |
| ලිය | න | ලියන | ආට | ලියන්නාට |
| ලිය | න | ලියන | ආගේ | ලියන්නාගේ |

මේ ආකාරයට සියලු ම විභක්තිවල ඒකවචන බහුවචන වශයෙන් කෘදන්ත නාම වර නැඟීමට පුළුවන.

## කෘදන්ත ප්‍රභේද

ප්‍රත්‍යයවල පවතින විවිධාර්ථවත් බව නිසා කෘදන්ත, ප්‍රභේද හතරකි.

1. කර්තෘ කාරක කෘදන්ත
2. කර්ම කාරක කෘදන්ත
3. භාව කාරක කෘදන්ත
4. කරණ කාරක කෘදන්ත

### 1. කර්තෘ කාරක කෘදන්ත

කර්තෘ හෙවත් ක්‍රියාව කරන්නා හඟවන්නේ කර්තෘ කාරක කෘදන්ත යි. එය වර්තමාන හා අතීත වශයෙන් කොටස් දෙකකි.

* වර්තමාන කාල කර්තෘ කාරක කෘදන්ත

එහි යෙදෙන ප්‍රත්‍යය :- නු, න, නා

| | | | | |
|---|---|---|---|---|
| උදා :- නට | + | නු | = | නටනු |
| ලිය | + | න | = | ලියන |
| කිය | + | නා | = | කියනා |

* අතීත කාල කර්තෘ කාරක කෘදන්ත

එහි යෙදෙන ප්‍රත්‍යය :- ඉ, උ, ඌ, ඈ

| | | | | |
|---|---|---|---|---|
| උදා :- පිහිට | + | ඉ | = | පිහිටි |
| ගත් | + | උ | = | ගතු |
| ලිය | + | ඌ | = | ලියූ |
| ක | + | ඈ | = | කෑ |

## 2. කර්ම කාරක කෘදන්ත

කර්මය හෙවත් කර්තෘගේ ක්‍රියාවට යටත් වන අවස්ථාව හඟවන්නේ කර්මකාරක කෘදන්ත යි. එය ද වර්තමාන හා අතීත වශයෙන් ප්‍රභේද දෙකකි.

* **වර්තමාන කාල කර්ම කාරක කෘදන්ත.**

මෙහි යෙදෙන ප්‍රත්‍යය කර්තෘ කාරක කෘදන්තවල යෙදෙන නු, න, නා ප්‍රත්‍යයන් ම ය. වෙනස නම් ක්‍රියා මූලයටත් ප්‍රත්‍යයටත් අතර ''එ'' යෙදීම හා ස්වර පෙරළිය යි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උදා :- බල | + | එ | + | නු | = | බැලෙනු |
| බල | + | එ | + | න | = | බැලෙන |
| බල | + | එ | + | නා | = | බැලෙනා |

* අතීත කාල කර්ම කාරක කෘදන්ත.

මෙහි යෙදෙන ප්‍රත්‍යය :- උණු, උණ

| | | | | |
|---|---|---|---|---|
| උදා :- කප | + | උණු | = | කැපුණු |
| මර | + | උණ | = | මැරුණ |

### 3. භාව කාරක කෘදන්ත

කර්තෘ හෝ කර්ම අර්ථයක් නොදෙන, භාවය පමණක් හැඟවෙන නාම භාව කාරක කෘදන්ත යි.

මෙහි යෙදෙන ප්‍රත්‍යය :- නු, උම්, ඊම්, ඉලි, මන්

| | | | | |
|---|---|---|---|---|
| උදා :- නට | + | නු | = | නටනු |
| ලිය | + | උම් | = | ලියුම් |
| බල | + | ඊම් | = | බැලීම් |
| මතුර | + | ඉලි | = | මැතිරිලි |
| කිය | + | මන් | = | කියමන් |

### 4. කරණ කාරක කෘදන්ත

කරණාර්ථය ප්‍රකට කරන්නේ කරණ කාරක කෘදන්ත යි.

මෙහි යෙදෙන ප්‍රත්‍යය :- න, නා

| | | | | |
|---|---|---|---|---|
| උදා :- කඩ | + | න | = | කඩන |
| පිස් | + | නා | = | පිස්නා |

## ක්‍රියාකාරකම 5.4

පහත සඳහන් පද්‍ය පන්තියේ තද රතු අකුරින් දක්වා ඇති කෘදන්ත පදවල ක්‍රියා මූලය හා කෘදන්ත ප්‍රත්‍යය වෙන්කර දක්වන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

# කුරක්කන් හේන

මුලදී කැලේ හැටි බැලුවම කුමක් වැනී
පිහිය නුදුටු අපෙ මාමගෙ රැවුල වැනී
හේන කොටා ගිනි තිබ්බම කුමක් වැනී
බඳින දවසෙ එළි කළ මගේ මූණ වැනී

කුරක්කනේ පොඩි පැළපත කුමක් වැනී
විසි වයසේ මගෙ කම්මුලෙ පෙනුම වැනී
පීදීගෙන එන කුරහන් කුමක් වැනී
අලුත් ළමිස්සියකගෙ මල් හිනා වැනී

බණ්ඩි කුරක්කන් පැද්දෙනු කුමක් වැනී
පොඩි නෑනා දුර සිට අත වනනු වැනී
කිරට නැමුණු විට කුරහන් කුමක් වැනී
පෝරුව උඩ මනමාලිගෙ ඔළුව වැනී

පැසී තිබෙන රතු කුරහන් කුමක් වැනී
මඟුල් ළඟදි නෑනා ඉස වනන වැනී
කරල් කපා මලු පුරවනු කුමක් වැනී
අතිරස උයා මඟුලට එක් කරනු වැනී

කැපූ කුරක්කන් ගෙන යනු කුමක් වැනී
මනමාලිය කැන්දා ගෙන යන්න වැනී
වණ්ඩුව බැඳ තැනූ පිට්ටුව කුමක් වැනී
මිරිසවැටිය අව්වට දිලිසෙනා වැනී

ගමරාළගෙ කට එතකොට කුමක් වැනී
වලාකුළෙන් මතුවී එන සඳක් වැනී
ඒක දකපු කම්මැලි කට කුමක් වැනී
කරත්තයට අසුවුණු කජු ලෙල්ල වැනී

-ජී. එච්. පෙරේරා-

## ක්‍රියාකාරකම 5.5

පහත දැක්වෙන කෘදන්ත පදවල අරුත් පැහැදිලි වන සේ යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

1. මැසිවිලි
2. යෙදුම්
3. කියමන්
4. සනසන
5. පිවිසි
6. රැඳුණු
7. වපුළ
8. බබලන
9. සැරසීම්
10. හැඬූ

## ක්‍රියාකාරකම 5.6

කර්තෘ කාරක, කර්ම කාරක, භාව කාරක හා කරණ කාරක කෘදන්ත පද පහ බැගින් ලියන්න.

### පුහුණුවට

**දයින් නමින් හොත - කැරැ අරුතට නිසි පසන්**
**සපයා සදන් පස'රුත් - හිමි නො ලැගැ ලොවැ වහරන්**

ධාතුවෙන් හෝ නාමයෙන් අර්ථයට සුදුසු ප්‍රත්‍යය යොදා ලෝක ව්‍යවහාරයේ සීමාවන් උල්ලංඝනය නොකොට ප්‍රත්‍යයාර්ථ පද සම්පාදනය කරගන්න.

### සංකල්පනා

**අධ්‍යාපනයෙන් යමෙකුට මග පෙන්විය හැකි ය.**
**එහෙත් ඔහු කැඳවාගෙන යෑමට කිසිවෙකුට හැකියාවක් නැත.**

# 6 ආඛ්‍යාත පද

යම් කිරීමක්, වීමක්, විඳීමක් ප්‍රකාශ කරන පද **ක්‍රියා පද** නම් වේ. ඒ ක්‍රියා පද අතරින් ක්‍රියාමූලයට නැතහොත් ධාතුවට ආඛ්‍යාත ප්‍රත්‍යය එක් වී සෑදෙන අවසාන ක්‍රියා ''ආඛ්‍යාත පද'' යනුවෙන් හැඳින්වේ. ආඛ්‍යාත පද සැකසීමට ඉවහල් වන ධාතු, ආඛ්‍යාත ප්‍රත්‍යය පිළිබඳවත්; විධි, ආශීර්වාද, ප්‍රයෝජ්‍ය යන ආඛ්‍යාත (ක්‍රියා) පිළිබඳවත් අධ්‍යයනය කිරීමට මේ පාඩමෙන් ඔබට හැකි වනු ඇත.

## ධාතු (ධාතු ප්‍රකෘති)

යම් නිර්මාණයක් කිරීමට ගනු ලබන අමුද්‍රව්‍ය එම නිර්මාණයේ මූලික ස්වභාවය යි. භාෂාවේ දී ක්‍රියා පදයක් නිර්මාණය වන්නේ ක්‍රියා මූලයකිනි. 'ධාතු' යනුවෙන් හැඳින්වෙන්නේ ක්‍රියා පදයක ඒ මූලික ස්වභාවය යි. 'ධාතු ප්‍රකෘති' යනුවෙන් ද මෙය හැඳින්වේ.

''බල'' යන ධාතු ප්‍රකෘතියට විවිධ ප්‍රත්‍යය එක් වීමෙන් ක්‍රියා පද සැකසෙන ආකාරය පහත දැක්වේ.

| ධාතුව | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ධාතුව | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
|---|---|---|---|---|---|
| බල | + යි | - බලයි | බල | + නු + ඒ | - බලන්නේ |
| බල | +ති | - බලති | බල | + නු + ඊ | - බලන්නී |
| බල | + හි | - බලහි | බල | + නු + ඕ | - බලන්නෝ |
| බල | + හු | - බලහු | බල | + නු + ආ + හු | - බලන්නාහු |
| බල | + මි | - බලමි | බල | + නු + එ + හි | - බලන්නෙහි |
| බල | + මු | - බලමු | බල | + නු + එ + හු | - බලන්නෙහු |
| බල | + ඊ | - බැලී | බල | + නු + එ + මි | - බලන්නෙමි |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| බල | + උෟ | - | බැලූ | බල | + නු + එ + මු | - | බලන්නෙමු |
| බල | + ඊ + හි | - | බැලීහි | බල | + මින් | - | බලමින් |
| බල | + උෟ + හ | - | බැලූහ | බල | + ඊම් | - | බැලීම් |
| බල | + ඊ + මි | - | බැලීමි | බල | + ඉලි | - | බැලිලි |
| බල | + උෟ + මු | - | බැලූමු | බල | + තොත් | - | බලතොත් |
| බල | + නු | - | බලනු | බල | + ආ | - | බලා |
| බල | + ව් | - | බලව් | බල | + උම් | - | බැලුම් |

ක්‍රියා පදයකින් ධාතු (ධාතු ප්‍රකෘති) සොයා ගන්නා අයුරු

**ප්‍රයෝජ්‍ය ක්‍රියා අර්ථයේ යෙදීමෙන්**

උදා :- කරයි - කරවයි - කර + ව + යි

නටයි - නටවයි - නට + ව + යි

''ව'' ප්‍රත්‍යයයෙන් වම්පස කොටස අදාළ ක්‍රියාවේ ධාතුව යි.

**මිශ්‍ර ක්‍රියා අර්ථයේ යෙදීමෙන්**

උදා :- බලමින් - බල + මින්

ගයමින් - ගය + මින්

මින් ප්‍රත්‍යයයෙන් පූර්ව කොටස අදාළ ක්‍රියාවේ ධාතුව යි.

## ක්‍රියාකාරකම 6.1

පහත සඳහන් ක්‍රියා පදවල ධාතුව සොයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| පිසති | - | ........................... | කපන්නෙහි | - | ........................... |
| ලිව්වේ ය | - | ........................... | සරසයි | - | ........................... |
| දුවමින් | - | ........................... | සිතති | - | ........................... |
| නරඹන්නේ ය | - | ........................... | කෑවේ ය | - | ........................... |
| බැලූහ | - | ........................... | ඇරඹුවෙමි | - | ........................... |
| කරහි | - | ........................... | නසව් | - | ........................... |
| පිළිගනිමු | - | ........................... | ගයන්නා හ | - | ........................... |
| හඬමි | - | ........................... | බබලති | - | ........................... |

### ධාතු ප්‍රකෘති ප්‍රභේද

| | | |
|---|---|---|
| 1. | **ක්‍රියාර්ථ ධාතු** | **නාමාර්ථ ධාතු (නාම ධාතුක ක්‍රියා)** |
| | ක්‍රියා අර්ථයක් ප්‍රකට කරන ධාතු ක්‍රියාර්ථ ධාතු ය.<br>උදා:- ගය - ගැයීමෙහි<br>නරඹ - නැරඹීමෙහි | නාමාර්ථයක් ප්‍රකට කරන ධාතු නාමාර්ථ ධාතු ය.<br>උදා:- තෝ රජහි<br>මම ශිෂ්‍යයෙක්මි<br>නාමයක් අගට ප්‍රත්‍ය එක් වී ක්‍රියා පද සෑකසීම මෙහි සිදුව ඇත. |
| 2. | **ස්වරාන්ත ධාතු** | **හලන්ත ධාතු** |
| | ස්වරයකින් අන්ත වන ධාතු ස්වරාන්ත ධාතු ය.<br>උදා:- ලිය (අ)<br>තබ (අ) | හල් අකුරකින් අන්ත වන ධාතු හලන්ත ධාතු ය.<br>උදා:- බස් (ස්)<br>රක් (ක්) |
| 3. | **සකර්මක ධාතු** | **අකර්මක ධාතු** |
| | කර්මයක් අපේක්ෂා කරන ධාතු සකර්මක ධාතු ය.<br>උදා:- වපුර - වැපිරීමේ<br>නරඹ - නැරඹීමේ | කර්මයක් අපේක්ෂා නොකරන ධාතු අකර්මක ධාතු ය.<br>උදා:- නිද - නිදීමේ<br>හඬ - හැඬීමේ |

| 4. | නිෂ්පන්න ධාතු | තත්සම ධාතු | තද්භව ධාතු |
|---|---|---|---|
| | අපේ ම භාෂාවේ උපන් ධාතු නිෂ්පන්න ධාතු ය.<br>උදා:- **නෙළ** - නෙලීමේ<br>**රව** - රැවීමේ | වෙනත් භාෂාවල යෙදෙන ධාතු ඒ අයුරින් ම අපේ භාෂාවේ යෙදේ. ඒවා තත්සම ධාතු යි.<br>උදා:- **මර** - මැරීමේ<br>**කර** - කිරීමේ | වෙනත් භාෂාවලින් බිඳී ආ ධාතු තද්භව ධාතු ය.<br>උදා:- **රක්** - රැකීමේ<br>**ලබ** - ලැබීමේ |

## ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය

ධාතුවකට පසුව යෙදී ආඛ්‍යාත පදයක් නිර්මාණය කරන්නේ ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය යි.

උදා :- නට + යි - නටයි
නට + මි - නටමි

ආඛ්‍යාතයක
* කාල භේදය
* පුරුෂ භේදය
* කාරක භේදය
* වචන භේදය

පැවසෙන්නේ ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය ඇසුරෙනි.

## කාල භේදය

අතීත, වර්තමාන, අනාගත යනුවෙන් කාලභේදය ත්‍රිවිධාකාර ය. සිදු කොට හෝ සිදු වී ඇත්තේ අතීතය යි. කෙරෙමින් හෝ සිදු වෙමින් පවතින්නේ වර්තමානය යි. කිරීම හෝ සිදු වීම ආරම්භ නොවුයේ අනාගතය යි.

උදා :-

| අතීත | | | වර්තමාන | | | අනාගත | | |
|---|---|---|---|---|---|---|---|---|
| ධාතුව | ප්‍රත්‍යය | පදය | ධාතුව | ප්‍රත්‍යය | පදය | ධාතුව | ප්‍රත්‍යය | පදය |
| නට | + ඊ | - නැටී | නට | + යි | - නටයි | නට | + අන්නේ | - නටන්නේ ය |
| නට | + උ | - නැටූ | නට | + ති | - නටති | නට | + අන්නෝ | - නටන්නෝ ය |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

## පුරුෂ භේදය

පුරුෂ භේදය ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ යනුවෙන් තුන් ආකාර යි. ධාතුවේ අගට එක් වුණු **යි**, **ති** යන ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයවලින් ප්‍රථම පුරුෂය ද **හි**, **හු** ප්‍රත්‍යයවලින් මධ්‍යම පුරුෂය ද **මි**, **මු** ප්‍රත්‍යයවලින් උත්තම පුරුෂය ද දැක්වේ.

උදා:-

| ඒක වචන | | | බහු වචන | | |
|---|---|---|---|---|---|
| ධාතුව | ප්‍රත්‍ය | පදය | ධාතුව | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | නට + **යි** | - නටයි | නට | + **ති** | - නටති |
| මධ්‍යම පුරුෂ | නට + **හි** | - නටහි | නට | + **හු** | - නටහු |
| උත්තම පුරුෂ | නට + **මි** | - නටමි | නට | + **මු** | - නටමු |

## කාරක භේදය

කර්තෘ කාරක, කර්ම කාරක, භාව කාරක යනුවෙන් කාරක ද ත්‍රිවිධාකාර වේ. යම් ආඛ්‍යාතයකින් කර්තෘ උක්ත වේ නම් කර්තෘ කාරකය ද කර්මය උක්ත වේ නම් කර්ම කාරකය ද ක්‍රියා මාත්‍රය උක්ත වේ නම් භාව කාරකය ද වේ. ඒ සඳහා යෙදෙන ප්‍රත්‍යය මෙසේ ය.

උදා:-

| කර්තෘ කාරකය | කර්ම කාරකය | භාව කාරකය |
|---|---|---|
| ධාතුව ප්‍රත්‍යය පදය | ධාතුව ප්‍රත්‍යය පදය | ධාතුව ප්‍රත්‍යය පදය |
| බල + ඊ - බැලී | බල + **ඉණි** - බැලිණි | බල + **ඉණ** - බැලිණ |
| කප + **ඌ** - කැපූ | කප + **ඉණි** - කැපිණි | කප + **ඉණ** - කැපිණ |

## වචන භේදය

ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයවල ඒක වචන බහු වචන යනු වචන භේදය යි. සංඛ්‍යා භේදය යනුවෙන් ද මෙය හැඳින්වේ.

උදා:-

| ඒක වචන | | | බහු වචන | | |
|---|---|---|---|---|---|
| ධාතුව | ප්‍රත්‍ය | පදය | ධාතුව | ප්‍රත්‍ය | පදය |
| නට | + යි | - නටයි | නට | + ති | - නටති |
| නට | + ඊ | - නැටී | නට | + උ | - නැටූ |
| නට | + අන්නේ | - නටන්නේ | නට | + අන්නෝ | - නටන්නෝ |

## ක්‍රියාකාරකම 6.2

සුදුසු ධාතු, ප්‍රත්‍යය හා පද යොදා හිස් තැන් පුරවන්න.

| ධාතුව | ප්‍රත්‍යය | පදය |
|---|---|---|
| කර | උ | ............................ |
| ............................ | මි | බලමි |
| ය | ඊ | ............................ |
| මර | ............................ | මරහු |
| තබ | ............................ | තැබිණි |
| ............................ | ඉණ | තැබිණ |
| සනස | ඊ | ............................ |
| කප | ............................ | කපන්නේ |
| ............................ | ............................ | නරඹන්නො |
| සඳ | ............................ | ............................ |

## ආඛ්‍යාත ප්‍රභේද

### විධි ක්‍රියාව

වළඳින අදහසින් මෙන් සුරගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැඟෙන
වෙලළස ගැවසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳ උතුරින් පෙනෙන

-සැලළිහිණි සන්දේශය-



නොමිලේ බෙදා හැරීම පිණිසයි

අහස්ගඟ නමැති කාන්තාව වැළඳගන්නා අදහසින් මෙන් සුළඟින් සෙළවුණු දළ රළ පෙළ අහසට නැගෙන්නා වූ ද, වෙරළාසන්නයේ ගැවසුණු බබළන මුතු, සක්, පබළු ඇත්තා වූ ද, උතුරු දෙසින් පෙනෙන මහ මුහුද එකල්හි බලන්න, යන අර්ථ ඇති ඉහත පද්‍යයේ 'බල' යන පදයෙන් කර ඇත්තේ නියෝගයකි. යමක් කිරීම සඳහා නියෝග කිරීමෙහි, අණ දීමෙහි යොදනු ලබන ක්‍රියාව 'විධි ක්‍රියා' නැතහොත් 'විධාන ආඛ්‍යාතය' ලෙස හැඳින්වේ.

යමක් කිරීම සඳහා විධානය කරන ස්වභාවය අනුව ආකාර කීපයකි. එය අවස්ථාවට අනුව ගෞරවයෙන්, ආදරයෙන්, මධ්‍යස්ථ ව හා අනාදරයෙන් සිදු කළ හැකි ය.

| ගෞරවයෙන් | ආදරයෙන් | මධ්‍යස්ථව | අනාදරයෙන් |
|---|---|---|---|
| දේශනා කරන්න.<br>වළඳනු මැනවි.<br>වඩිනු මැනවි. | යන්න, කියන්න.<br>කියා දෙන්න.<br>පෙන්වන්න. | කියනු.<br>බලනු.<br>බොනු. | කියපන්.<br>වරෙන්.<br>බලපිය. |

## විධි ක්‍රියා සකසා ගන්නා අයුරු

1. ධාතු ප්‍රකෘතිය පමණක් යෙදීම.
   උදා :- නරඹ රඟන ගිරා පෙළ ඉඳුරායා
   මන තොස කර බල එකලා

2. ධාතු ප්‍රකෘතියට පරව ප්‍රත්‍යය යෙදීම.
   උදා :- ගිරව බලව කෙළනා සොඳ රුවන් කෙළි (ව)
   වැද දළදා ගෙට දළදා වඳු මිතුර (උ)

3. ධාතුවට පරව 'නු' කෘදන්ත ප්‍රත්‍යය යෙදීම.
   උදා :- දෙමව්පියන්ට කීකරුව වැඩ කරනු. (නු)
   මානව අයිතිවාසිකම් සැමට ලබා දෙනු. (නු)

4. කෘදන්ත පදයක් සමග වෙනත් යෝග්‍යාර්ථවත් පදයක් යෙදීම.
   උදා :- ස්වාමීනි, දනට වඩිනු මැනවි.
   කල් යල් බලා පිටත්වනු යෙහෙකි.

5. ක්‍රියාවක් සමග උපකාරක පදයක් යොදා ගැනීම.

උදා :- අනන්‍යතා පත්‍රය ළඟ තබා ගන්න.

වල්ලම්බලම දැක යා ගත් සහතොසිනි.

6. නිපාත පදයක් හෝ වෙනත් පදයක් යොදා ගැනීම.

උදා :- මෙහි කසළ දැමීම තහනම්.

කිසිවෙකුට කරදර කරන්න එපා.

## ක්‍රියාකාරකම් 6.3

පහත සඳහන් පාඨවල විධි ක්‍රියා තෝරා ලියන්න.

1. ''තයන ගමන සැලකර සෙද ගත් වසර''
2. ''අසව ඉතා සතොසින් ම කියන මෙබස''
3. ''මරුකතරක් මැදට ගිහින් අඬන්නෙපා දිය ඉල්ලා''
4. ''අහගන්න මිතුරේ ලෝකය කරළිය වෙනවා මායාවේ නළුවෝ අපි''
5. ''මා මළ පසු සොහොන් කොතේ දුක් ගීයක් ලියනු මැනවි''
6. ''දුරුතු හඳේ සිහිල වගේ - මගෙ පැළට වරෙන් හතික සෝඩි නගේ''
7. ''එන්න මද නලේ - ගොස් පවසන්න දුක මගේ''
8. ''කියන්න සී පද රස කරලා''
9. ''බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩී''
10. ''කරව පියාසර සකි කොන්තගම් තොටින්''

## ක්‍රියාකාරකම් 6.4

1. පහත සඳහන් ක්‍රියා පද ඇසුරෙන් විධි ක්‍රියා සකසන්න.

| | |
|---|---|
| 1. නැරඹුවෙමි | 6. තැබී ය |
| 2. කියති | 7. නෙලන්නෙමි |
| 3. කපන්නෙහි | 8. යැවූ හ |
| 4. රවට යි | 9. පිසන්නෝ ය |
| 5. සැරසූ හ | 10. දෙසූවේ ය |

2. සකසා ගත් විධි ක්‍රියා යොදා ගෙන වාක්‍ය නිර්මාණය කරන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

### පුහුණුවට

**වත්මන් අනා රූ - නො වෙන් වැ හොත අනදරින්**
**අදරින් හොත ත අන් සද - සබඳ විදහන් විදි නම්.**
**-සිදත් සඟරාව-**

වර්තමාන අනාගත රූප වෙනස් නොවී අනාදරයෙන් හෝ ආදරයෙන් 'ත' ශබ්ද අන්‍ය කාරක ශබ්ද සම්බන්ධ විධානය 'විධි' නම් වේ.

## ආශීර්වාද ක්‍රියාව

සැරද කිර රද සඳ - නන්වන් රුවන් රූ වන්
සහකුරු මියුරු තෙපුලෙන් - සව් ලෙව් සතන් හදනා
**-ගිරා සන්දේශය-**

නොයෙක් පැහැති රත්න රූපයක් වැනි වූ, අක්ෂර සහිත මධුර වචනයෙන් සියලු ලෝකයාගේ සිත් ඇද ගන්නා ගිරා රාජෝත්තමය බොහෝ කාලයක් ජීවත් වන්න.

ගිරා සන්දේශයේ ඉහත සඳහන් දූතාශීර්වාද ගීයෙන් සිදු කර ඇත්තේ ගිරවාට ආශීර්වාද ප්‍රාර්ථනා කිරීමකි. 'සැරද' (සැරදේවා) යන ක්‍රියා පදයෙන් එය සිදු කර ඇත. ඒ අයුරින් ඉෂ්ටාර්ථයක් හෝ අනිෂ්ටාර්ථයක් ප්‍රාර්ථනා කිරීම සඳහා භාවිත කරන ක්‍රියා ආශීර්වාද ක්‍රියා ලෙස හැඳින්වේ.

ඉෂ්ටාර්ථයේ

* සිසුහු විභාගයෙන් සමත් වෙත් වා!
* කලට වැසි වසී වා!
* රජ ධාර්මික වේ වා!

අනිෂ්ටාර්ථයේ

* සතුරෝ විනාශ වෙත් වා!
* අදමිටු පාලකයා නැසේ වා!
* මහජනයා තුළ මත භේද ඇති වේ වා!

ආශීර්වාද ක්‍රියා තුළින් කෙරෙන ප්‍රාර්ථනය අනාගතයේ ඉටුවන්නක් නිසා එම ක්‍රියා අනාගත කාලය සමග පමණක් සම්බන්ධ වේ.

ආශීර්වාද ක්‍රියා සකසා ගන්නේ → පුරුෂ තුනට අයත් වර්තමාන කාල ක්‍රියා පදයක අගට 'වා' ප්‍රත්‍යය යොදා ගැනීමෙනි.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලැබේවා / ලබාවා | ලැබෙත්වා / ලබත්වා |
| මධ්‍යම පුරුෂ | ලැබෙහිවා / ලබහිවා | ලැබෙහුවා / ලබහුවා |
| උත්තම පුරුෂ | ලැබෙම්වා / ලබම්වා | ලැබෙමුවා / ලබමුවා |

**වා නිපාතය රහිත ව ද ආශීර්වාද ක්‍රියා සැකසී ඇත**

උදා :- * තොස සිය නෑ සහ පරෙවිඳු සඳ **පවතු**
* සැරද සුලකළතුරු - මියුරු තෙපලෙන් **රඳනා**

## ක්‍රියාකාරකම 6.5

සුදුසු ආශීර්වාද ක්‍රියා යොදා හිස් තැන් පුරවන්න.

1. අපේ මව් බිම යෙහෙන් ................................
2. තරු සපිරිවැරු සුපුන් සඳ අහසේ ................................
3. සියලු පාලකයෝ රටට ආදරය ................................
4. අපි සියලු දෙනා විභාගයෙන් ................................
5. නුඹ අභිමත අරමුණ කරා ................................
6. රටට පැමිණෙන ස්වාභාවික උවදුරු ................................
7. දේශයට වින කරන නුඹලා ................................
8. මම සාහිත්‍ය සංගීතාදි කලාවට ලැදියාවක් ඇති අයෙක් ................................



නොමිලේ බෙදා හැරීම පිණිසයි

9. සියලු මගීහු මාර්ග නීති කඩ කරන්නෝ ................................
10. කලට වැසි ................................

## ක්‍රියාකාරකම 6.6

පහත දැක්වෙන ආශීර්වාද ක්‍රියා යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

| | | |
|---|---|---|
| 1. සැරදෙත්වා | 2. සැරසෙම්වා | 3. රසවෙහිවා |
| 4. දිනේවා | 5. කැපෙමෝවා | 6. නැසෙහුවා |
| 7. කෙරෙහිවා | 8. ඇරඹේවා | 9. බැබලෙම්වා |
| 10. දිලෙහුවා | 11. පිබිදෙත්වා | 12. ලබමෝවා |

### පුහුණුවට

**ඉටු නොපත් තෙසද බඳ**
**අනා අරුත් පැතුම් ආසී නම්**
-සිදත් සඟරාව-

ඉටු නොවූ, කාරකත්‍රයට සම්බන්ධ අනාගතාර්ථ ප්‍රාර්ථනය ආශීර්වාද නම් වේ.

### ප්‍රයෝජ්‍ය ක්‍රියාව

ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු ලියවයි

මෙම වාක්‍යයෙහි ගුරුවරයා අකුරු ලිවීම සඳහා ශිෂ්‍යයා මෙහෙයවනු ලබන්නේ ගුරුවරයා විසිනි. මේ ආකාරයට අන් කෙනෙකුගේ මෙහෙයවීම හඟවන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියා නම් වේ.

ප්‍රයෝජ්‍ය ක්‍රියා සැකසෙන්නේ
ක්‍රියා මූලයටත්
ක්‍රියා ප්‍රත්‍යයටත්
අතර 'ව' ප්‍රත්‍යය යෙදීමෙනි.

උදා :- කර + ව + යි = කරවයි
නට + ව + ඊ = නැටවී
සරස + ව + අන්නේ = සරසවන්නේ (ය)

ප්‍රයෝජ්‍ය ක්‍රියා කාලත්‍රයේ හා පුරුෂත්‍රයේ වරනැගේ.

**වර්තමාන කාලය**

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | නට + ව + යි - නටවයි | නට + ව + ති - නටවති |
| මධ්‍යම පුරුෂ | නට + ව + හි - නටවහි | නට + ව + හු - නටවහු |
| උත්තම පුරුෂ | නට + ව + මි - නටවමි | නට + ව + මු - නටවමු |

**අතීත කාලය**

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | නට + ව + ඊ - නැටවී ය | නට + ව + ඌ - නැටවූ ය |
| මධ්‍යම පුරුෂ | නට + ව + ඊහි - නැටවීහි | නට + ව + ඌහු - නැටවූහු |
| උත්තම පුරුෂ | නට + ව + ඊමි - නැටවීමි | නට + ව + ඌමු - නැටවූමු |

**අනාගත කාලය**

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | නට + ව + අන්නේ - නටවන්නේ ය | නට + ව + අන්නෝ - නටවන්නෝය |
| මධ්‍යම පුරුෂ | නට + ව + අන්නෙහි - නටවන්නෙහි | නට + ව + අන්නෙහු - නටවන්නෙහු |
| උත්තම පුරුෂ | නට + ව + අන්නෙමි - නටවන්නෙමි | නට + ව + අන්නෙමු - නටවන්නෙමු |

## ක්‍රියාකාරකම් 6.7

පහත දැක්වෙන වාක්‍ය ප්‍රයෝජ්‍ය ක්‍රියා සහිත වාක්‍ය බවට හරවන්න.

1. පඬුවෝ දුනුම් වඩති.
2. සිංහයා මුවා මරයි.
3. රජ රට පාලනය කරයි.
4. නුඹ දනට ආහාර පිසහි.
5. අපි උත්සවයට නගරය සරසන්නෙමු.
6. නුඹලා සිතුවම් බැලූහු.
7. මම ගම හරහා දිවීමි.
8. බාල දක්ෂයෝ වාර්තා තබති.
9. වාර්තාකරුවෝ තොරතුරු රැස් කරන්නෝ ය.

## ක්‍රියාකාරකම් 6.8

සුදුසු කර්තෘ හා කර්ම පද යොදා හිස්තැන් පුරවන්න.

1. අමාත්‍යවරයා .......................... ලවා නිවාස තනවයි.
2. .......................... ගෙවිලියන් ලවා අහර පිසවති.
3. කඩහිමියා .......................... ලවා මිල සලකුණු කරවී ය.
4. .......................... ගුරුවරිය ලවා අකුරු ලියවන්නේ ය.
5. තැපැල් ස්ථානාධිපතිතුමා .......................... ලවා ලිපි බෙදවයි.
6. ණය හිමියා .......................... ලවා ණය රැස් කරවී ය.
7. .......................... සුළු සේවකයා ලවා කසළ ඇද්දවීමි.
8. අපි .......................... ලවා තරගය දිනවීමු.
9. .......................... මන්ත්‍රීවරුන් ලවා ඡන්දය දිනවන්නේ ය.
10. මහාචාර්යවරයා .......................... ලවා පර්යේෂණ සිදු කරවයි.
11. .......................... ලවා නැටුම නැටවී ය.


නොමිලේ බෙදා හැරීම පිණිසයි

### පුහුණුවට

'පරා විසින් මෙහෙයන ලදහු කිරිය පියදු කිරිය නම්'
-සිදත් සඟරාව-

අනුන් විසින් මෙහෙයවනු ලැබූ තැනැත්තාගේ ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාව නම් වේ.

## සංකල්පනා

**උදව්වක් ඉල්ලීමට හැකියාවක් තිබිය දී එය අයිතියක් ලෙසින් පෙන්වාදීමට නොයන්න**

# 7 නෛපාතික කෘදන්ත

ආඛ්‍යාත පද යටතේ ඔබ ඉගෙනගත් ක්‍රියා, පුරුෂ භේදය, වචන භේදය, කාල භේදය යන බෙදීම් යටතේ සකස් වන බව පැහැදිලි ය. එහෙත් එසේ විවිධ ස්වරූපවලට නොනැගෙන නිපාත ස්වභාවය ගන්නා ක්‍රියා වර්ගයක් ද භාෂාවේ දැකිය හැකි ය. ''නිපාත'' ක්‍රියා යනු ඒවා ය. එම ක්‍රියා ''**නෛපාතික කෘදන්ත**'' යනුවෙන් හැඳින්වේ.

* අව්‍යය කෘදන්ත, නෛපාතික ක්‍රියා, නෛපාතික කෘදන්ත යන නම්වලින් ද හැඳින්වෙන මෙම ක්‍රියා, ප්‍රභේද වශයෙන් හතරකි. එනම්,

* පූර්ව ක්‍රියා
* මිශ්‍ර ක්‍රියා
* අසම්භාව්‍ය (ආවස්ථික) ක්‍රියා
* අපර ක්‍රියා යනු යි. මින් අපර ක්‍රියා හැර සෙසු ක්‍රියා

වර්ග පිළිබඳ ව මේ පාඩමේ දී අධ්‍යයනය කිරීමට ඔබට හැකියාව ලැබෙනු ඇත.

## තෙමගුල සිහිකොට

''අපි මේ වතාවෙත් වෙසක් උත්සවයට ලොකු වෙසක් කූඩුවක් හදමු ද?'' යි අසමින් මෙතෙක් වේලා පාඩම් කරමින් සිට 'ධම්මපදය' පොතට වැඳ, පොත් රාක්කයේ නියමිත ස්ථානයේ තබමින් ජිනරතන පොඩි හාමුදුරුවෝ සුගතසිරි පොඩි හාමුදුරුවන්ගෙන් විමසූහ.

''ඒක නම් හොඳ අදහස ... මතකද ගිය වතාවේ අපි හැදූ නෙළුම් මල? ලොකු හැමුදුරුවෝ එය ලස්සනයි කියල අගය කළා නේ ද?'' සුගතසිරි පොඩි හාමුදුරුවෝ පිළිතුරු දුන්හ.

''ඔව්, ඔව්,... ලොකු හාමුදුරුවන්ටත් මේ ගැන මතක් කරලා, අවසර ඉල්ලගෙන ම අපි වෙසක් කූඩුව හදන්න පටන් ගනිමු..''

ඔරලෝසුව දෙස බලමින් ම ගුණරතන පොඩි හාමුදුරුවන් පැවසුවේ ලොකු හාමුදුරුවන් ට ගිලන්පස පිළිගන්වන වෙලාවත් හරි බව සිතමිනි.

ගුණරතන පොඩි හාමුදුරුවෝ ළිප මොළවා වතුර කේතලය ළිප තබද්දීම සුගතසිරි පොඩි හාමුදුරුවෝ ගිලන්පස සෑදීමට අවශ්‍ය අනෙකුත් කළමනා සූදානම් කළහ.

''ගුණරතන පොඩි හාමුදුරුවනේ, බැරිවෙලාවත් ලොකු හාමුදුරුවෝ වෙසක් කුඩුව හදන්න අවසර නොදුන්නහොත්, අපේ බලාපොරොත්තු දිය වෙලා යාවි නේද?'

''නැහැ, නැහැ එහෙම වෙන්නෙ නෑ. අපි ලොකු හාමුදුරුවන්ට කියමු පාඩම් වැඩ යි පන්සලේ කටයුතු යි දෙකට ම බාධාවක් නොවෙන විදිහට කුඩුව හදන්නම්'' කියලා ගුණරතන පොඩි හාමුදුරුවෝ පැවසූහ.

සුගතසිරි පොඩි හාමුදුරුවන් ලොකු හාමුදුරුවන්ට ගිලන්පස කෝප්පය පිළිගන්වද්දී, ගුණරතන පොඩි හාමුදුරුවෝ මේ ගැන ලොකු හාමුදුරුවන්ගෙන් විමසා සිටියහ.

''ආ... ඒකට මොකද ගුණරතන, එහෙම දෙයක් කරන එක කොච්චර අගෙයි ද?. අපේ ලොව්තුරා තථාගතයන් වහන්සේගේ ගුණ සිහිකරල වෙසක් දිනයට එවැනි ආමිස පූජාවක් කරන එක මහා ආනිශංසයක්. මටත් හැකි වුණොත් පාට කොළ ටිකක්වත් ගෙනත් දෙන්නම්''

''එහෙමයි ලොකු හාමුදුරුවනේ, අපි දෙන්නත් කතා වුණේ, වෙසක් පෝයට සති දෙකක් ම තියෙන නිසා, පාඩම් වැඩවලට යි පන්සලේ වැඩවලට යි බාධාවක් නොවන විදියට වෙසක් කුඩුවේ වැඩ ටික ඉවර කරන්නයි...''

''බොහොම හොඳයි, ඔය කටයුතු කාරණා නිසා පිරිවනේ ඉගෙනීමේ වැඩ අතපසු කළොත් ඒකේ පාඩුවත් පොඩිනමලාට විඳින්න සිදු වේවි කියන එක මතක තියා ගෙන වැඩ කරන්න ඕනේ...''

ලොකු හාමුදුරුවන්ගේ අවසරය ලැබීමෙන් සතුටට පත් පොඩි හාමුදුරුවරු දෙදෙනා වහන්සේ වෙනදාටත් වඩා උනන්දුවෙන් පාඩම් වැඩ හා පන්සලේ වතාවත් ආදියේ නිරත වෙමින් වෙසක් කූඩුවේ වැඩ කටයුතුවල ද නියැලුණාහ.

වෙසක් දිනට පෙර දින පහන් වෙද්දී අලංකාර ලෙස විශාල කූඩුවක් ද පරිවාර කූඩු අටක් ද නිමවා, ලොකු හාමුදුරුවන් ගෙනැවිත් දුන් පාට කොළ ද අලවා නිම කරන්නට පොඩි හාමුදුරුවන් වහන්සේලා සමත් වූහ.

වැඩිහිටි දායක මහතුන්ගේ ද උදවුවෙන් වෙසක් දින උදාවන විට පන්සලේ මිදුලට වෙසක් අසිරිය කැඳවමින් මද සුළගේ රැළි නංවන වෙසක් කූඩු දුටු ලොකු හාමුදුරුවන් වහන්සේගේ සිත ද පහන් විය. පොඩි හාමුදුරුවන් වහන්සේලාගේ මුහුණු ද වලාවෙන් මිදුණු සඳ සේ සතුටු සිනාවෙන් පිරී ගියේ ය.

## පූර්ව ක්‍රියා

ඔබ ඉහතින් කියැවූ කතාව දෙස නැවතත් සිත යොමු කරන්න.

එහි යෙදී ඇති,

> "වැඳ, කියලා, ඉල්ලා ගෙන, මොළවා, අලවා"

ආදි පද පූර්ව ක්‍රියා ගණයට ඇතුළත් වෙයි. අවසාන ක්‍රියාවට මුලින් 'කරන ලද' හෝ 'සිදු වූ ක්‍රියා' පූර්ව ක්‍රියා නමින් හැඳින් වේ. එදිනෙදා ලේඛනයේ දී ත් භාෂණයේ දී ත් අප මෙබඳු 'පූර්ව ක්‍රියා' පද කොපමණ භාවිත කරන්නේ දැ'යි ඔබ මොහොතකටවත් සිතුවෙහි ද?

මෙලෙස භාෂා භාවිතයේ දී පූර්ව ක්‍රියා පද යෙදෙන ආකාර කිහිපයක් අපට හඳුනාගත හැකි වෙයි. ඒවා පිළිබඳ ව අපගේ අවධානය තව දුරටත් යොමු කරමු.

1. සමහර ධාතු ප්‍රකෘතිය ඒ ආකාරයෙන් ම යෙදීම.
   උදා :- කර, පිවිස

2. ධාතු ප්‍රකෘතියේ මුල් ස්වරූපය මදක් වෙනස් කොට යෙදීම.

උදා :- පළඳ - පැළඳ

උපද - ඉපිද

3. ධාතුවකින් පරව පූර්වක්‍රියාර්ථ ''ප්‍රත්‍යයක්'' යෙදීම.

උදා :- ගත් + අ - ගෙන

නට + ආ - නටා

නග + ඇ - නැග/නැගැ

වට + ඊ - වැටී

4. පූර්ව ක්‍රියා පදය සමග උපකාරක පදයක් යොදා ගැනීම.

උදා :- කර + ලා - කරලා

මකා + දමා - මකාදමා

හිඳ + ගෙන - හිඳගෙන

5. ධාතුවට සම්බන්ධකමක් නොපෙනෙන, ප්‍රත්‍යය වෙන් කර ගත නොහැකි පද යෙදීම.

උදා :- අවුත්, ගොස්, කොට

6. ප්‍රයෝජ්‍ය ක්‍රියා මූලවලින් ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා සෑදේ.

උදා :- කර + ව + ආ - කරලා

කව + ව + ආ - කවවා

## ක්‍රියාකාරකම 7.1

1. පහත දැක්වෙන කවි පෙළෙහි ඇති පූර්ව ක්‍රියා පද උපුටා දක්වන්න.

සඳවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
තබවා පුන් කුඹු විසිතුරු



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | |
|---|---|
| පසුකර රුැසිරෙන් | සුරඹා |
| ගොසකර රන් මිණි | සළඹා |
| එනුවර ලිය රඟ | නරඹා |
| බඹසර සිත වත් | කළඹා |
| | |
| පුරවා තුනු රැවින් | අහස |
| කරවා ගී නැටුම් | වෙසෙස |
| අරවා සත සිත | දොම්නස |
| පුරවාසී කෙළිති | මෙලෙස |
| | |
| දැක ඔහු උන් | වෙතට |
| කැඳවාවුත් පළමු | කොට |
| මිල දී සතුට | කොට |
| යෙදී වීණා | ගායනාවට |

-ගුත්තිල කාව්‍යය-

2. එම පූර්ව ක්‍රියා පද යොදා ගෙන සරල වාක්‍ය නිර්මාණය කරන්න.

## ක්‍රියාකාරකම 7.2

මම උදෑසන අවදි වී දත් මැද මුහුණ සෝදා ගිලන්පස වළඳා පාඩම් කටයුතු ඇරඹුවෙමි.

මෙය පූර්ව ක්‍රියා හතරකින් යුක්ත වාක්‍යයකි. මෙවැනි වාක්‍ය දහයක් නිර්මාණය කරන්න.

### පුහුණුවට

**එක කතු කිරියනෙන් - පෙර කිරියට ඇ ආ ඊ**
**ඉන් ලා යුතු ද වියුතු ද - මුසු බැවැ මින් මින මිනි ද.**

-සිදත් සඟරාව-

ඒක කර්තෘක ක්‍රියාවන්ගෙන් පූර්ව ක්‍රියාවට ඇ, ආ, ඊ, ඉන් යනු ලා සහිත ද රහිත ද වන්නේ ය. මිශ්‍ර භාවයෙහි මින්, මින, මිනි ප්‍රත්‍යය ද වේ.

## මිශ්‍ර ක්‍රියා

සිදත් සඟරාවෙහි ''මුසු කිරිය'' නමින් හැඳින්වෙන ''මිශ්‍ර ක්‍රියාව'' ද නෛපාතික කෘදන්ත ගණයට අයත් වූවකි. අවසාන ක්‍රියාව සමග එකවිට ම සිදුවන, අවසාන ක්‍රියාවත් සමග ම අවසන් බව හැඟවෙන ක්‍රියා පද ''මිශ්‍ර ක්‍රියා'' නම් වේ. ඔබ කිය වූ පාඩමෙහි,

අසමින්
කරමින්
තබමින්
බලමින්
කැඳවමින්
සිතමින්

යනුවෙන් සඳහන් වූයේ මිශ්‍ර ක්‍රියා පද යි. වාක්‍යක අවසාන ක්‍රියාවෙන් පළ කෙරෙන කාලය ම මිශ්‍ර ක්‍රියාවෙන් ද පළ වෙයි.

උදා :- දරුවා බිම පෙරළෙමින් හඬයි.

''හඬයි'' යන්න වර්තමාන කාල ක්‍රියාවක් නිසා ''පෙරළෙමින්'' යන මිශ්‍ර ක්‍රියාවෙන් ද වර්තමාන කාල අර්ථයක් ම පළ වෙයි.

උදා :- නිළිය ගී ගයමින් නැටුවා ය.

මෙහි 'නැටුවා ය' යන්නෙන් අතීත කාල අර්ථයක් පළ වන නිසා 'ගී ගයමින්' යන මිශ්‍ර ක්‍රියාව ද අතීත කාල අර්ථයක් ම පළ කරයි.

**මිශ්‍ර ක්‍රියා පද සැකසෙන අයුරු**

1. විවිධ ප්‍රත්‍යය යෙදීමෙන්

ප්‍රධාන වශයෙන් ''මින්'' ප්‍රත්‍යය මේ සඳහා ව්‍යවහාර වී ඇති අතර මින, මිනි, මිනි ප්‍රත්‍යය යෙදුණු අවස්ථා ද සාහිත්‍ය කෘති ඇසුරෙන් ප්‍රකට වෙයි.

උදා :- බල + මින් = බලමින්
සකස + මින් = සකසමින්

දර + මින = දරමින
නට + මින = නටමින
අස + මිනි = අසමිනි
විඳි + මිනි = විඳිමිනි
විදි + මිනි = විදිමිනි

2. පූර්ව ක්‍රියාව ද්විත්ව කොට යෙදීමෙන්

මිශ්‍ර ක්‍රියා අර්ථය දීම සඳහා පූර්ව ක්‍රියාව ද්විත්ව කොට යෙදීම ද සිංහල භාෂා ව්‍යවහාරයෙහි සුලබ ව දැකිය හැක්කකි. මෙහි දී මුල් පූර්ව ක්‍රියාවෙහි ඇති දීර්ඝය හ්‍රස්ව කොට යෙදීම ද විශේෂත්වයකි.

උදා :- පූර්ව ක්‍රියා - මිශ්‍ර ක්‍රියාව

| පූර්ව ක්‍රියා | | මිශ්‍ර ක්‍රියාව |
|---|---|---|
| හඬා | - | හඬ හඬා |
| ලියා | - | ලියලියා |
| ගොතා | - | ගොතගොතා |

## ක්‍රියාකාරකම 7.3

පහත සඳහන් ගද්‍ය පාඨයන්හි ඇතුළත් මිශ්‍ර ක්‍රියා පද තෝරා ගෙන ඒවායෙහි ධාතු හා ප්‍රත්‍ය වෙන් කොට දක්වන්න.

කියමින් ගී රස මියුරු
තබමින් පද තල අනුරූ
බඳිමින් දන මන නුවරු
කෙළිමින් යෙති බැඳ බහුරූ

බලමින් ලකුණු ගත

සුවඳින් බිම පිරිබඩ ගෙන මොනවට
සදමින් සිහසුන මුතු සේසත් යට
තනමින් දෙපසෙහි දිලි රන් මිණි වැට
ඉසිමින් අසෙනිය මල් විසිතුරු කොට

සිතවමිනි දුටු දන　　　　　　　　හට

සර හැර සියොතුන් පියපත්　　විදිමිනි

ඉඳ ඉඳ එක　　　　　　　　　වෙහෙර
විඳ විඳ දහම්　　　　　　　　මනහර
සිඳ බිඳ දුක්　　　　　　　　　සසර
අනේ දෙව්දත් නුදුටි　　　　　මොක්පුර

විමස විමසා සිටින　　　　　　ඇදුරු
-ගුත්තිල කාව්‍යය-

## ක්‍රියාකාරකම 7.4

පහත සඳහන් මිශ්‍ර ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

පිසමින, කකා, ගයමින්, නරඹමිනි, වඳිමිනි, සනස සනසා, අඳිමින, නගමින්, කපමිනි, තබමින

## අසම්භාව්‍ය ක්‍රියා

අසබහව් කිරිය නමින් සිදත් සඟරාවෙහි දක්වෙන අසම්භාව්‍ය ක්‍රියා ද අයත් වන්නේ නෛපාතික කෘදන්ත ගණයට ම ය. 'ආවශ්‍යක කෘදන්ත නිපාත' යනු ද මෙය හැඳින්වීමට යෙදෙන තවත් නමකි.

අසම්භාව්‍ය ක්‍රියාව මගින් අර්ථ දෙකක් සැපයෙන බව වියරණයේ සඳහන් ය.

1. අනියමාර්ථය
2. කාලාර්ථය යනුයි

යම් ක්‍රියාවක් මගින් අවිනිශ්චිත බවක් හැඟවේ නම්, එය අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් යනුවෙන් හැඳින්වේ.

උදා :- ඔබ ආවොත් මම ද හෙට පාසල් එන්නෙමි.

මෙහි මගේ පැමිණීම තීරණය වන්නේ ඔබේ පැමිණීම මතය ''ආවොත්'' යන්නෙන් ඔබේ පැමිණීම අවිනිශ්චිත බව මින් හැඟවේ. එය අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් ලෙස ගැනෙන්නේ එහෙයිනි. සිංහල භාෂා ව්‍යවහාරයෙහි අනියමාර්ථය පළ කිරීම සඳහා ප්‍රත්‍යය කිහිපයක් යොදා ගෙන ඇත. එනම්,

ත්, හොත්, ත යනුයි.

උදා :- ඔහු ගමට යතොත් මම ද යමි.
එහි සිතුවම් දුටහොත් විමසිය හැකි ය.
මග සලකුණු නිවැරදිව බලත, ගමන සාර්ථක වන්නේ ය.

ක්‍රියාව මගින් යම් කාලයක් හැඟවේ නම් එය කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවයි.

උදා :- කුකුළන් හඬලද්දී අපි ගමන පිටත් වීමු (හඬලන වේලාවේ)

කාලාර්ථය හැඟවෙන අසම්භාව්‍ය ක්‍රියා සකසා ගන්නා ආකාර ද කිහිපයක් වෙයි.

දී, ත්, ත

උදා :- සතුරන් පහර දෙත් දී (දෙද්දී) නුවර වැස්සෝ පලා ගියහ.
හිරු පායත් නෙළුම් පිපෙයි.
ඔහු එදෙස බලත, සණ්ටා නද ඇසිණ.

## ක්‍රියාකාරකම 7.5

මෙම පාඩමේ මුලින් සඳහන් වූ ''තෙමගුල සිහිකොට'' කතාවේ ඇති අසම්භාව්‍ය ක්‍රියා පද උපුටා දක්වන්න.

## ක්‍රියාකාරකම 7.6

පහත සඳහන් පද්‍ය පාඨවල ඇතුළත් අසම්භාව්‍ය ක්‍රියා පද තෝරා ඒවායෙහි ධාතුව හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

සතොසින් ඇසුවොත් මෙදහම් මනහර
කැමතිව කීවොත් විමසා එන්නේ

| | |
|---|---|
| වැටුණොත් එක් සිය සතියක් | නිරයේ |
| උපණත් ප්‍රේතව පව් කොට | නොපණත් |
| සිත සතොසින් පින් නොකළොත් | නිසිලෙස |
| විදුලිය පැහැ වැරදුණහොත් | වරදී |
| දනිතොත් දන් සිල් ගුණ සත | නොනැවති |
| එපමණ තොප සිතතොත් | නොහැකිළියේ |
| ඉඳිතොත් බෝකල් ජරයෙන් | විසිරේ |
| වසතොත් සැදැහැත්තන් ඇති | දෙසමය |
| අසතොත් නිබොරුය මුනිඳු | තෙපුල්මය |
| හරිතොත් නොතබා දස අකුසල් | මය |
| රකිතොත් සිත පිරිසිදු කොට | සිල්මය |
| දනිතොත් මෙ සියල්ලට මේ කල් | මය |

-ලෝ වැඩ සඟරාව-

## පුහුණුවට

**තෙ කලැ තෙ සද රූ - නො වෙන් වන හොත අනියම්**
**අරුතැ කල් අරුතැ හොත - කිරිය 'සබහව්' නම් වේ.**

-සිදත් සඟරාව-

අර්ථය කාලත්‍රයේ හෝ ශබ්දත්‍රයේ රූපය වෙනස් නොවී අනියමාර්ථයෙහි හෝ කාලාර්ථයෙහි වූ ක්‍රියාව අසම්භාව්‍ය නම් වේ.

## සංකල්පනා

**අසල්වැසියාගේ නිවස ගිනි ගන්නා විට ඔබගේ දේපළ අවදානම් බව සිතන්න.**

# 8 වාක්‍ය නිර්මාණය

මේ පාඩම ඉගෙනීමෙන් ඔබට,

* උක්තය හා ආඛ්‍යාතය.
* කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය.
* උක්තාඛ්‍යාත යෝගයේ සාමාන්‍ය රීති.
* උක්තාඛ්‍යාත යෝගයේ විශේෂ රීති.

පිළිබඳ ව කරුණු අවබෝධ වනු ඇත.

## ළමා මහල්ලා

නගරයට සමීපයෙන් පිහිටි එක්තරා පාළු වීථියක උදයෙහි තරුණ රූමත් ගැහැනියක් ඇවිදිමින් සිටියා ය. දීප්තිමත් සිනා රැල්ලක් ඇගේ දෙ තොලෙහි රැඳී තිබිණ. ඇය සමග සාවුරුද්දක දරුවෙක් ද විය. ඇගෙන් පෙම්බර බැලුම් හෙළනු ලැබූ දරුවාගේ මුහුණ ප්‍රීතියෙන් ඉපිලිණි.

ඔහුගේ අතෙහි විශාල රෝදයක් විය. කෝටුවකින් රෝදය ගහගෙන යන දරුවා ප්‍රීතියෙන් හඬ නගා සිනාසුණේ ය. වරෙක ඔහු කෝටුව හිස වටා මහත් වේගයෙන් කරකැවුවේ ය. කෙතරම් ප්‍රීතියක් ද? මින් පෙර කිසි දිනක ඔහුට රෝදයක් නො තිබුණේ ය. පෙරළී දුවන රෝදය පසුපස දරුවා සිනාසෙමින් දුවන්නට විය. උදේ පාන්දර වීථිය, සිනාසෙන හිරු, කෙමෙන් වැඩිවන නගරයේ ඝෝෂාව ආදි සියල්ල ම නුහුරු නුපුරුදු අලුත් දේවල් සේ ඔහුට පෙනිණි.

වීථියේ ගමන්කළ වැරහැලි ඇඳගත් මහලු මිනිසෙක් දරුවාටත් ගැහැනියටත් යාමට ඉඩ දීම පිණිස පටු මගෙහි අයිනට ම විය. තම අඳුරු දෙනෙත යොමා දරුවා දෙස බලා සිනාසුණු ඔහුගේ හිස අවුල් සහගත අදහස්වලින් පිරෙන්නට වූයේ ය.

''පුංචි මහත්තයෙක්'' යි මහල්ලා තමාට ම කියාගත්තේ ය. ''ඇබිත්තං හාදයෙක්'' ඕ සන්තෝෂයෙන් පැළෙනවා. බලහංකො උඩ පැන පැන රෝදය ගහගෙන යන හැටි.

මේ මහලු මිනිසා දරුවකු ව සිටිය දී ගත කළේ ඉතා දුඃඛිත ජීවිතයෙකි. දැනටත් සැපවත් යැයි කිව හැකි කිසිවක් ඔහු කෙරෙහි නැත. තමන් කුඩා අවධියේ කුස ගින්නේ හිටි හැටි, සීතලේ වෙවුලූ සැටි, ගුටි කෑ සැටි ඔහුට මතක් විය. රෝදයක් සමග හෝ වෙන යම් කිසි බඩුවක් සමග හෝ සෙල්ලම් කිරීමේ ප්‍රීතිය ඔහු කිසි කලෙක නො වින්දේ ය. ඔහුගේ මුළු ජීවිතය ම පිරී තිබුණේ දුකින් හා දුර්භාග්‍යයෙන් ය.

එ හෙයින් ඔහුට තමා විඳි එකම සැපතකුදු මතක් කරනු නොහැකි විය. දත් නැතිව මුව විරිත්තා දරුවා දෙස බලා සිනාසුණු ඔහු දරුවාට ඊර්ෂ්‍යා කළේ ය.

''මොන මෝඩ සෙල්ලමක් ද ඔය රෝද ගැහිල්ල'' යි තමාට ම කියාගත් ඔහු තවදුරටත් ඊර්ෂ්‍යාවෙන් පෙළෙන්නට වූයේ ය.

කුඩාකල සිට මහලු වන තුරු වැඩ කළ, පැක්ටරියේ වැඩට ගිය මුළු දවස තිස්සේ ම සිතන්නට වූයේ අර දරුවා ගැන ය. ඉතා තදින් ගැඹුරට වැදුණු ඒ සිත ලෙහෙසියෙන් අස් කරගත නොහැකි වූයේ ය. රෝදය ගසමින් දුවන - සිනැහෙන - උඩපනින - දරුවා ඔහුට පෙනෙන්නට විය.

කා බී සැප විඳ කොපමණ හොඳට මහතට සිටියද ඔහු..... පැක්ටෙරියේ මැෂින්වලින් නගින ඝෝෂාව අස්සේ මුළු දවස තිස්සේ ම මහල්ලාට පෙණුණේ රෝදය ගසමින් යන දරුවා ය.

පසු දින උදයෙහි සිතුවිලිවලින් යළිත් මහලු මිනිසා පෙළෙන්නට විය.

පැක්ටෙරියේ නොයෙක් මැෂින් ඝෝෂා නගමින් ක්‍රියා කරයි. කම්කරුවෝ නොයෙක් ක්‍රියාවන්හි යෙදී සිටිති..... මහල්ලාගේ දත් නැති මුව නොපෙනෙන ප්‍රීතියකින් පිබිදෙයි. .....වාතය දූවිලිවලින් බර වී ඇත. ලොකු කුඩා මැෂින් රෝද කරකවන හම් පටි හඬ නගමින් ඇදෙයි. නළවලින් පිටවන වාෂ්ප නිසා

පැක්ටේරියේ ඇත මුලු නො පෙනී යයි. සිත් පිත් නැති අවතාර මෙන් අතරින් පතර මතුවන මිනිසුන්ගේ කටහඬ මැෂින්වල ඝෝෂාවෙන් යටපත් වේ.

මහලු මිනිසාගේ සිත යළිත් ක්‍රියා කරන්නට විය. මොහොතකට ඔහු කුඩා දරුවෙක් වූයේ ය. .....තරුණ රූමත් මවක් ඔහු පසෙකින් වූවා ය. තම අතෙහි රෝදයක් හා එය එලවාගෙන යාමට කෝටුවක් ද විය. ඔහු කෝටුවෙන් ගසමින් රෝදය හා සමඟ සෙල්ලම් කරන්නට පටන් ගත්තේ ය.

කාලය දින ගණනින් ගෙවී යද්දී පැක්ටේරියේ වැඩ පළද නිසි සේ කෙරිණි. මහල්ලාගේ සිතිවිල්ල ගෙවී නොගියේ ය.

වැඩ කොට සවස් වේලෙහි ආපසු ගෙදර එන මහල්ලාට පාරේ වැටී තිබුණු පරණ පීප්පයක රෝද පට්ටමක් හමු විය. ඉතා අපිරිසිදු මළ බැඳුණු එය දුටු වහාම ඔහු ප්‍රීතියෙන් ඉපිලෙන්නට වන. ඔහුගේ අඳුරු දෙනෙතෙහි සතුටින් කඳුලු බිඳු නැගිණි. නොඉවසිය හැකි ආශාවකින් හා සන්තෝෂයකින් ඔහු වෙළී යන්නට විය.

පරීක්ෂාවෙන් අවට බලා බිමට පහත් වී ගැහෙන අතින් යුතුව රෝදය අවුලා ගත් හෙතෙම විළියෙන් සිනා සෙමින් එය ගෙදර ගෙන ගියේ ය.

කිසිවකු මෙය දැක්කේ වත් ප්‍රශ්න කෙළේ වත් නැත. ඉතා පරණ, කැඩුණු, අබලන් වුණු, රෝදයක් ගෙන යන මහල්ලකුට කවුරු සැලකිල්ලක් දක්වත් ද?

සරදමට ලක්වන බියෙන් ඔහු එය ගෙන ගියේ සඟවාගෙන ය. රෝදය අවුලා ගත්තේ කුමකට ද කියා හෝ ගෙන යන්නේ කුමකට ද කියා හෝ තෙමේ ම නො දත්තේ ය. ඒ රෝදය අර දරුවාගේ රෝදය වැනි විය. ඔහුට එය ම ඇති. රෝදය දෙස බලා මහත් අශාවෙන් එය අතගාන හැම වතාවක දී ම ඔහුගේ සිතිවිලි කැලැඹී මහත් වේගයෙන් නැග එයි.

මහල්ලාගේ දුගී නිවසේ කබල් ඇඳ යට දින කීපයක් ම අර රෝදය තිබුණේ ය. ඇතැම් විට ඔහු ඇඳ යටින් එය මැතට ඇද ඕනෑකමින් බැලී ය. අබලන් වූ, අපිරිසිදු රෝදය නිසා මහල්ලාගේ සිතට සැනසුම ලැබුණි. ඒ හැම විට ම අර ප්‍රීතිමත් දරුවා පිළිබඳ සිතිවිලිවලින් ඔහුගේ හිස පිරිණි.

එක් රමණීය උදෑසනක කුරුල්ලන් අතු අතර නාද දෙද්දී පාන්දරින් ම අවදි වූ මහල්ලා රෝදයත් ගෙන නගරයෙන් මඳක් ඈතින් වූ ගම්බද පෙදෙසට ගියේ ය. එහි ගොස් පැරණි ගසින් හා කටු පඳුරින් යුතු වන ලැහැබක් මැදින් ගමන් කළ ඔහු වරින් වර කැස්සේ ය. ගොරෝසු ගැට සහිත පොත්තෙන් වැසුණු මහා ගස්වල නිහඬ බව ඔහුට තේරුම් ගත නොහැකි විය. ශාන්ත උදයේ පැවති මීදුම ගස් අතරින් පොළොවට ගලා එන්නට විය. ඔහු වියළි කොළ මත දෙපා තබමින් ගමන් කරන්නට විය.

වියළි අතු කැබැල්ලක් කඩා ගත් හෙතෙම තම රෝදය එහි එල්ලා ගත්තේ ය.

අලුතින්, ලියැලුණු තණ මත පැතිරුණු පිණි බිඳුවලින් ද නිසල හිරු එළියෙන් ද යුතු එළිමහනකට මහල්ලා අවසානයේ දී පැමිණුණි. ඉක්බිතිව ඔහු තම රෝදය කෝටුවෙන් තල්ලු කොට රෝදයට පහරක් ගැසී ය. රෝදය තණ බිම මත පෙරළී දුවන්නට විය.

මහ හඬින් සිනාසී උදම්වුණු මහල්ලා රෝදය පසු පස්සේ දරුවා මෙන් දුවන්නට වූයේ ය. උඩ පනිමින් කෝටුවෙන් ගසමින් රෝදය පදවන්නට ඔහු පටන් ගත්තේ ය. අර දරුවා කළ සේ ම කෝටුව තම හිස වටා කර කැවී ය.

තමා ඉතා කුඩා, ප්‍රිය ජනක, ප්‍රීතිමත් එකකු ලෙස ඔහුට පෙනිණි. නිතර ම තමා පසු පස යමින් පෙම්වත් බැලුම් හෙළන මවක තමාට ද ඇත්තා සේ ඔහුට වැටහුණේ ය. පළමුවරට ගෙයින් පිටතට යන දරුවකු පරිද්දෙන් ඔහු නිල් තණ හා පඳුරු මත දුව පනිමින් මහත් ආස්වාදයක් වින්දේ ය.

රෝදයත් සමග වන රොදෙහි උදය කාලය ගතකරන්නට මහල්ලා ප්‍රිය කෙළේ ය. තමා කරන දෙය එළි වී සරදමට භාජන වෙති'යි යන සිත ඇතැම් විට ඔහු තුළ ලජ්ජාවක් ඇති කළේ ය. මෙවැනි අවස්ථාවන්හි දී ඔහු බියෙනුත් කැලඹිල්ලෙනුත් යුතුව අවට බැලී ය.

එහෙත් කිසිවකු කිසිවිටක පෙනෙන මානයේ වත් ඇසෙන මානයේ වත් සිටියේ නැත.

එබැවින් සිත් සේ ක්‍රීඩා කිරීමෙන් පසුව ප්‍රීතියෙන් උදම් වෙමින් නගරයට ඒම මහල්ලාගේ සිරිත විය.

කිසිවෙකුටත් මේ සිද්ධීන් දැන ගැනීමට නො ලැබුණි. මහල්ලා මෙපරිද්දෙන් ම ක්‍රීඩා කෙළේ ය. තදින් පින්න පැවතුණු එක් උදෑසනක ක්‍රීඩා කිරීමෙන් ඔහුට ප්‍රතිශ්‍යාව වැළඳුණේ ය. වැඩි දිනක් යන්නට කලින් ඔහු මිය ගියේ ය.

**-මසුන් මරන්නෝ-**

අප ව්‍යවහාර කරන භාෂාව කථන මාධ්‍යය හා ලේඛන මාධ්‍යය යනුවෙන් දෙකොටසකට බෙදා දැක්විය හැකි ය. කථන මාධ්‍යයේ දී ශබ්ද උච්චාරණය මගින් අදහස් පළකරන අපි, ලේඛන මාධ්‍යයේ දී ''ශබ්ද'' වෙනුවට පිළිගත් (සම්මත) සංකේත භාවිත කරමු. ''අක්ෂර'' යනුවෙන් හැඳින්වෙනුයේ ද මේවා ය.

අක්ෂර පිළිගත් රටාවකට ගැළපීමෙන් අප සකස් කරගනු ලබන කුඩා ම ඒකකය වචන යි. වචන නිර්මාණාත්මක ව, පිළිගත් රටාවකට සංවිධානය කිරීමෙන් පූර්ණ අදහසක් පළ කළ හැකි වාක්‍ය සාදා ගැනීමට පුළුවන. එවැනි වාක්‍ය සමූහයක් මගින් වඩාත් පුළුල් අදහස් ප්‍රකාශනයට අපට අවකාශ ලැබේ.

අපි මෙහි කියවූ කතාව දෙස අවධානය යොමු කරමු. එහි මුල සිට අග දක්වා ම ඇත්තේ ද යට කියන ලද ආකාරයට සකස් කරගත් වචන හා වාක්‍ය සමූහයකි. එහෙත් ඒ සෑම වාක්‍යයක් ම සිංහල භාෂාවේ පිළිගත් සම්මතයන්ට / රීතීන්ට අනුකූල ව ලියා ඇති බව අප මතක තබා ගත යුතු ය. ජාතියේ හා භාෂාවේ පැවැත්ම අගය කරන්නන් වශයෙන් අප ද සම්මත රීති හා සම්ප්‍රදායයන් අවබෝධයෙන් යුතු ව අනුගමනය කරමින් ලේඛනයේ යෙදීම වැදගත් ය.

මූලික පිරිවෙන් 1-2-3 ශ්‍රේණිවලදී 'වාක්‍ය නිර්මාණය' පිළිබඳ ව ඔබ කරුණු උගත්තෙහි ය. උගත් කරුණු තහවුරු කර ගැනීම සඳහා යළි සැකෙවින් විමසා බලමු.

## උක්තය හා ආඛ්‍යාතය

වාක්‍යයක් නිවැරදි ව ලියන්නට නම් උක්තය හා ආඛ්‍යාතය අතර සම්බන්ධය අවබෝධ කරගත යුතු ය. එකිනෙක සමඟ අන්‍යෝන්‍ය වශයෙන් බැඳී සිටිමින් පුළුල්වූත් - නිවැරදිවූත් - පැහැදිලිවූත් අදහස් ප්‍රකාශනයට මහෝපකාරී වන, වාක්‍යයක ඇති ප්‍රධාන කොටස් දෙක උක්තය හා ආඛ්‍යාතයයි.

**ඉතා වැදගත්**

> ආඛ්‍යාතය යනු වාක්‍යයේ අවසාන ක්‍රියාව යි.

> ආඛ්‍යාතයෙන් (අවසාන ක්‍රියාවෙන්) කියැවෙන (උක්තවන) තැනැත්තා/ තැනැත්තී/ තැනැත්තෝ / දෙය /දේවල් / සංකල්ප උක්ත යයි.

උදහරණ :-

| උක්තය | | ආඛ්‍යාතය |
|---|---|---|
| මවුවරු | දරුවන් | නළවති |
| පියා | මා | රකියි |
| ගුරුතුමා | අප | හික්මවයි |

මෙම වාක්‍යවල, පිළිවෙළින් නළවති, රකියි, හික්මවයි, යන ආඛ්‍යාතවලින් උක්ත වූයේ 'මවුවරු', 'පියා', 'ගුරුතුමා', යන පද යි.

එසේ ම එම ආඛ්‍යාතවලින් නොකියවුණු 'දරුවන්', 'මා', 'අප' යන පද හඳුන්වන්නේ අනුක්ත පද යනුවෙනි.

### ක්‍රියාකාරකම 8.1

පහත දැක්වෙන වගුව සුදුසු උක්ත පද හෝ අනුක්ත පද යොදා පුරවන්න.

| | ඒක වචන | | බහු වචන | |
|---|---|---|---|---|
| ප්‍රථම පුරුෂය | උක්ත පදය | අනුක්ත පදය | උක්ත පදය | අනුක්ත පදය |
| | ඔහු<br>ඇය<br>ආනන්ද<br>සුජාතා | ........................<br>........................<br>........................<br>........................ | ........................<br>........................<br>........................<br>........................ | ඔවුන් |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | | | |
|---|---|---|---|---|
| මධ්‍යම<br>පුරුෂය | නුඹ<br>තෝ<br>තා<br>තී | ..........................<br>..........................<br>..........................<br>.......................... | ..........................<br>..........................<br>..........................<br>.......................... | නුඹලා<br>තොප |
| උත්තම<br>පුරුෂය | ..........................<br>..........................<br>..........................<br>.......................... | මා | අපි | ..........................<br>..........................<br>..........................<br>.......................... |

**කර්තෘකාරක වාක්‍ය හා කර්ම කාරක වාක්‍ය**

වාක්‍ය ලියා දක්වනු ලබන ආකාරය අනුව,

1. කර්තෘ කාරක වාක්‍ය.
2. කර්ම කාරක වාක්‍ය.

යනුවෙන් දෙකොටසකට බෙදා දැක්විය හැකිබව මේ වන විටත් අපි උගෙන ඇත්තෙමු.

ඒ අනුව,

> වාක්‍යයක ආඛ්‍යාතයෙන් උක්ත වන්නේ කර්තෘ පදය නම් එවැනි වාක්‍යයක් කර්තෘ කාරක වාක්‍යයකි.

උදාහරණ :-

| <u>කර්තෘ</u> | <u>කර්මය</u> | <u>ක්‍රියාව (ආඛ්‍යාතය)</u> |
|---|---|---|
| මව | දරුවා | නළවයි. |
| මවුවරු | දරුවන් | නළවති. |

* නළවයි ⟶ කවුද? ⟶ මව

* නළවති ⟶ කවුද? ⟶ මව්වරු

මේ උදාහරණවලට අනුව පිළිවෙළින් 'නළවයි', 'නළවති' යන ආඛ්‍යාතවලින් උක්ත වූයේ 'මව', 'මවුවරු', යන කර්තෘ පද නිසා, මෙවැනි වාක්‍යවලට 'කර්තෘ කාරක වාක්‍ය' යැයි කියමු.

> වාක්‍යයක ආඛ්‍යාතයෙන් උක්ත වන්නේ එහි කර්ම පදය නම්, එවැනි වාක්‍යයක් කර්ම කාරක වාක්‍යයකි.

උදාහරණ :-

| <u>කර්තෘ</u> | <u>කර්මය</u> | <u>ආඛ්‍යාතය</u> |
|---|---|---|
| මව විසින් | දරුවා | නැළවේ/ නළවනු ලබයි. |
| මව්වරුන් විසින් | දරුවෝ | නැළවෙති/ නළවනු ලබති. |

* නැළවෙයි/නළවනු ලබයි. ⟶ කාවද? ⟶ දරුවා.
* නැළවෙති/ නළවනු ලබති. ⟶ කාවද? ⟶ දරුවෝ.

මෙම උදාහරණවලට අනුව පිළිවෙළින් 'නැළවෙයි', 'නැළවෙති' යන ආඛ්‍යාතවලින් උක්ත වූයේ 'දරුවා', 'දරුවෝ' යන කර්ම පද යි. එම නිසා මෙවැනි වාක්‍යවලට 'කර්ම කාරක වාක්‍ය' යයි කියමු.

**උක්තාඛ්‍යාත යෝගයේ සාමාන්‍ය රීති**

වාක්‍ය නිර්මාණයේ දී අනුගමනය කළ යුතු උක්තාඛ්‍යාත යෝගයේ 'සාමාන්‍ය රීති' පිළිබඳ ව මේ වනවිට ඔබට දැනුමක් හා අවබෝධයක් තිබේ. උගත් දේ යළි තහවුරු කර ගැනීම සඳහා උක්තාඛ්‍යාත යෝගයේ සාමාන්‍ය රීති කිහිපයක් පිළිබඳ ව යළි විමසා බලමු.

1. උක්තය හා ආඛ්‍යාතය වචනයෙන් සමාන වේ.

    උදාහරණ :- දැරිය මල් නෙළයි (ඒකවචන)
    දැරියෝ මල් නෙළති (බහුවචන)

2. උක්තය හා ආඛ්‍යාතය පුරුෂයෙන් සමාන වේ.

    උදාහරණ :- ළමයා අකුරු ලියයි.
    නුඹ අකුරු ලියහි.
    මම අකුරු ලියමි.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

3. ආඛ්‍යාතය කෘදන්තයක් නම් උක්තය හා ආඛ්‍යාතය ලිංග වශයෙන් ද සමාන වේ.

උදාහරණ :- උපාසකයා සිල් සමාදන් වූයේ ය.
උපාසිකාව සිල් සමාදන් වූවා ය.
උපාසකයා සිල් සමාදන් වන්නේ ය.
උපාසිකාව සිල් සමාදන් වන්නී ය.

4. අතීත - අනතීත කාලවලට අයත් ආඛ්‍යාත යෙදීමේ දී වචන භේදය, පුරුෂ භේදය පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

උදාහරණ :-

| උක්තය | | | ආඛ්‍යාතය | | |
|---|---|---|---|---|---|
| | | | අතීත | අනතීත | |
| | | | | වර්තමාන | අනාගත |
| ප්‍රථම පුරුෂ | ඒක වචන | ඇගේ<br>ඔහු | ගියා ය.<br>ගියේ ය. | යයි.<br>යයි. | යන්නීය/යයි/<br>යන්නේ ය. |
| | බහු වචන | ඔවුහු | ගියහ.<br>ගියෝ ය. | යති.<br>යති. | යන්නෝ ය/<br>යති. |
| මධ්‍යම පුරුෂ | ඒක වචන | නුඹ/<br>තෝ/ තී | ගියෙහි. | යහි. | යන්නෙහි/<br>යහි. |
| | බහු වචන | නුඹලා/<br>තොපි | ගියෙහු. | යහු. | යන්නෙහු/<br>යහු. |
| උත්තම පුරුෂ | ඒක වචන | මම | ගියෙමි. | යමි. | යන්නෙමි/<br>යමි. |
| | බහු වචන | අපි | ගියෙමු. | යමු. | යන්නෙමු/යමු. |

## ක්‍රියාකාරකම 8.2

හිස්තැනට සුදුසු ආඛ්‍යාත පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| කාලය | අතීත කාලය | | වර්තමාන කාලය | | අනාගත කාලය | |
|---|---|---|---|---|---|---|
| වචනය | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| ප්‍රථම පුරුෂ | ගියේ ය | ............... | යයි. | යති. | යයි/ යන්නේ ය. | ............... |
| මධ්‍යම පුරුෂ | ගියෙහි | ............... | ............... | ............... | යහි/ යන්නෙහි. | ............... |
| උත්තම පුරුෂ | ............... | ගියෙමු. | ............... | යමු. | ............... | යන්නෙමු. |

### උක්තාඛ්‍යාත යෝගය පිළිබඳ විශේෂ රීති

ඉහත දක්වන ලද උක්තාඛ්‍යාත යෝගයේ සාමාන්‍ය රීතිවලට වෙනස් ව උක්තය හා ආඛ්‍යාතය යෙදුණු අවස්ථා පැරණි හා නූතන ලේඛන ව්‍යවහාරයන්හි අපට දැකිය හැකි ය. 'උක්තාඛ්‍යාත යෝගය පිළිබඳ විශේෂ රීති' යනුවෙන් හැඳින්වෙන්නේ ඒවා ය. පහත දැක්වෙන්නේ එවැනි විශේෂ රීති කිහිපයකි.

1. වාක්‍යයක උක්තය නපුංසක ලිංග බහුවචන වුව ද, ආඛ්‍යාතය ඒක වචනයෙන් ම තැබේ.

   උදහරණ :- ගස් සුළඟින් වැටෙයි.
   තරු අහසේ බබළයි.

2. නපුංසක ලිංග උක්තයක් ඕ/හු විභක්ති ප්‍රත්‍යයන් ගෙන ඇත්නම් ආඛ්‍යාතය බහු වචනයෙන් තැබේ.

   උදහරණ :- පියුම්හු විකසිත වෙති.
   ගංගාවෝ මුහුද කරා ගලා බසිති.

3. දේවී, මෙහෙසි වැනි ගෞරවාර්ථ පදයක් සහිත ඒකවචන ස්ත්‍රී ලිංග උක්තය සඳහා අතීත කාල ආඛ්‍යාතය බහුවචනයෙන් තැබීම පුරාණ ගද්‍ය සම්ප්‍රදායය යි.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

උදාහරණ :- අමරාදේවී බෝසතාණන්ට මග කියාලා නැගී ගිය හ.
(උම්මග්ග ජාතකය)
මද්‍රිදේවී ''ස්වාමීනි මම යැයි කී හ''
(බුත්සරණ)

එහෙත් ශුද්ධ ආඛ්‍යාතය වෙනුවට කෘදන්ත ක්‍රියාව යොදන විට, එහි ස්ත්‍රී ලිංග රූපය ම යෙදිය යුතු ය.

උදාහරණ :- විහාරමහා දේවී මුහුදට බිලි වූවා ය.

4. රළ, පෙළ, කැල, ගණ, පිරිස, සෙනග, වැනි සමූහාර්ථවාචී පදයක්, ප්‍රාණවාචී නාම පදයක් සමග යෙදී උක්තය වශයෙන් සිටී නම්, ආඛ්‍යාතය බහුවචනයෙන් තැබේ.

උදාහරණ :- නන් හය සෙන් සිටියෝ සිටි මතිනි.
මින්රළවුත් ගං වෙරළට රැස්වූ.
සෙබළ පිරිස සතුරන් පළවා හරිති.

5. රළ, පෙළ, කැල, ගණ, පිරිස, සෙනග, වැනි සමූහාර්ථවාචී පදයක්, අප්‍රාණවාචී නාම පදයක් සමග යෙදී උක්තය වශයෙන් සිටී නම්, ආඛ්‍යාතය ඒක වචනයෙන් තැබේ.

උදාහරණ :- තුරු පෙළ මහ සුළඟින් ඇඹරෙයි.
තරු පන්තිය අහස් තලයෙහි රැස්වෙයි.

6. ගෞරවාර්ථවත් වහන්සේ, වහන්දෑ වැනි පදයක් උක්තය සමග යෙදෙන විට ආඛ්‍යාතය බහු වචනයෙන් හෝ සේක/ දෑය යනුවෙන් අවසන් වේ.

උදාහරණ :- මෑණියන්දෑ පෙහෙවස් සමාදන් වූහ./ වූදෑය.
තෙරුන්වහන්සේ පිඬු සිඟා වඩිති./ වඩින සේක.

7. කෙනෙක්, අයෙක්, අය, ඇතැමෙක්, සමහරෙක්, සමහරු, කවරෙක් වැනි පද නිත්‍ය බහු වචන පද යි. එවැනි පදයක් උක්තය වශයෙන් යෙදෙන කල ආඛ්‍යාතය බහුවචනයෙන් තැබේ.

උදාහරණ :- කෙනෙක් දහම්හි හැසිරෙති.
සමහරු පිනට දහමට ලැදිවෙති.

8. සංශයාර්ථය හඟවන වාක්‍යයක ''යි'' නිපාතය හා බැඳුණු අන්තර් වාක්‍යයේ කර්තෘ අනුක්ත රූපයෙන් තබා, ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ බහු වචනයෙන් තැබිය යුතු ය.

උදාහරණ :- අප හොඳින් විභාගය සමත්වෙති'යි ගුරුවරයා සිතයි.
සතුරන් නගරයට ඇතුළුවෙති'යි නුවර වැසියෝ බිය වූහ.

9. ශ්‍රැති සූචනාර්ථයේ යෙදෙන ල/ලු නිපාත ඇතිවිට ද ප්‍රශ්නාර්ථයේ යෙදෙන 'ද' නිපාතය ඇතිවිට ද කර්තෘ උක්ත රූපයෙන් ම තැබේ.

උදාහරණ :- සෝමාලියානු මුහුදු කොල්ලකරුවෝ ශ්‍රී ලාංකික ධීවර යාත්‍රා පැහැර ගත්තෝ ලු.
ක්‍රීඩා ලෝලීහු ක්‍රීඩකයින් දිරිමත් කළෝ ද?

10. ආඛ්‍යාත පූරණයක් යෙදෙන වාක්‍යවල කර්තෘ පද දෙක ම උක්ත රූපයෙන් ම තැබේ.

උදාහරණ :- වරදකරුවෝ අපි ය.
ඔවුහු වෙළෙන්දෝ ය.

11. අවිනිශ්චිතාර්ථයේ යෙදෙන 'වි' නිපාතය ඇතිවිට ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් ද, කර්තෘ පදය අනුක්ත ව ද තැබිය යුතු ය.

උදාහරණ :- ඔවුන් හොඳින් ජීවත් වේවි.
සතුරන් පරාජය වේවි.
මා විභාගය සමත් වේවි.

12. ආඛ්‍යාතය වෙනුවට ඇත/නැත යන පද යෙදෙන විට කර්තෘ පද උක්ත රූපයෙන් ම සිටී.

උදාහරණ :- ගෙයි මිනිස්සු නැත.
පෙරහරේ අලි ඇත.

13. ඇත/නැත පද පූර්ව ක්‍රියාවකින් හෝ භාව ක්‍රියාවකින් පසුව යෙදෙන විට වාක්‍යයේ කර්තෘ අනුක්ත කළ යුතු ය.

උදාහරණ :- සිසුන් පාසලට පැමිණි නැත.
මා ඔවුන් කිසි දිනක දුක නැත.
උපාසිකාවන් විහාරයට පැමිණෙනු ඇත.

14. යුතු/ මැනවි ආදී පදයකින් වාක්‍යයක් අවසන් වනවිට, වාක්‍යයේ කර්තෘ පදය අනුක්ත රූපයෙන් තැබේ.

උදාහරණ :- පාරේ යන්නන් දකුණු පැත්තෙන් යා යුතු ය.
අප දෙමාපියන්ට සැලකීම මැනවි.

15. ඇයි? කෙසේ ද? කවරද ද? ආදී ප්‍රශ්න වාචී පදයකින් කෙළවර වන වාක්‍යයක කර්තෘ අනුක්ත රූපයෙන් යෙදිය යුතු ය.

උදාහරණ :- ළමයින් නිතරම අසනීපවන්නේ ඇයි?
ඔවුන් මා හමුවන්නේ කවදා ද?

## ක්‍රියාකාරකම 8.3

සුදුසු ආඛ්‍යාත පද යොදා හිස්තැන් පුරවන්න.

1. හිමිදිරි උදයේ කුරුළු ගී නද ....................... (ඇසෙයි/ ඇසෙති)
2. තාරකාවෝ රෑ අහසෙහි ....................... (බබළති/ බබළයි)
3. පටාචාරාවෝ පැවිදි ව රහත් බව ....................... (ලැබීය/ ලැබූහ)
4. අම්මා ඇඹුල රැගෙන කුඹුරට ....................... (ගියාහ/ ගියාය)
5. ඇත් රංචුව ගමට ....................... (වැදුණාහ/ වැදුණේය)
6. බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා ....................... (වැඩියේය/ වැඩිසේක)
7. මා අද ගෙදර එති'යි අම්මා ....................... (සිතන්නීය/ සිතන්නෝය)
8. සිංහලයෝ ....................... ද? (බෞද්ධයන්/ බෞද්ධයෝ)
9. මෙවර විභාගයෙන් ජය ලැබුවෝ ....................... ය (අප/ අපි)
10. උසස්පෙළ ශිෂ්‍යයෝ ....................... ලු (ජයග්‍රාහකයන්/ ජයග්‍රාහකයෝ)

## ක්‍රියාකාරකම 8.4

පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කොට නැවත ලියන්න.

1. දරුවෙක් අද යහමග යන්නේ කෙසේ ද?
2. මීයෝ වෙණ කති'යි අද මවුපියෝ දෙදෙන 'සූ සූ' යැයි අත් ගැසූහ.
3. පුතා හොඳින් පාඩම් කරමි'යි අම්මා ගුරුතුමාට කීවා ය.
4. යුවතියක් අද තනිව මහමග යාම නොමැනවි.

5. ශිෂ්‍යයෝ හෙට උදයේ පාසල් ඒවි.
6. සිංහලයන් ආර්යයෝ ලු.
7. ඔවුහු තවම ගෙදර පැමිණ නැත.
8. සොරමුළ ගෙවල් බිඳිමින් යයි.
9. බොහෝ අය තම වාසිය සළකයි.
10. පිරිසේ සමහරෙකු අසාධාරණයට විරුද්ධ වූහ.

## ක්‍රියාකාරකම 8.5

මෙහි පාඩම ආරම්භයේ යෙදී තිබූ කතාව ඇසුරෙන් උක්තාඛ්‍යාත සම්බන්ධයේ සාමාන්‍ය රීති හා විශේෂ රීතිවලට අදාළ වාක්‍ය තෝරාගෙන ලියා දක්වන්න.

## සංකල්පනා

**දැනුම සොයන්නා ද ධනය සොයන්නා ද කිසි දිනෙක තෘප්තිමත් නොවන්නේ ය.**

# 9 රචනය

භාෂාව උපයෝගි කරගෙන අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීමේ එක් ක්‍රමයකි ලේඛනය. වාක්‍ය රචනය ද ලේඛන ගණයට ඇතුළත් වේ. වාක්‍ය රචනය පිළිබඳවත් නිවැරදි ව රචනාවක් ලිවීමේ ක්‍රමවේදයත්, රචනා වර්ග හා රචනාවකින් ඇති ප්‍රයෝජන පිළිබඳවත් මේ පාඩමෙන් අවබෝධයක් ලබා ගැනීමට ඔබට පුළුවන.

පන්තියේ සියලු දෙනා අසුන්වලින් නැගිට ඇඳිලි බැඳ නමස්කාර කරමින් "තෙරුවන් සරණයි" යනුවෙන් ආශීර්වාද කොට, පන්තියට වැඩම කළ සුජාත පණ්ඩිත හාමුදුරුවන් පිළිගත්හ. උන්වහන්සේ ද සියලු දෙනාට තම ආචාරය පිළිගැන්වූ හ.

සුජාත පණ්ඩිත හාමුදුරුවෝ :- පසුගිය දවසේ පාඩම අවසානයේ හැම දෙනාට ම මතක් කළා රචනා පිළිබඳ ව තොරතුරු රැස්කර ගෙන එන්න කියලා, සුදනමෙන් ඇවිත් ඇති කියලා හිතනවා. පන්තියේ හැම දෙනා ම ඇතුළත් වෙන විදියට කුසපත් ඇදීමකින් කණ්ඩායම් හතරකට බෙදා ගන්නවා. ඒ කණ්ඩායම් මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා කියලා නම් කරනවා.

- කණ්ඩායමේ සාමාජකයින්ගේ කැමැත්තෙන් නායකයකු පත්කර ගන්න ඕන.
- එක් කණ්ඩායමකට එක ප්‍රශ්නය බැගින් ලැබෙනවා.
- සාමාජිකයින් සියලු දෙනාගේ සහභාගිත්වයෙන් පිළිතුරු සකස් කළ යුතු යි.

○ අවසානයේ කණ්ඩායම් නායකයා ඒ පිළිතුරු ඉදිරිපත් කළ යුතු වෙනවා.

**මෛත්‍රී** - රචනාවක් යනු කුමක් ද?
**කරුණා** - රචනාවක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?
**මුදිතා** - විවිධ රචනා වර්ග මොනවා ද?
**උපේක්ෂා** - රචනාවක හැඩය හා ආකෘතිය දක්වන්න.

කණ්ඩායම් ක්‍රියාකාරකමෙන් පසුව ඒ ඒ කණ්ඩායම් නායකයින් ඉදිරිපත් කළ පිළිතුරු පත්‍ර පහත දැක්වේ.

## "මෛත්‍රී" කණ්ඩායම

- ☞ අප හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගන්නා භාෂාවෙහි ව්‍යවහාර ප්‍රභේද දෙකක් දැකිය හැකි ය. එනම් ලේඛනය හා කථනය යි.
- ☞ වාක්‍ය රචනය ලේඛන ගණයට ඇතුළත් වේ.
- ☞ කිසියම් මාතෘකාවකට අනුව කරුණු ක්‍රමානුකූල ව ගළපා ඉදිරිපත් කිරීම වාක්‍ය රචනය යි.
- ☞ කරුණු ඉදිරිපත් කිරීමේ දී නිර්මාණාත්මක ව හා අලංකාර සහිත ව ඉදිරිපත් කරන සමහරු රචනය නිබන්ධ නමින් ද හඳුන්වති.

## "කරුණා" කණ්ඩායම

- ☞ මාතෘකාවට අදාළ කරුණු වැඩිපුර සොයා ගැනීම රචනාව සාර්ථක කර ගැනීමට උපකාර වේ.
- ☞ සොයාගත් කරුණු ගුණාත්මක ව හා නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමෙන් රචනාව අලංකාර වේ.
- ☞ අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.
- ☞ පිලි භාවිතය, විරාම ලකුණු යෙදීම, නිවැරදි ව්‍යාකරණය රචනාවේ සාර්ථකත්වයට හේතු වේ.
- ☞ අවශ්‍ය තැන්වල දී ඡේද වෙන් කොට දැක්වීම ද සාර්ථක රචනයක ලක්ෂණයකි.
- ☞ අදහස් නිවැරදි ව හා පැහැදිලි ව ප්‍රකාශ කිරීම ද රචනාවේ සාර්ථකත්වයට හේතු වේ.

## "මුදිතා කණ්ඩායම"

☞ වාක්‍ය රචනා වර්ග කීපයකට බෙදිය හැකි ය. එනම් කථන රචනා, වර්ණනාත්මක රචනා, විවරණ රචනා හා කාල්පනික රචනා වශයෙනි.

☞ ඉතිහාස කථාවක්, චරිත කථාවක් වැනි මාතෘකා ඔස්සේ ලියැවෙන රචනා කථන රචනා වේ.

උදා :- මිහිඳු මහ රහතන් වහන්සේ
මහවැව් ඉදිකළ හෙළ රජවරු

☞ කිසියම් සිද්ධියක් හෝ ගැටලුවක් දෙස විවිධ දෘෂ්ටීන් අනුව බැලිය හැකි ය. එසේ බලා ලියනු ලබන රචනාව වර්ණනාත්මක රචනා නම් වේ.

උදා :- සුන්දර කඳුකරය
හිරු බැස යන මොහොතක මුහුදු වෙරළක දී

☞ යම් ගැටලුවක් කෙරෙහි විමර්ශනාත්මක ව බලා තර්කානුකූල ව කරුණු ගෙනහැර දක්වමින් කෙරෙන රචනා විවරණ රචනා නම් වේ.

උදා :- සැනසුමට මග මැදුම් පිළිවෙත ය.
ලෝක සාමයට මග

☞ නිර්මාණාත්මක ස්වරූපයෙන් ඉදිරිපත් කෙරෙන රචනා කාල්පනික රචනා වේ.

උදා :- අඟහරු ලොවට පා තැබුවෙමි.
මම ගුවන් නියමුවෙක්මි.

## "උපෙක්ෂා කණ්ඩායම"

☞ රචනාවක ප්‍රධාන කොටස් තුනක් දැකිය හැකි ය. එනම්.

1. ආරම්භය
2. ස්කන්ධය
3. අවසානය

☞ ආරම්භය කියවන්නාගේ සිත් ඇද බැඳ තබා ගැනීමටත් ප්‍රබෝධයක් ඇති කිරීමටත් සමත් වීම වැදගත් වේ. රචකයාගේ දක්ෂතාව මත ප්‍රබල ආරම්භයක් ලබාගත හැකි ය.

☞ රචනාවක මැද කොටස අන්තර්ගතය යි. මාතෘකාවට අදාළ කරුණු අනුපිළිවෙළින් ඇතුළත් වන්නේ මේ කොටසට යි.

☞ සමස්ත කරුණු සම්බන්ධ කොට රචනයේ අවසානය සටහන් වේ.

☞ සමස්ත කරුණු සම්පිණ්ඩනය කොට රචනයේ අවසානය සැකසෙයි. විමර්ශනාත්මක රචනයක දී රචකයාට යම් යම් නිගමන ද ඉදිරිපත් කිරීමට සිදුවේ.

☞ රචනාවක් සාර්ථක ව ලිවීමට ඒ පිළිබඳ ව සැකිල්ලක් සකසා ගැනීම ප්‍රයෝජනවත් ය. පහත දැක්වෙන රචනා ආකෘතිය සාර්ථක රචනයක් ලිවීමට ඔබට උදව් වනු ඇත.

| | | |
|---|---|---|
| මාතෘකාව | - | අධ්‍යාපන චාරිකාවක් |

| | | |
|---|---|---|
| සැකිල්ල | | |
| ආරම්භය | - | මූලික යෝජනාව හා සූදානම |
| ස්කන්ධය | - | **1 ඡේදය**<br>ගමනට අවශ්‍ය තොරතුරු කණ්ඩායම් වශයෙන් බෙදී රැස් කිරීම, ගමන් පහසුව, අවසර පත්‍ර ආදිය |
| | - | **2 ඡේදය**<br>ගමනාරම්භය<br>නරඹන ස්ථාන |
| | - | **3 ඡේදය**<br>අපේක්ෂිත ප්‍රතිඵල<br>ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා පිළිවෙළ<br>මුහුණපෑමට සිදු වූ බාධා හා අත්දැකීම් |

සුජාත පණ්ඩිත හාමුදුරුවෝ :- ඉහත සාර්ථක රචනාවක් ලිවීමට උවමනා කරුණු බොහෝ ම හොඳට ගොනු කරලා තිබුණා. කණ්ඩායමේ හැම දෙනා ම උනන්දුවෙන් වැඩ කළ නිසා සියලු දෙනාට ම හොඳ අවබෝධයක් ලැබෙන්න ඇති. දැන් අපි ඒ උගත් කරුණු සැලකිල්ලට ගෙන අභ්‍යාසයේ යෙදෙමු.

## ක්‍රියාකාරකම 9.1

1. පහත දැක්වෙන මාතෘකාවලට රචනා සැකිලි පිළියෙල කරන්න.

    1. මා දුටු පෙරහැරක්
    2. පූජනීය දළදා මැදුර
    3. මා පැවිදි වූ දා
    4. සිංහල උපදේශ කාව්‍ය

2. දී ඇති මාතෘකාවලට ආරම්භක ඡේදය බැගින් ලියන්න.

    1. කළගුණ සලකමු
    2. ජනමාධ්‍ය හා ළමා පරපුර
    3. පරිසර සංරක්ෂණය
    4. 2600 සම්බුද්ධත්ව ජයන්තිය

3. පහත සඳහන් මාතෘකා යටතේ රචනා ලියන්න.

    1. විහාරස්ථානය සමාජසේවා මධ්‍යස්ථානයක් ලෙස
    2. අනගාරික ධර්මපාල තුමා
    3. උත්සාහයෙන් ජය ලැබේ.

### සංකල්පනා

**කණ්ණාඩියත් මිනිස් සිතත් එක සමාන ය.**
**බිඳුනොත් නැවතත් සකස් කළ නොහැකි ය.**

# 10 සාරාංශකරණය

මේ පාඩම ඉගෙනීමෙන් ඔබට,

* සාරාංශය යනු කුමක් ද?
* සාරාංශයක දී අවධානය යොමු විය යුතු ලක්ෂණ.
* සාරාංශයක් ලියන අයුරු.
* සාරාංශකරණය දැන සිටීමේ ප්‍රයෝජන.

යන කරුණු අවබෝධ වනු ඇත.

දිනපතා ම පාඩම් ඉගෙනීම, නව තොරතුරු දැනගැනීම, වෙනත් විවිධ අවශ්‍යතා සහ විනෝදය සඳහා අපි විවිධ පොත්පත් හා සඟරා කියවමු. ගුවන් විදුලියට ද වෙනත් විවිධ දේශනවලට ද සවන් දෙමු. රූපවාහිනී හා අන්තර්ජාලය වැනි දෘශ්‍ය මාධ්‍යයන් ඔස්සේ ද සන්නිවේදනය ලබමු.

මේ කුමන මාර්ගයකින් හෝ අප කියවූ, අසා - දැනගත්, සියලු තොරතුරු ඇසූ - දුටු හෝ කියවූ පරිද්දෙන් ම අප සිත්හි නො රැඳෙයි. බොහෝවිට ඒවායේ තිබූ වැදගත් ම, හරවත් ම හා ප්‍රයෝජනවත් ම තොරතුරු පමණක් අප මතකයේ රැඳෙයි.

විශේෂයෙන් ම බොහෝ ලේඛනවල රසය උද්දීපනය කිරීම සඳහාත්, අර්ථාවබෝධයේ පහසුව පිණිසත්, උපමා - රූපකාදී අලංකාර මෙන් ම පිරුළු - ආප්තෝපදේශ වැනි සාම්ප්‍රදායික යෙදුම් ද භාවිත කරනු ලැබේ. එමෙන් ම ප්‍රකෘති කථන ආදී වෙනත් උපක්‍රම ද බහුල ව භාවිත කරයි. තව ද අදහස් සම්පිණ්ඩනය සඳහාත් වාක්‍ය අතර සම්බන්ධය ගොඩනැගීම සඳහාත් නිපාත ආදී පද වර්ග ද බහුල ව භාවිත කිරීමට සිදුවෙයි.

සාරාංශකරණයේ දී මේ සියල්ල හැකිතාක් බැහැරකොට, අර්ථයට හානියක් නොවන සේ අර්ථය හොඳින් වටහාගෙන, එම අර්ථය - හරය - හෙවත් සාරය පමණක් ඉස්මතු කොට ලියා දැක්වීමට අප වග බලාගත යුතු ය.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

මේ ආකාරයට කිසියම් ලේඛනයක, (ප්‍රබන්ධයක), පරිච්ඡේදයක, ඡේදයක හෝ වාක්‍යයක, නැතහොත් දේශනයක ඇතුළත් වූ හරවත් ම කොටස (හරය) හෙවත් සාරාංශය ලියා දැක්වීම සාරාංශ කරණය යි. මීළඟට අපි සාරාංශයක් ලියා දක්වන්නේ කෙසේ ද' යි විධිමත් අධ්‍යයනයක යෙදෙමු.

## ක්‍රියාකාරකම 10.1

### පුත්‍ර ප්‍රශ්නය

එක් ස්ත්‍රියක් පුතකු වඩා ගෙන, පණ්ඩිතයන් වහන්සේගේ පොකුණට ගොස් ආදි කොට පුතු නාවා, තමාගේ කඩ මත්තේ හිඳුවා, තොමෝ ඉස් සෝදා නහන්නට බට. ඈ නාන්නට බට ඇසිල්ලෙහි යකිනියක් ඇගේ පුතු දැක කනු කැමති ව ගැහැනු වෙසක් ගෙන දරුවන් සමීපයට අවුත් ''යෙහෙළිය මේ දරුවෝ ඉතා හොබනාහ. මූ තොපගේ දරු කෙනෙක් ද''යි විචාර ''එසේයැ මැණියෙනි'' කී කල්හි ''මේ දරුවන් කිරි පොවම් ද'' යි කී කල්හි, මැණියන් විසින් යහපතැ යි කී කල්හී, ඕ දරුවන් වඩා ගෙන මඳක් කිරි පොවාලා වඩා ගෙන පලා ගියා ය. මැණියෝ තමන් ගේ දරුවන් ඇරැ ගෙන යන්නිය දැකැ දිවැ ගෙන ගොස් ''මාගේ පුතු කොයි ගෙන යෙයි ද'' යි අල්ලා ගත. යකිනි කියන්නී ''තී කොයින් ලත් පුතෙක් ද? මූ මාගේ පුතණුවෝ යැ'' යි භයක් නැති වැ කිව. ඔහු දෙන්නා කලහ කෙරෙමින් සාලාව දොර කඩින් යන්නාහ.

මහ බෝසතාණන් වහන්සේ කලහ ශබ්දය අසා දෙන්නා මැ ගෙන්වා ''මේ කුමන ඩබර ද'' යි අසා ඇස් නො මරන බැවින් ද, ඔලිඳට දෙකක් සේ රත් වැ තියෙන බැවින් ද, 'මේ යකින්නකැ' යි දැනැ ''මා කී යුක්තියෙකැ සිටුවු ද'' යි විචාරා ''එසේ යැ සිටුම්'' යි කී කල්හි බිම හිරක් අඳවා හිර මැද දරුවන් හොවා. යකිනිය ලවා දැත් හා මැණියන් ලවා දෙපය හා ගන්වා ''දෙන්නා මැ ඇදැ ගනුව'' යි ඇදැ ගත් එකක් හට යැ පුතණුවෝ'' යි වදාළ සේකැ. දෙන්නා මැ දරුවන් ඇදැ ගත්හ. දරුවෝ දෙදෙනා විසින් අදිනු ලබන්නාහු දුකට පැමිණියහ. මැණියෝ ළය පැළුණු කලක් මෙන් ශෝකයට පැමිණ දරුවන් අත හැරැ අඬමින් සිටියාහ.

බෝසතාණන් වහන්සේ ''දරුවන් කෙරෙහි වැදූවන්ගේ ළය මොළොක් ද? නොහොත් නො වැදූවන්ගේ ළය මොළොක් ද'' යි බොහෝ දෙන විචාළ සේක.

බොහෝ දෙන ''පණ්ඩිතයන් වහන්ස, වැදූවන්ගේ ළය වේ ද, මොළාක් වන්නේ'' යි කීවාහු යැ. ඒ අසා පණ්ඩිතයන් වහන්සේ ''කිමෙක් ද, දූන් දරුවන් වඩා ගෙනැ සිටි තැනැත්තිය ''මෑණියනැ'' යි වැටහේ ද? හැරැ පියා සිටි තැනැත්තිය ''මෑණියනැ'' යි වැටහේ දූ'' යි හැම දෙනා මැ විචාළ සේකැ. හැම දෙන මැ ''දරුවන් හැර සිටි තැනැත්තෝ වේද, පණ්ඩිතයන් වහන්ස මෑණියෝ'' යි කීහ. ''කිමෙක් ද, තෙපි හැම මේ දරු සෙර දනු දූ'යි විචාළ සේක. හැම දෙන මැ ''නො දනුම්හ, පණ්ඩිතයන් වහන්සැ''කී කල්හි ''එම්බා, මෝ යකින්නකැ දරුවන් කන පිණිස ගත''යි වදාළ සේක. ''කෙසේ දත් සේක් ද, පණ්ඩිතයන් වහන්සැ'' යි කීහ. ඇසි පිය නො මරන බැවින් ද, ඇස් දෙක රත් බැවින් ද, ඡායාවක් නැති බැවින් ද කිසි කෙනෙකුන් කෙරෙහි සැකයක් නැති බැවින් ද, දයාවක් නැති බැවින් දූ යි මෙතෙක් කාරණයෙනැ'' යි වදාළ සේකැ.

ඉක්බිති මේ දෙසා වදාරා, ''තෝ කවරෙහි දූ'' යි කියන්න යි විචාළ සේක. ''යකින්නකිමි, ස්වාමිනී'' කිව. ''කුමක් පිණිස මේ කුමරුවා ගත්තෙහි දූ'' යි වදාළ සේක. ''කන පිණිසැ යැ ස්වාමිනී'' කිව. ''නුවණ නැත්තිය, පෙරත් තෝ අකුසල් කොට යකින්න වැ උපන්නෙහි වේ ද, දූන් වනාහි නැවතත් අකුසල් කරනෙහි වී ද? අහා! නුවණ නැත්තිය'' කියා අවවාද කොට ඉක්බිතිව ඈ පන්සිල්හි පිහිටුවා යැවූ සේකැ. කුමරුවාගේ මෑණියෝ ''බොහෝ කලක් ජීවත් වුව මැනව ස්වාමිනී'' යි මහ බෝසතාණන් වහන්සේට ස්තුති කොට පුතණුවන් වඩා ගෙන නැඟ ගියා හ.

උම්මග්ග ජාතකයෙන් උපුටා ගත් පුත්‍ර ප්‍රශ්නය නම් වූ ඉහත කොටස නැවත වරක් හෝ දෙවරක් හොඳින් කියවන්න. අනතුරු ව එම කතාවේ හරය ඔබේ වචනයෙන් ලියා දක්වන්න. ඔබ ලියූ කථා සාරයෙහි මේ ලක්ෂණ ගැබ් වී තිබේදැයි බලන්න.

| සාරාංශයක තිබිය යුතු ලක්ෂණ | |
|---|---|
| | මුඛ්‍යාර්ථය ගැබ්වී තිබීම. |
| | සංක්ෂිප්ත භාවය (කෙටි බව). |
| | අදහස් අතර අන්‍යොන්‍ය සම්බන්ධය. |
| | අවබෝධයට පහසු බව. |

වඩාත් සාර්ථක හා පැහැදිලි, නිවැරදි සාරාංශකරණයක් සඳහා ඉවහල්වන පහත උපදෙස් ද හොඳින් කියවා අවබෝධකර ගන්න.

සාරාංශයක් ලිවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

* උපදෙස් කොටස ද ඇතුළු ව දී ඇති පාඨය කිහිප වතාවක් (දෙවරක් හෝ තෙවරක් වුව ද කම් නැත) කියවන්න.
* නොතේරෙන වචන / යෙදුම් ආදියෙහි අර්ථ අවබෝධ කරගන්න. (ශබ්ද කෝෂ භාවිතය මගින් හෝ අසා දැන ගැනීමෙන්)
* වැදගත් යැයි හැඟෙන අදහස්වලට යටින් ඉරක් ඇඳ සලකුණු කරගන්න.
* අනවශ්‍ය විස්තර - වර්ණනා ආදිය ඉවත් කරන්න.
* ප්‍රකෘති කථනයෙන් ලියා ඇති තැන් විකෘත කථනයෙන් ලියන්න.
* විශේෂණ - උපමා - නිපාත - උදාහරණ ආදිය ඉවත් කරන්න.
* වැදගත් අදහස් ක්‍රමානුකූල ව පැවසෙන ලෙස ගළපන්න.
* සාරාංශය තමන්ගේ ම වචනයෙන් ලියන්න.
* සාරාංශය තනි ඡේදයක් ලෙස ලියන්න.
* පද බෙදීම, විරාම ලක්ෂණ, උක්තාඛ්‍යාත යෝගය ආදී ලක්ෂණ ගැන ද සැලකිලිමත් වන්න.
* වචන සංඛ්‍යාව දී නොතිබුණත් මුල් ඡේදයේ වචන සංඛ්‍යාවෙන් 1/3 ක් වනසේ සාරාංශකොට ලියන්න.

## උදාහරණ 1

**උපමා රූපක ආදී අලංකාර ඉවත්කොට පහත දැක්වෙන ඡේදය වචන 1/3 ක් පමණ වනසේ සාරාංශ කොට නැවත ලියමු.**

මහල්ලාගේ දුගී දුප්පත් නිවසේ කබල් ඇඳ යට දින කීපයක් ම අර රෝදය තිබුණේ ය. ඇතැම්විට ඔහු ඇඳ යටින් එය මැතට ඇද ඕනෑකමින් බැලී ය. අබලන් වූ, අපිරිසිදු රෝදය නිසා මහල්ලාගේ සිතට සැනසුම ලැබිණි. ඒ හැමවිට ම අර ප්‍රීතිමත් දරුවා පිළිබඳ සිතිවිලිවලින් ඔහුගේ හිස පිරිණි........''

## සාරාංශය 1

ඇඳ යටින් රෝදය ගෙන බලන හැමවිට දරුවාගේ මුහුණ ද මතකයට නැගීමෙන් මහල්ලාගේ සිත සැනසිණි.

## ක්‍රියාකාරකම 10.2

පහත දැක්වෙන ඡේදය වචන 1/3 ක් පමණ වනසේ සාරාංශකොට නැවත ලියන්න.

"මුදු මොළොක් නිල් තණින් ගැවසුණු උයන ඉතා සුන්දර විය. නිල් තණ අතර තැනින් තැන පිපී තිබුණ සිත්කලු මල් තරු මෙන් බබළමින් මඳ සුළඟින් එහා මෙහා වැනුණේ ය. පීච් ගස් දෙළසක් එහි වැවී තිබුණේ ය. වසන්ත කාලයේදී ලා රත් පැහැයෙන් යුත් සියුමැලි මලින් විසිතුරු වූ ගස්වල අතු පතරෙහි ලැගුම් ගත් කුරුල්ලෝ කෙතරම් මිහිරි නදින් ගී ගැයුවෝ ද කියතොත් ළමයි තම කෙළි සෙල්ලම් නතරකොට උන්ගේ ගීවලට ඇහුම්කන් දීමට පුරුදුව සිටියෝ ය."

### උදාහරණ 2

**පහත සඳහන් ඡේදයෙහි ඇති විස්තර වර්ණනා ඉවත්කොට වචන සංඛ්‍යාව 1/3 ක් වනසේ සාරාංශ කොට නැවත ලියමු.**

එක් රමණීය උදෑසනක කුරුල්ලන් අතු පතර නාද දෙද්දී පාන්දරින් ම අවදි වූ මහල්ලා රෝදයක් ගෙන නගරයෙන් මඳක් ඈතින් වූ ගම්බද පෙදෙසකට ගියේ ය. එහි ගොස් පැරණි ගසින් හා කටු පඳුරින් යුතු වන ලැහැබක් මැදින් ගමන්කළ ඔහු වරින් වර කැස්සේ ය. ගොරෝසු ගැට සහිත පොත්තෙන් වැසුණු මහා ගස්වල නිහඬ බව ඔහුට තේරුම් ගත නොහැකි විය. ශාන්ත උදයේ පැවති මීදුම ගස් අතරින් පොළොවට ගලා එන්නට විය.

### සාරාංශය 2

රෝදයක් අතැති ව එක් උදෑසනක පිටත්වූ මහල්ලා නගරයට නුදුරෙහි වූ ගම්බද පෙදෙසකට ගොස්, ගසින් හා කටු පඳුරින් සෑදුණු වන ලැහැබකට පිවිසිණි.

## ක්‍රියාකාරකම 10.3

පහත දැක්වෙන ඡේදය වචන සංඛ්‍යාව 1/3 ක් වනසේ සාරාංශ කොට ලියා දක්වන්න.

එක් උදෑසනක අවදි වී ඇඳෙහි වැතිරගෙන සිටි යෝධයාට ඉතා මිහිරි සංගීත නාදයක් ඇසුණේ ය. එය කෙතරම් මිහිරි වීද යත් රජතුමාගේ වාදක කණ්ඩායම උයන අසලින් ගමන් කරමින් සිටිති'යි යෝධයාට සිතිණි. එහෙත් ඒ වූ කලී ඔහුගේ ජනේලය පිට පැත්තේ සිටි කුඩා කුරුල්ලෙකුගේ ගී ගැයුමක් පමණකි. උයනෙහි සිටි කුරුල්ලෙකුගේ ගී හඬ මෙසේ ඔහුට ඇසෙන්නට ලැබුණේ කෙතරම් කලකට පසු ද කියතොත් ඔහුට එය දිව්‍යමය සංගීතයක් ලෙස හැඟී ගියේ ය.

### උදාහරණ 3

**පහත සඳහන් ඡේදයෙහි ඇති ප්‍රකෘති කථනය විකෘත කථනයට හරවා වචන සංඛ්‍යාව 1/3 ක් වනසේ සාරාංශ කොට නැවත ලියමු.**

ප්‍රීති නාද මධ්‍යයෙහි කපට හාමි නැගී සිටියේ ය. ඇත සිටි අය ළං ළං වන්නට පටන් ගත්හ. නිශ්ශබ්දතාව කැඩුණේ ය. කපටහාමි දේශනාවට පටන් ගත.

''යුවතිපතියෙනි, නෑදෑ හිත මිතුරෙනි, මම මහත් පිනැත්තෙක්මි. ඉතිහාසයෙහි ලොකු අකුරෙන් ලියැවෙන්නාවූ මෙබඳු ප්‍රස්තාවකදී යුවති පති දෙදෙනාට ආශීර්වාද කිරීමේ උසස් තනතුරට පත්වූ මම ඇත්තෙන්ම පිනැත්තෙක් නොවෙම්ද? පින කෙසේ වෙතත් මට ඇත්ත නොකියා බැරිය. මේ නම් මට වඩා උගත්, මට වඩා වියත් කෙනෙකුන් විසින් කළ යුත්තකි...''

### සාරාංශය 3

ඉතිහාස ගතවන මෙවන් මඟුලකදී යුවතිපති දෙදෙනාට ආශීර්වාද කරන්නට ලැබීම තමාට මහත් ආඩම්බරයට කරුණක් බව මංගල සභාව අමතා කපටහාමි කීයේ ය.

## ක්‍රියාකාරකම 10.4

පහත දැක්වෙන ඡේදයෙහි වචන සංඛ්‍යාව 1/3 ක් වනසේ සාරාංශ කොට නැවත ලියන්න.

සිකුරු හෝරාව පැමිණියේ ය. නැකත් වේලාව ආසන්න ය. මෙහි දී මනමාලයාගේ මහලු නෑයන් දෙදෙනෙකු අතරේ මහත් විවාදයෙක් ඇති විය. විවාදය ''නැකත් වෙලාවට කුමක් කළ යුතු ද?'' යන්න ගැනයි. ''පුවරුවට නැංවිය යුතුයැ'යි'' එකෙක් කියයි. ''තැලි පලන්දා පිළි ඇන්දිය යුතුයැ යි'' අනෙකා කියයි. මේ දැනුමැත්තන් දෙදෙනාගේ වාදය ඉතා දික්විය. ඉතා තද විය. නැකත් වෙලාව හොඳටම ළංවිය. ''මේ කලින්ම තෝරා බේරා ගෙන ආ යුතු නොවේද? වාද කරන්නට ආවේ මෙතනටද?'' යි මහ මල්හාමි නොසතුටින් කියන්නට විය.

## ක්‍රියාකාරකම 10.5

පහත සඳහන් ඡේදය කියවා එහි ඇති වචන සංඛ්‍යාව 1/3 ක් වනසේ සාරාංශ කොට ලියා දක්වන්න.

ලෙඩ රෝග සුවකර ගැනීමටත් ඒවායින් වැළකී සිටීමටත් වෘක්ෂලතාවල කොටස් ප්‍රයෝජනයට ගැනීමටත් ඈත අතීතයේ සිට මෙරට ජනතාව පුරුදුව සිටිති. බටහිර ආක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් බොහෝ වැදගත් දේ මෙන් ම මේ පුරුද්ද ද ක්‍රමයෙන් අප අතරින් ගිලිහී යන්නට විය. පැළෑටියක මුල්, කොළ, ගෙඩි, මල්, පොතු යන කොටස් පහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී හැඳින්වෙන්නේ පංචාංගය යනුවෙනි. අංග පස හෙවත් කොටස් පහ යනු මෙහි තේරුමයි. දේශීය වෛද්‍ය ක්‍රමයේ හැටියට පැළෑටියක මේ කොටස් පහේ ඇති ගුණ එකිනෙකට වෙනස් වේ. මේ අනුව පැළෑටිවල කොටස් අවශ්‍ය පරිදි ගෙන බේත් සාදා ගැනීම අපේ දේශීය වෛද්‍ය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයකි.

## ක්‍රියාකාරකම 10.6

පහත සඳහන් ඡේදය කියවා එහි ඇති වචන සංඛ්‍යාව 1/3 ක් වනසේ සාරාංශ කොට ලියා දක්වන්න.

විවිධ ජාතීන් වසන විවිධ වූ ප්‍රදේශීය හැඟීම්වලින් පණ පෙවුණු භාරතය වැනි සංකීර්ණ රටක අගමැතිණිය වශයෙන් අපමණ ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වුව ද ඉන්දීය අගමැතිනී ඉන්දිරා ගාන්ධි ඒ කිසිවෙකින් නොසැලුණා ය. ඕ ශ්‍රේෂ්ඨ නායිකාවක වශයෙන් තම කීර්තිය ලොව අස්සක් මුල්ලක් නෑර පතළ කළා ය. ඇගේ ජීවන වෘත්තාන්තය ආදර්ශයට ගතයුතු වීරෝදාර කාන්තාවකගේ ජීවන වෘත්තාන්තයකි. නිහතමානී බව ඇගේ නායකත්වයට ආභරණයක් විය. ළමා වියෙහි සිට ම ඇඳි කදාර් රෙද්ද ඇගේ නිහතමානී බව කියා පෑවා පමණක් නොව සිය රට දේ කෙරෙහි දක්වූ ඇල්ම මැනවින් සංකේතවත් කළේ ය. පරිත්‍යාගශීලී ගුණය ඇගේ ආත්මය හා බැඳී පැවතුණි. ඇය දුගී කුලහීන දරුවන්ට පවා සංග්‍රහ කළේ පුහු නම්බුව පිණිස නොව හුදෙක් හද පිරි මානව දයාවෙන් යුතුව ය. එබඳු නායිකාවක, මාතාවක අහිමි වීම භාරත ජනතාවගේ පමණක් නොව ලෝ වැසි හැම දෙනාගේ ම අභාග්‍යයකි.

### සංකල්පනා

**අනවශ්‍ය දේවල් මිලට ගන්නා තැනැත්තාට ඉක්මනින්ම**
**අත්‍යවශ්‍ය දේවල් විකුණා දැමීමට සිදුවේ.**

# 11 විරාම ලක්ෂණ

මේ පාඩම ඉගෙනීමෙන් ඔබට,

* විරාම ලකුණු යනු මොනවාද?
* විරාම ලකුණු වර්ග.
* ලේඛනයේ දී විරාම ලකුණු මගින් ඉටුවන මෙහෙය.
* විරාම ලකුණු යෙදෙන තැන්,

යන කරුණු අවබෝධ වනු ඇත.

විරාම ලක්ෂණ

| | |
|---|---|
| = | සමාන ලකුණ |
| √‾ | ධාතු සූචකය |
| ෴ | කුණ්ඩලිය |
| ⁁ | කාක පාදය |

## හැදෙන ගස

"භවතු... සබ්බ... මංගලම්... රක්ඛන්තු...
සබ්බ... දෙ... ව... තා........."

කවදත් මේ වෙලාවට පන්සලේ ඉදිරිපස දෙරටුව අබියස තබා ඇති ලොකු ඇඳි පුටුවට බර දී ඇස් දෙක පියාගෙන, පිරිත් සූත්‍රයක් හෝ බුදුගුණ කවියක් මුමුණමින් විවේකී සුවයෙන් ගත කිරීම කුංකුණාවේ පණ්ඩිත හාමුදුරුවන්ගේ සිරිතක්.

දන් වසර කිහිපයක සිට විවේකී සුවයෙන් කල් ගෙවූවත්, උන්වහන්සේ පන්සාළිස් වසක් මුළුල්ලේ දිවයිනේ හතර දිග්භාගයෙහි දූ දරුවන්ගේ නැණස පාදන්නට ගුරුවරයෙකු හා විදුහල්පතිවරයෙකු ලෙස කළ මෙහෙය අද ද බොහෝ දෙනා සිහිපත් කරන්නේ ගෞරවයෙනි. උන්වහන්සේගේ සෙවණේ අකුරු කළ,

හැදුණු - වැඩුණු බොහෝ දෙනා ගුණ - නැණ දෙකෙන් පිරිපුන් මහා උගතුන් වූ බව නොදන්නා කෙනෙකු නැති තරම් ය.

සුපුරුදු ලෙස විහාරගෙයි වතාවත් අවසන් කොට පැමිණි 'රාහුල' පොඩි හාමුදුරුවන් සිවුර සකසා පෙරවාගෙන, පත්කඩය බිම එළා පසග පිහිටුවා, කුංකුණාවේ පණ්ඩිත හාමුදුරුවන්ට වැන්දේ, ගාථාව ශබ්ද නගා කියමිනි.

> ''ඕකාස ද්වාරත්තයේන කතං සබ්බං අපරාධං ඛමථ
> මේ භන්තේ, ඕකාස ඛමාමි භන්තේ''

''ඛමාමායහං'' නෙත් දෙක පියාගෙන ම ලොකු හාමුදුරුවන් රාහුල පොඩි හාමුදුරුවන්ට ආශීර්වාද කළේ කරුණාබර හදවතින්. රාහුල පොඩි හාමුදුරුවන්ගේ දින චර්යාවේ මීළඟ අංගය වූයේ, දිනය තුළදී වනපොත් කළ ගාථා, පිරිත් සූත්‍ර, පාලි නිඝණ්ඩුව, ආදියෙහි නියමිත කොටස් ලොකු හාමුදුරුවන් ඉදිරියේ කටපාඩම් දීම යි.

> ''අසාරේ සාරමතිනො
> සාරේ චාසාරදස්සිනො
> තෙ සාරං නාධිගච්ඡන්ති
> මිච්ඡා සංකප්ප ගෝචරා....''
>
> ''එවං මේ සුතං එතං සමයං භගවා
> රාජගහෙ විහරති කලන්දක නිවාපෙ....''

නිසි තැන්වල විරාම තබමින්, ඝෝෂ - අඝෝෂ අක්ෂර හා අල්ප ප්‍රාණ - මහාප්‍රාණ අක්ෂර නිසි ලෙස හසුරුවමින්, රාහුල පොඩි හාමුදුරුවෝ වනපොත් දෙන ආකාරයට ලොකු හාමුදුරුවන් කන් දුන්නේ දැඩි විමසිල්ලෙනි.

පැවිදි බිමට පත්වූ අලුත එක් වරක් හෝ දෙකක් පමණක් තමා විසින් පාලි වචන නිසි ලෙස උච්චාරණය කරන අයුරු රාහුල පොඩි හාමුදුරුවන්ට කියා දුන් බවත්, එතැන් සිට තම උපදෙස් අනුව ම යමින් ඉතා හොඳින් උන්වහන්සේ එම කාර්යය කරගෙන යන ආකාරයත්, ලොකු හාමුදුරුවන් සිහිකළේ සතුටිනි.

රාහුල පොඩි හාමුදුරුවන්ගේ 'වේලාපත්කඩය' පරීක්ෂා කර බලද්දී, කවද හෝ මහා උගතෙකු වන ග්‍රහ පිහිටීම් එහි ද තිබූ අයුරු කුංකුණාවේ පණ්ඩිත හාමුදුරුවන්ට සිහිවිය. උන්වහන්සේගේ දැහැන බිඳුණේ රාහුල පොඩි හාමුදුරුවන්ගේ කටහඬිනි.

''ලොකු හාමුදුරුවනේ, මට සිංහල පාඩමක් අසා දැනගන්න තියෙනවා......''

''මොකක්ද පාඩම, පොඩිනම?...''

''විරාම ලක්ෂණ!''

''ඇයි, පිරිවෙනේ දී ඒ පාඩම කියා දුන්නේ නැද්ද?''

''කියා දීලා තියෙනවා ලොකු හාමුදුරුවනේ, ඒත් එද මට පිරිවෙනට යන්න බැරිවුණා. අර පිල්ලැවේ ලොකු වෙද මහත්තයාගේ පාංශුකූලෙ යෙදුණ හන්ද....''

''ආ ....... හැබෑමනේ පොඩිනම, මට ඒ බව අමතක වුණා. හොඳයි, මොන විරාම ලක්ෂණ ගැනද දැනගන්න අවශ්‍ය?.......''

''ලොකු හාමුදුරුවනේ,

= - (සමාන ලකුණ)
√‾ - (ධාතු සූචකය)
෴ - (කුණ්ඩලිය)
^ - (කාක පාදය)

යන ඒවා ගැන.

''රාහුල, අප අන් අය සමග කතා කරනවිට, අවශ්‍ය තැන්වල නවත්වමින්, හඬ හසුරුවමින්, අප පවසන අදහස ඒ අයට හොඳින් වැටහෙන ලෙස අදහස් පවසනවා නේද?......''

''එහෙමයි ලොකු හාමුදුරුවනේ, පුදුමය - ශෝකය - භය - ප්‍රශ්නාර්ථය ආදිය වචන හසුරුවන ආකාරයෙන් ම අපට පළකරන්නට පුළුවනි....''

''බොහොම හරි රාහුල, බොහොම හරි. එහෙනම් ලේඛනවලදී අපට මේ දේ කරන්න වෙන්නෙ කොහොමද? යම් යම් සංකේත යොදාගෙන නේද? අන්න ඒ සංකේතවලට තමයි විරාම ලක්ෂණ කියන්නේ.''

''එහෙමයි ලොකු හාමුදුරුවනේ, 1,2,3, පන්තිවලදීත් මම සමහර විරාම ලක්ෂණ ඉගෙනගෙන තියෙනවා. තිත, කොමාව, තනි පෙරළි කොමා, පෙරළි කොමා දෙක, හර්ෂාදී ලක්ෂණය, වරහන් වගේ ඒවා......''

''හොඳයි, හොඳයි, ඒවා මතක නම් රාහුලට මගෙන් දැනගන්න තියෙන්නෙ තව පොඩි දෙයක්නෙ. අපි බලමු සමාන ලකුණ (=) සිංහල ලේඛනයේ කොයි වගේ තැනක ද යෙදෙන්නෙ කියලා. බලන්න මේ උදාහරණ දිහා......''

| | | |
|---|---|---|
| ජයග්‍රහණය කරනුයේ | = | ජයග්‍රාහක. |
| බුදුන් විසින් භාෂිත | = | බුද්ධභාෂිත. |
| සැතින් කරන කම් | = | සැත්කම්. |

''මේ මා උදාහරණයට ගත්තේ සිංහලයේ සමාස පද කිහිපයක් .......''

''දැන් මට වැටහෙනවා ලොකු හාමුදුරුවනේ, සමාන අර්ථයක් පවසන, සමාන බව හඟවන තැනකදී අපට සමාන ලකුණ (=) යොදන්න පුළුවනි නේද?''

''බොහොම හරි, ඒ විතරක් නෙවෙයි පොඩිනම, සන්ධි පද සකස් කරගන්නා තැන්වලදීත් අපට සමාන ලකුණ යොදන්න පුළුවන්, මේ බලන්න.''

| | | |
|---|---|---|
| 1. අ + ඉ | = | එ (සන්ධ්‍යක්ෂරාදේශය) |
| 2. අ + උ | = | ඔ (සන්ධ්‍යක්ෂරාදේශය) |
| 3. සිහිල් + අඟ | = | සිහිලඟ (ආරෝහණය) |
| 4. මුනි + උතුමා | = | මුනිතුමා (ස්වරලෝපය) |
| 5. පො + හොය | = | පෝය (ව්‍යංජනාලෝපය) |

''ලොකු හාමුදුරුවනේ, ගණිතය පාඩම්වලදීත් අපි සමාන ලකුණ (=) බහුල ව භාවිත කරනවා. එතැනදීත් පළකරන්නේ සමාන අර්ථය නේද?''

$$2 \times 2 = 4$$
$$4 + 3 = 7$$
$$10 / 2 = 5$$

''අන්න හරි, හොඳයි දැන් රාහුලට වැටහෙනවානේ ද සමාන ලකුණ (=) ලේඛනයේ දී යෙදෙන්නෙ කවර අර්ථයක් දීම සඳහා ද කියලා?........''

''එහෙමයි ලොකු හාමුදුරුවනේ මට වැටහෙනවා.''

## ක්‍රියාකාරකම 11.1

ඔබ දන්නා සියලු ම විරාම ලක්ෂණ පහත සඳහන් පරිදි වගුවක් සකසා, වගු ගත කරන්න.

| විරාම ලක්ෂණ | හැඳින්වෙන නම | භාවිත කරන අවස්ථාව |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

## ක්‍රියාකාරකම 11.2

පහත සඳහන් ඡේදයෙහි විරාම ලක්ෂණ යොදා නැත. නිසි තැන නිසි විරාම ලක්ෂණ යොදා එම ඡේදය නැවත ලියන්න.

අනේ අනේ හේවාරාළ මේ අපේ සීයාට යුද්ධය වෙන හැටි ටිකක් කියන්නකෝ යනුවෙන් මෙවේලේ එහි පැමිණි අනෙක් සිංහල හේවායෙකුට කොල්ලා කීය

මොනවා කියන්නද පේන්නේ නැද්ද අප පරදින්නයි යන්නේ බැරි උදවියත් බවලත් උදවියත් පුළුවන් හැටියකින් පණ බේරාගෙන යන්න කියන්නයි මා යන්නේ සෙනවිතුමාත් වෙඩි කාගෙන වැටුණා යි හේවායා කියාගෙන ගියේය අනේ ඉතින් අපට මොන දෙවියන්ගේ පිහිටක්ද සෙනවිරත්තුමා නැතිවුනේ අපේ විනාසේ තමා කියමින් මහල්ලා වැළපෙන්නට විය

''ලොකු හාමුදුරුවනේ මට දැන් ගැටලුවක් තියෙන්නේ ධාතු සූචකය (√‾) ගැනයි.''

''රාහුල, 'ධාතු සූචකය' (√‾) යන යෙදුමෙන් ම අපට අදහසක් ලැබෙනවා නේද? මෙය යෙදෙන තැන ගැන, ධාතුවක් කියලා අපි කියන්නේ ක්‍රියා පදයක, නැත්නම් ආඛ්‍යාතයක මූලයටයි. එහෙනම් පහසුවෙන් ම ධාතුව හඳුනාගන්න යොදන සංකේතය යි - ධාතු සූචකය, මේ බලන්න.''

1. නට + ව + යි
√නට
2. බල + යි
√බල

''ආ....... දැන් මට මතක් වුණා ලොකු හාමුදුරුවනේ, ලොකු හාමුදුරුවන්ගේ පොත් රාක්කයක තිබුණ ශබ්ද කෝෂයක් මං දවසක් පෙරළා බැලුවා. ඒකෙත් මේ ධාතු සූචක ලකුණ (√‾) යොද තිබුණා, සමහර තැන්වල. දැනුයි මට වැටහෙන්නේ ඒ ක්‍රියා මූලය (ධාතුව) උපුටා දක්වන්න යොදන සංකේතයක් කියලා.

''ඔව්, ඔව්, ඒ විතරක් නෙවෙයි රාහුල, අපේ පැරණි පොත් - පත් බොහොමයක ක්‍රියාපදයක ධාතුව හඟවන තැන්වලදී ධාතු සූචක ලකුණ (√‾) යොදා තිබෙන බව මතක තියාගන්න.''

''හොඳමයි ලොකු හාමුදුරුවනේ, එතකොට ගණිත පාඩම්වලදී අපි ඉගෙන ගන්න වර්ගමූල ලකුණත් (√‾) මේ හා සමාන අර්ථයකින් නේද යෙදෙන්නෙ?



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | |
|---|---|---|
| 1. | $\sqrt{25}$ | = 5 |
| 2. | $\sqrt{81}$ | = 9 |

"ඔව් පොඩිනම, මෙතැනදී කියන්නෙත් මූලය ගැන තමයි, රාහුලට ඒක මතක් වුණ එක කොච්චර අගෙයි ද?"

"දැන් ලොකු හාමුදුරුවනේ මට මෙන්න මේ නයෙක් වාගේ සළකුණ (෴) ගැන, ඒ කියන්නෙ 'කුණ්ඩලිය' ගැනයි දැනගන්න අවශ්‍යය, ඒ ලකුණ මම පිරිත් පොතේ නම් නිතර දැකලා තියෙනවා...."

"ඔව් රාහුල කිව්වා වාගේ ම 'කුණ්ඩලි' කියන්නෙ 'නාග' කියන පදයට පර්යාය (සමාන) පදයක්, පිරිත් පොතෙත් එය නිතර යෙදී තියෙනවා තමයි. ඒත් රාහුල හොඳින් බැලුවාද පිරිත් පොතේ කොයිවගේ තැන්වලද කුණ්ඩලිය (෴) යෙදිලා තියෙන්නේ කියලා...?"

"එහෙමයි ලොකු හාමුදුරුවනේ, මට හිතෙන්නෙ නම් වාක්‍යයක අවසානය හඟවන්න එය යෙදෙනවා කියලා...."

"බොහොම හොඳයි රාහුල, වාක්‍යයක අවසානය හඟවන්න අද අපි තිත ( . ) භාවිත කළාට පැරණි සිංහල ලේඛනවල ඒ වෙනුවට යොදා තිබෙන්නේ කුණ්ඩලිය (෴). ගේන්න රාහුල ඔය පුරාණ සද්ධර්ම රත්නාවලිය පොත, මගේ පොත් රාක්කයෙන්,

"ඒ සිටුපුත් තෙමේ බරණැස අසූ කෙළක් වස්තු ඇති සිටු කුලයක උපන ෴

"හොඳයි රාහුල අතට අරන් බලන්න මේ පොතේ කුණ්ඩලිය (෴) ලකුණ යෙදුණු වෙනත් තැන්."

"එහෙමයි ලොකු හාමුදුරුවනේ, මේ තියෙන්නේ මෙතැන කුණ්ඩලිය (෴) ලකුණු දෙකක් යෙදිලා. ඒකෙන් හඟවන්නේ පරිච්ඡේදයක අවසානයද?....."



නොමිලේ බෙදා හැරීම පිණිසයි

''බොහොම හරි රාහුල, බොහොම හරි, කුණ්ඩලි දෙකක් යෙදෙන්නෙ පරිච්ඡේදයක අවසානය දක්වන්න තමයි, හොඳයි පොතේ අවසාන පිටුව පෙරළන්න, බලන්න එතැන කුණ්ඩලිය (෴) ලකුණු කීයක් යෙදී තිබෙනවාද කියලා.''

''ලොකු හාමුදුරුවනේ මෙතැන කුණ්ඩලිය ලකුණු තුනක් යෙදිලා තියෙනවානෙ! මෙතැනින් පොතත් අවසන්, ඒ කියන්නෙ ග්‍රන්ථාවසානය දක්වන්නයි කුණ්ඩලිය ලකුණු තුනක් යෙදෙන්නෙ!....''

''රාහුල හරියට ම කීවා, බොහොම අගෙයි!... දැන් තව මොනව ගැන ද දැනගන්න තියෙනවා කීවෙ....?''

''ලොකු හාමුදුරුවනේ ^ (කාක පාදය) ගැනයි........ ඔබ වහන්සේ කලින් දිනයක මට ඒ ගැන කියා දී තිබෙනවා. දිනක් මම හදිසියට පිටපත් ලිවීමක් ලිව්වා. ඒකෙදී මා අතින් මග හැරුණු අකුරු, පද, වාක්‍යාංශ, කීපයක් තිබිලා ඔබ වහන්සේ එය නිවැරදි කර, මට කියා දුන්නා. මග හැරුණු අකුරු, පද, වාක්‍යාංශ, විතරක් නෙවෙයි වාක්‍ය පවා නැවත එම ලේඛනයට ඇතුළත් කරන විට. අදාළ තැන කාක පාදය (^) යොදලා එය නැවත ලියන හැටි. මේ තියෙන්නේ ඒ අඩුපාඩු සකස් කළ පිටුව.......''

  ඹ<br>
''ද^දිව සොළී රටට නුදුරු වූ බරණැස් නුවර සමීපයෙහි එක් පාංශු<br>
        විනිවිද<br>
පර්වතයක්^යන්නාවූ මහ මාවතෙක් විය. ඒ පාංශු පර්වත මධ්‍යයෙහි<br>
                තමාගේ පියවූ ඇස් අන්ධ<br>
එක්තරා ව්‍යාඝ්‍රයෙක් ^ ව්‍යාඝ්‍රයෙකු පර්වත ගුහාවෙක තබාගෙන කන<br>
බොන ද ගෙනවුත් ලමින් පෝෂණය කොට වාසය කෙරෙයි.......''

''ඔව්, ඔව්, මටත් මතකයි, රාහුලගෙ ලියන පොත්වල ඉන් පස්සෙ ඒ වගේ අඩුපාඩු තිබුණෙත් නැති තරම්. පෙන්වා දෙන අඩුපාඩුව, වැරැද්ද සකස් කරගෙන යහපත් ගුණවත් ශිෂ්‍යයෙකු ලෙස හැදෙන්නට උත්සාහ කරන එක මම රාහුලගෙ දැක්ක හොඳ ගුණයක්...... ඒ විතරක් නෙවෙයි, ඉගෙන

ගන්න ශිෂ්‍යයන් හැටියට, කලින් උගත් දේවල් මතක තබා ගැනීමත් වැදගත්. එයින් අපට ඉගෙනීම පහසු වෙනවා. ඒ වගේම නොදන්නා තැන්, ගැටලු තැන්, සැක තැන්, නොවැටහෙන තැන්, සුදුසු කෙනෙකුගෙන් අසා දැනගන්න එක ලජ්ජාවට කරුණක් නෙවෙයි. ඒක උගත්කමේ ලක්ෂණයක්. මට රාහුල ගැන ආඩම්බරයි. දැං මං හිතන්නේ රාහුලට 'විරාම ලක්ෂණ' ගැන නම් මොනවත් ම ගැටලු නැතිව ඇති........''

සිනහමුසු මුහුණින් ලොකු හාමුදුරුවන් පවසන විට,

''එහෙමයි ලොකු හාමුදුරුවනේ, හැමදමත් මට අවවාද දෙන, යහමග කියාදෙන ඔබ වහන්සේට දීර්ඝායුෂ ලැබෙන්න ඕනෑ......''යි පවසමින්, ලොකු හාමුදුරුවන්ගේ දෙපා ළඟ වැඳ වැටුණේ අපිරිමිත සෙනෙහසකින් වගේම ගෞරවයෙන්.''

## ක්‍රියාකාරකම 11.3

නැවතීමේ ලකුණ වෙනුවට කුණ්ඩලිය ද අනෙකුත් සුදුසු විරාම ලක්ෂණ ද යොදා මේ ඡේදය නැවත ලියන්න.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දන් මාගේ බලයෙක් නොවෙයි පුරාතනයෙහි වටුව උපන් කල මාගේ සත්‍යක්‍රියා බලයෙකැයි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදරා චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක චතුස්සත්‍යයාගේ කෙළවර සමහර කෙනෙකුන් වහන්සේ සකෘදගාමී වූ සේක සමහර කෙනෙකුන් වහන්සේ අනාගාමී වූ සේක සමහර කෙනෙකුන් වහන්සේ රහත්වූ සේක බුදුරජාණන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ වට්ටක ජාතකය නිමවා වදාළ සේක එසමයෙහි දෙමව්පියෝ නම් දන් මේ දෙමව්පියෝ ම ය. එසමයෙහි වටු රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

-වට්ටක ජාතකය-

## ක්‍රියාකාරකම 11.4

සමාන ලකුණ හා ධාතු සූචකය සුදුසු තැන්වල යොද, නැවත ලියන්න.

| | | |
|---|---|---|
| 1. සයන + උපකරණ | = | සයනෝපකරණ |
| 2. චන්ද්‍ර + ආලෝකයෙන් | = | |
| 3. මිහියෙන් නැගෙන දුම් | = | |
| 4. වනයෙහි මල් | = | |
| 5. කිරෙන් පිසූ බත් | = | |
| 6. සොරුන්ගෙන් වනබිය | = | |
| 7. බඳ + එ + යි | = | √බඳ |
| 8. බල + හි | = | |
| 9. කට + ව + මි | = | |
| 10. කර + මින් | = | |
| 11. වජඹ + ඒ + වා | = | |
| 12. බස් + ව + යි | = | |

### සංකල්පනා

**වැරදි හැඟීම් පාලනය කිරීමට ඔබ අපොහොසත් වුවහොත් ඔබේ ජීවිතයෙන් ම ඊට වන්දි ගෙවීමට සිදුවනු ඇත.**

# 12 පද බෙදීම

පැහැදිලි හා නිවැරදි අදහස් සන්නිවේදනයට මග පෑදෙන්නේ නිසිතැන - නිසි ලෙස, සම්මත රීතීන්ට අනුකූල ව පද බෙදා බස හැසිරවීමෙනි. මේ පාඩම ඉගෙනීමෙන් ඔබට ලේඛන ව්‍යවහාරයේ පද බෙදීම සම්බන්ධ ව පවතින සම්මත රීති කිහිපයක් අවබෝධ කර ගැනුමට හැකිවනු ඇත.

## පලාලි ගමන

''බ්රෑම්........... ම්.......... බ්රෑම්...... බ්රෑම්...... ම්...... ම්.....!
''පීප්.......... පීප්........ පීප්.........!''

මහ හඬ නංවමින් පැමිණි පුංචි සිරිමල්ගේ වාහනය කළු මැණිකා නැන්දාගේ දොරකඩ නතර විය.

''කළු නැන්දේ......, කළු නැන්දේ......!''
''ඇයි සිරිමල් පුතේ.......?''

කුස්සියේ දර ලිප මත තිබුණු බත් මුට්ටිය ඇර බලමින් ම කළුමැණිකා ඇසුවා ය.

''අම්මා කිව්වා, පලාලි යන්න ලෑස්ති වෙලා ඉන්නේ කියලා, නැන්දාටත් පුළුවන් ඉක්මනින් අපේ ගෙදරට එන්න කියලා........''

''මොනවා ! මේ හදිස්සියෙ? කාරණේ මොකක්ද කියලා කිව්වේ නැද්ද පුතේ....?

''නෑ නැන්දේ, අපි කට්ටිය වෙල් ඉපනැල්ලේ සෙල්ලම් කර කර හිටියේ, අම්මා තමයි මට කතා කරලා ඔය පණිවිඩය නැන්දාට කියන්න කීවෙ..... ඕං මං ගියා..... බ්රෑම්..... බ්රෑම්..... ම්..... ම්..... පී..... පී..... පී.....''

පුංචි සිරිමල් පැමිණි වේගයෙන්ම නැවතත් වෙල් ඉපනැල්ල දෙසට ඉගිළ ගියේ ය.

''අම්මේ, මොකද දන්නෙ නෑ මේ හදිස්සියෙම පලාලි යන්න එන්න කියලා ලොකු නැන්දා අම්මට පණිවිඩ එවලා තියෙන්නෙ, මොකක් නමුත් ලොකු කරදරයක් වගේ.....! අම්මා ඉක්මනට ලෑස්තිවෙලා යන්න, මම මේ වැඩ අහවර කරන්නම්'යි කියමින් කළුමැණිකාගේ ලොකු දුව කුස්සියට ඇතුළු වූවාය.

''අනේ! ඒක නේන්නම් දුවේ, ලොකු නැන්දගෙ මද්දුම පුතා, සෝමරත්නත් ඔය පලාලි පැත්තෙ යුද්ධ කඳවුරක නේද පහුගිය දවස්වල හිටියෙ? යුද්ධෙත් ඇවිලිලා යන මේ වෙලාවෙ පුතාටවත් මොකක්වත් කරදරයක් වත්ද, අනේ එහෙම විපතක් නම් වෙන්න එපා ! මද්දු පුතාට දළදා හාමුදුරුවන්ගෙ රැකවරණයි.....! තිස්තුන් කෝටියක් දෙවි දේවතාවුන්නාන්සේලාගේ පිහිට යි ! ආරස්සාවයි !''

කළුමැණිකා එසේ කියමින් ම ලකලෑස්තිවී ගෙයි කඩුල්ල පැන අඩියට දෙකට පුංචි සිරිමල්ගේ ගේ දෙසට ගියා ය.

''ලොකු අක්කේ, ලොකු අක්කේ,..... කෝ මේ ගෙදර ඇත්තෝ? ඕං මං නම් විනාඩියට ලෑස්තිවෙලා ආවා. හැබෑවටම මොකක්ද සිද්ධවෙලා තියෙන්නෙ කිව්වානම්..........? ''

මෙසේ කියමින් ගෙට ඇතුළුවන කළුමැණිකා දෙස බලා,

''මොකද කළු නංගියෙ මේ? බැහැරක ගිහින් එන ගමන් ද? යි සිරිමල්ගේ මව ඇසුවේ විස්මයෙනි.

''ඇයි ලොකු අක්කෙ? දූන් අක්කම නේද මට පලාලි යන්න ලෑස්තිවෙලා එන්න කීවෙ? '' කළුමැණිකා ඇසුවා ය.

''පලාලි යන්න? මට පේන්නේ කළු නංගිට පොඩි පටලැවිල්ලක් වෙලා වගේ.....! ''

''පටලැවිල්ලක්.....? ''

''ඔව්, ඇයි නංගියෙ? ගිය සුමානෙ උඩ ලියැද්දෙ ගොයම් කපන වෙලාවෙ මං කිව්වා මතක නැද්ද? නුග පිටියෙ වැඩිහිටි නිවාසෙට දානයක් බාර ගත්තා කියලා, මං මේ දානෙ ලෑස්ති කරන ගමන්.....! ''

''ඔව්..... ඔව්..... කිව්වා නේන්නම්, ඉතින් ඒකෙයි මේකෙයි තියෙන සම්බන්ධෙ මොකක්ද ලොකු අක්කෙ.....?''

''කළු නංගි ඉතින්, පලා ජාති ලියන්න කවදත් හපනා හින්දා මං මේ පලා ටික ලෑස්ති කරලා, ඒ ටික ලියවගන්නයි නංගිට සිරිමල් පුතා අතේ පණිවිඩ ඇරියෙ...... හතිකට එන්න කියලා, දානේ ලෑස්ති කරන්න පමා වෙන හින්දා.....

''අනේ ඇත්තට.........? මේ සිරිමල් පුතා 'පලාලි යන්න' එන්නයි කියලා කියාපු හදිසියත්, විලාසයත් හින්දා මට තේරුණේ වෙනත් විදියකටනේ අක්කෙ'යි කළුමැණිකා මදක් ලැජ්ජාවෙන් පවසද්දී, සිරිමල්ගේ මව මුවගට නැගුණු සිනාව යටපත් කරගත්තේ බොහෝ අසීරුවෙනි.......

★ ★ ★ ★ ★ ★

අදහසක් වැරදි ලෙස සන්නිවේදනය වීමෙන් අපට අත් විඳීමට සිදුවන දුෂ්කරතා බොහෝ ය. යට කියන ලද කථාවෙන් පළකෙරෙන අත්දැකීම ද එබන්දකි.

භාෂණයේ දී වේවා, ලේඛනයේ දී වේවා, නිසිතැන, නිසි ලෙස පද බෙදා, විරාම තබමින් භාෂාව පරිහරණය නොකළහොත් සන්නිවේදනය වන්නේ වැරදි අදහසකි.

නමුත්, කථනයේ දී ඇතිවිය හැකි දුරවබෝධයන් මග හරවා ගැනීම එතරම් අපහසු නොවුණත්, ලේඛනයේ දී වැරදි අදහස් සන්නිවේදනය වීම නිසා අපේක්ෂිත අරමුණු ඉටු නොවනවාසේ ම ගැටලුකාරී තත්ත්වයන් ද පැන නැගිය හැකි ය.

පහත නිදසුන බලන්න :-

**ජාති යට ඇස් කණ් ණාඩි සප යන්නෝ,**
**තාර කා දෘෂ්ටි විශේෂඥයෝ.**

මෙම දැන්වීමෙන් පළ කෙරෙන අදහස ව්‍යාකූලය. ඊට හේතුව වැරදි පද බෙදීමයි. මෙම දැන්වීම ම නිවැරදි ලෙස පද බෙදා ලියා දැක්වුවහොත් ඉන් පළ කෙරෙන අදහස නිරවුල් ය. පැහැදිලි ය. පහත නිදසුන බලන්න.

**ජාතියට ඇස්කණ්ණාඩි සපයන්නෝ,**
**තාරකා දෘෂ්ටි විශේෂඥයෝ**

මෙලෙස ලේඛනයේ දී නිවැරදි අදහස් සන්නිවේදනය සඳහා ඉවහල් වන කරුණු රැසකි.

- ★ නිවැරදි අක්ෂර වින්‍යාසය
- ★ නිවැරදි විරාම ලක්ෂණ භාවිතය
- ★ නිවැරදි පද බෙදීම

යන කරුණු ඉන් ප්‍රධාන වේ.

මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ පද බෙදීම කෙරෙහි ය. නිවැරදි පද බෙදීමක් සඳහා අනුගමනය කළ යුතු නියමයන් කිහිපයක් මතු දැක්වේ. ඒවා හොඳින් ඉගෙන, ලේඛනයේ දී භාවිත කිරීමෙන් ඔබටත් නිවැරදි අදහස් සන්නිවේදනය වඩාත් පහසු වනු ඇත.

**1. නාමපද, ක්‍රියාපද, නිපාත පද, වෙන්කොට ලියනු ලැබේ.**

උදා :- මේ මහලු මිනිසා දරුවකු ව සිටිය දී ගත කළේ ඉතා දුක්ඛිත ජීවිතයකි.

| නාමපද | ක්‍රියාපද | නිපාත පද |
|---|---|---|
| මහලු මිනිසා | ගත කළේ | ව |
| දරුවකු | සිටිය | දී |

**2. උපසර්ග පද වෙන් නො කෙරේ.**

උදා :- අනුනායක හිමියෝ අවමඟුලට සහභාගී වූහ.

<u>**උපසර්ග**</u>

අනුනායක
අවමඟුලට

**3. සන්ධි පද තනි පදයක් ලෙස එක්කොට ලියනු ලැබේ.**

උදා :- අත්තම් නිවාස පේළියේ කෙළවරෙහි ම තිබුණේ කම්මලකි.

<u>**සන්ධි පද**</u>

අත් + කම් = අත්තම්
කම් + හල = කම්මල

**4. සමාස වූ පද එක් පදයක් ලෙස ලියනු ලැබේ.**

උදා :- ''පරසතු මලින් පුද
ලද මුනි සඳුට දියනඳ
වනපස මලින් පුද
කළැයි පවසනු කවර වරදද?''

<u>**සමාස පද**</u>

දියනඳ
වනපස

**5. විභක්ති ප්‍රත්‍යය මුල් පදය හා එක්කොට ම ලියනු ලැබේ.**

උදා :- වට වැස්සෙන් වැව් උතුරා ගියේ ය.
බල්ලන්ගෙන් ප්‍රවේශම් වන්න.!
දුප්පතුන්ගේ දුක දකින්නෝ කවරහු ද?

<u>විභක්ති පද</u>

බල්ලන්ගෙන්
වැස්සෙන්
දුප්පතුන්ගේ

6. **ගෞරවාර්ථය දීම සඳහා යෙදෙන වහන්සේ, සේක, දෑ ආදී පද වෙන්කොට ලිවිය යුතු ය.**
   උදා :- තෙරුන් වහන්සේ පිඬු සිඟා වැඩි <u>සේක</u>.
   පියාණන් දෑ පුතුට ඔවදන් දුන් <u>දෑ</u> ය.

## ක්‍රියාකාරකම 12.1

පහත දැක්වෙන වැකි නිසි ලෙස පද බෙදා නැවත ලියන්න.

1. මහා ශබ්ද යක් නං වමින් බෝම් බය පුපු රා ගියේය.
2. පොලිස්නිල ධාරීහු සොරා අල්ලා ගෙන අධිකර ණයට ඉදිරි පත්කළහ.
3. බැහැයි කිව්වනම් මං ගේය තුල්ලල යන වනේද?
4. අන්ද රේකැටුව දිනක් රජජුරුවෝ මා වැලිගඟ බඩ ඇවි දීමට ගියෝය.
5. මෙක්සි කෝව ඇමෙරි කා එක් සත් ජන පද යටද කුණින් පිහි ටිර ටකි.

## ක්‍රියාකාරකම 12.2

වැරදි ලෙස පද බෙදා කීමෙන් හෝ ලිවීමෙන් මුහුණ දීමට සිදුවු තත්ත්වයන් පිළිබඳ අත්දැකීම් ඔබටත් තිබෙන්නට පුළුවන. ඒවා පන්තියේ අන් අය සමග සාකච්ඡා කරන්න.

## ක්‍රියාකාරකම 12.3

පහත දැක්වෙන ඡේදය පද වෙන්කොට නැවත ලියන්න.

ඒසිටුපුත්තෙමේබරණැසඅසූකෙළක්වස්තුඇතිසිටුකුලයකඋපන.උන්ගේ දෙමවුපියෝඅපගේසම්පතමහත.අපගේපුතණුවන්කැමතිපමණකටඇත.

සෙස්සහැයිදූ’යිවිද්දත්කුලයකඋපන්නාසේගීනැටීම්පමණක්ඉගැන්වූහ. එමනුවරඅසූකෙළක්වස්තුඇතිකුලයකදුවණිකෙනෙකුන්උපන්නාහ.උන්ගේදෙමවුපියෝත්අරමුන්ගේ දෙමවුපියන්සිතූලෙසටමසිතාඋනුත්ගීනැටීම්පමණක් ඉගැන්වූහ.වැඩිවියපැමිණියවුන් ඔවුනොවුන්ටමනිලකළහ.

## සංකල්පනා

**මුහුණ දෙන සෑම දෙයක් ම වෙනස් කළ හැකි ය. එහෙත් මුහුණ දෙනතුරු කිසිවක් වෙනස් කළ නොහැකි ය.**

# 13 අර්ථාවබෝධය

අපි බොහෝ දේ කියවමු. සමහර කියවන දෑ පහසුවෙන් තේරුම් ගත හැකි වුවත් ඇතැම් දේ කියවා තේරුම් ගැනීම අපහසු ය. එසේ වීමට හේතු තිබේ. මෙම පාඩම කියවීමේ දී දුරවබෝධ තැන් මග හරවා අර්ථාවබෝධය ලැබීමේ මග ඔබට අවබෝධ කරගත හැක.

අප භාෂාව යොදා ගන්නේ අපගේ අදහස් හා හැඟීම් අන් අයට ප්‍රකාශ කිරීමට යි. ලේඛනය ඒ සඳහා භාවිත කෙරෙන එක් ක්‍රමයකි. ලේඛනගත යමක් කියවීමෙන් ලේඛකයාගේ අදහස් හා හැඟීම් අප සතු කරගත හැකි ය. ලේඛනයක් කියවා තේරුම් ගැනීමට ඇති හැකියාව **අර්ථාවබෝධය** යි.

ඇතැම් සාහිත්‍ය නිර්මාණ කියවා තේරුම් ගැනීම පහසු වුවත් සමහර නිර්මාණ තේරුම් ගැනීම පහසු නැත.

මේ පාඨය කියවා තේරුම් ගැනීමට උත්සාහ කරන්න.

"භික්ෂූන් වහන්සේ පය උරේලා, උරේ උරේලා, වැඩිසේක."

මෙය රසවත් යෙදුමකි. යමෙකුට මෙය තේරුම් ගැනීමට අපහසු වන්නේ නම් ඒ භාෂාවේ වචනවල විවිධාර්ථ පිළිබඳ අවබෝධය අඩු නිසයි.

පය - පාත්‍රය

උර[1] - උරය

උර[2] - කර

මේ පද තේරුම් ගත්විට යථෝක්ත වගන්තියේ අදහස මෙසේ අවබෝධ කරගත හැක.

"ස්වාමීන් වහන්සේ පාත්‍රය උරයේ දමා උරය කරේ දාගෙන වැඩිසේක."

ගස වතු සුදු - වී පිරිසිදු
පොහොය නැතිදු - සිල් ගත් බඳු

මේ පද්‍යයෙන් කියැවෙන්නේ කුමක් දැයි ඔබට තේරුම් ගත හැකිදැ'යි බලන්න. කවියාගේ අදහස වතු සුද්ද ගහ මල්වලින් පිරී ඇති බව පැවසීමයි. ඒ පිළිබඳ ව සඳහනක් කවියේ නැත. ඔහු තම අදහස ප්‍රකාශ කරන්නේ උපමාවක් යොදාගෙන ව්‍යංගාර්ථයෙනි. ''පොහොය නැතත් අද වතු සුද්ද ගහ සිල් ගත්තා වැනි ය.'' සිල් සමාදන් වන්නේ පොහොයට යි. එදිනට සුදු පැහැති වස්ත්‍රයෙන් සැරසීම සිරිත යි. සුදු පැහැති මලින් වැසී ගිය වතුසුද්ද ගස සිල් ගත් බඳු ය.

ගද්‍ය හෝ පද්‍ය පාඨයක අර්ථාවබෝධයට පහත දක්වෙන උපදෙස් ඔබට උපකාරී වනු නිසැක යි.

- ✯ සම්පූර්ණ පාඨය ම හොඳින් කියවා මූලික අදහස තේරුම් ගන්න.
- ✯ එක් වරක් කියවා තේරුම් ගත නොහැකි නම් සැලකිල්ලෙන් යුතුව දෙතුන් වරක් කියවන්න.
- ✯ මූලික අදහසට පරිබාහිර වෙනත් අදහසක් ඇත්නම් ඒවා තේරුම් ගැනීමට උත්සාහ කරන්න.
- ✯ පාඨයෙහි එන දුරවබෝධ වචන, අලංකාරෝක්ති ආදිය හඳුනා ගන්න.

## ක්‍රියාකාරම 13.1

### ඉල්මස උදුරයි අලබතලා

අල වගාවෙහි දී මෙන් ම අල ඉදිරීමේ දී ද ගොවීන් ප්‍රත්‍යක්ෂ අවබෝධයෙන් යුතු ව නිශ්චිත කාලසීමාවන් හඳුනාගෙන අල සිටුවීමත්, ගැලවීමත් සිදු කොට ඇත. නිසි කල අල නොගැල වූ විට එම අලවලින් අංකුර මතු වී අල පස් බවට පත් වේ. සිට වූ අල වර්ග පමණක් නොව කටු අල ස්වාභාවික ව වනයේ වැවුණු අල වර්ග ද නිසි කල්හි උදුරා ගැනීමට උත්සුක වූයේ මේ නිසා ය.

ඇතුගල්පුර ප්‍රදේශයේ ගැමියන් ගේ විශ්වාසය අනුව අවිච්චියාගේ පැමිණීම අල ගලවන සමය පිළිබඳ පෙර නිමිත්තකි. ඇතැම් විට මෙම කාල සීමාව ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය හැකි ය. ඒ දේශගුණික කාලගුණික හා පස පිළිබඳ යම් යම් සාධක නිසා විය හැකිය. බින්තැන්න. වැසියන් ගෝනල වැල් අල බහින සමය වශයෙන් හඳුන්වන්නේ නවම් මාසය යි. 'නමා මහේ ගෝනල වැලක අල නව පොල්ලයි' යන කවි පදයෙන් ඒ බැව් ප්‍රකට වේ. පහත සඳහන්


නොමිලේ බෙදා හැරීම පිණිසයි

කවියෙන් කිය වෙන්නේ ඉල් මාසයේ දී අල බතල උදුරන බව යි. මෙම ජනකවිය අනුව අල ඉදිරිය යුතු වන්නේ ඉල් මාසයේ දී ය.

ඉල් මස වෙන කොට ගොයම වැවෙන්නේ
පිල් දෙස බැලූ කළ යම් නො සිතන්නේ
සිව් මස පිරි නැත මේ ලෙස වන්නේ
කිව් බස බොරු නැත මින් දැන ගන්නේ

දෑසා නැත නින්ද අලි ඇතු පන්නාලා
පාසා නැත ඉන්න පැල තුල ගිණි තැපලා
මාසා ඉල් මසේ උදුරයි අල බතලා
ආසා නැත කන්න මෙ කලත් අල බතලා

-මහ කැලේ යාම-

1. මෙහි දැක්වෙන පරිදි ගොවියා අල ගලවන සමය තීරණය කළේ කුමන සාධක මත ද?

2. නිසි කලදි අල ගැලවිය යුත්තේ ඇයි?

3. ප්‍රදේශයෙන් ප්‍රදේශයට අල ගැලවීමේ කාල වකවානු වෙනස් වන්නේ කවර හේතු නිසා ද?

4. ''ආසා නැත කන්න මෙකලත් අල බතලා'' ගොවියා තුළ මෙවැන් හැඟීමක් ඇති වූයේ කුමන හේතු නිසා ද?

5. පහත සඳහන් වචන යොදා අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.

ප්‍රත්‍යක්ෂ / නිශ්චිත / ස්වාභාවික / උත්සුක / සමය

## ක්‍රියාකාරම 13.2

නොකියා සිය හිමි ට
නැතිව ද උතුරු සළුප ට
ගමන් ඉක්මන් කො ට
නොයන් නුඹ වසන ගෙන් පිටත ට

නොකරතොත් වියද ම්
කරතොත් ඉතා වියද ම්
කියමින් ඇති පද ම්
රහස දන්වන් හිමිට කැර පෙ ම්

තමා හිමි සිතු ලෙ ස
දුටුවොත් වෙනත සෙනෙහ ස
නුවන් කඳුලෙන් මි ස
යළිත් නොකියන් බසින් පිළිවි ස

හිමි වුව ද උර ණා
නොකියා තෙපුල් දරු ණා
වඩව සිත කරු ණා
වැළිත් නොසිත ව දෙතැන සර ණා

-කාව්‍යශේඛරය-

1. මෙම පද්‍යවල අදහස දක්වන්න.

2. මෙහි ඇතුළත් උපදෙස් කොතරම් දුරට අදට ගැළපේ ද යි විමසන්න.

3. උරණ, තෙපුල්, පිළිවිසීම, මේවාට සමානාර්ථ පද ලියන්න.

4. මෙම කවි කෙබඳු අවස්ථාවක ප්‍රකාශ කරන ලද්දේ ද’ යි විමසා බලන්න.

5. උපදේශාත්මක පද්‍ය කීපයක් නිර්මාණය කරන්න.

## සංකල්පනා

**ඉක්මන් ගමනක් යාමට පරණ පාරෙන් ම යන්න.**

# 14 ප්‍රදේශීය භාෂා

මෙම පාඩම ඉගෙනීමෙන්,

* පොදු ජන වහරෙහි හා ප්‍රදේශීය භාෂා ව්‍යවහාරයෙහි වෙනස,
* ප්‍රදේශීය භාෂාව ව්‍යවහාර වන ප්‍රදේශ.
* ප්‍රදේශීය භාෂා ව්‍යවහාරයන්හි රසවත් බව හා හරවත් බව.
* ප්‍රදේශීය භාෂා ව්‍යවහාරය අදහස් සන්නිවේදනයට බාධාවක් නොවන බව,

යන කරුණු ඔබට අවබෝධ වනු ඇත.

## බසක මහිම

එකිනෙකා අතර සන්නිවේදනය සඳහා අප විසින් පරිහරණය කරනු ලබන ප්‍රබලතම මාධ්‍යය භාෂාව යි. දියුණු භාෂාවක කථා ව්‍යවහාරය සහ ලේඛන ව්‍යවහාරය යනුවෙන් ප්‍රධාන ප්‍රභේද දෙකක් හඳුනාගත හැකි ය.

සිංහල භාෂාවේ ද කථා ව්‍යවහාරය සහ ලේඛන ව්‍යවහාරය යනුවෙන් ප්‍රධාන ව්‍යවහාරයන් දෙකක් ඇති බව අපි දනිමු. කථා ව්‍යවහාරය හැඳින්වීම සඳහා 'කට වහර' යන යෙදුම භාවිත කරන අපි ලේඛන ව්‍යවහාරය හැඳින්වීම සඳහා 'ගත් වහර' යන යෙදුම භාවිත කරමු.

මෙහි දී අපගේ වැඩි අවධානය යොමු වන්නේ සිංහල කටවහර පිළිබඳව යි. සිංහල කට වහරෙහි ද අපට නොයෙකුත් ප්‍රභේද හඳුනාගත හැකි ය. එබඳු එක් බෙදීමකි 'වියත් වහර' හා 'ජන වහර' යනුවෙන් දැක්වෙනුයේ. කතාබහේ දී වියත්



නොමිලේ බෙදා හැරීම පිණිසයි

වහර භාවිත කරන්නෝ වියත්හු ය. (උගත් පුද්ගලයෝ ය). එසේ ම කතා බහේ දී ''ජන වහර'' උසුරුවනු (උච්චාරණය කරනු) ලබන්නේ පොදු ජනයා විසිනි.

නිදසුනක් මගින් 'වියත් වහරෙහි' සහ 'ජන වහරෙහි', වෙනස, දක්වුවහොත්, වියතෙකු කට වහරේ දී 'රක්ෂාව', දක්ෂකම, ප්‍රස්තාව හා ප්‍රශ්නය වැනි වචන භාවිත කරනු දැකිය හැකි ය. එහෙත් මේ වචන ම පොදු ජනයා විසින් ජන වහරේදී උච්චාරණය කරනු ලබන්නේ, 'රස්සාව', 'දස්සකම', පරස්සාව හා 'පුරස්නෙ' ආදී වශයෙනි.

'ප්‍රදේශීය භාෂා ව්‍යවහාරය' යනුවෙන් ජන ව්‍යවහාරයෙහි ම තවත් ප්‍රභේදයක් අපට හඳුනාගත හැකි ය. උඩරට, ඌව, දකුණ හා සබරගමුව ආදි පළාත්වලත් සතර කෝරළය, රජරට, බිබිල, මොනරාගල හා බිම්තැන්න ආදි ප්‍රදේශවලත් වෙසෙන සිංහල ජනයාගේ ජීවන වෘත්තීන්, ඇදහිලි - විශ්වාස, සිරිත් - විරිත් හා ඇවතුම් - පැවතුම් සමග බැඳුණු, ඔවුන්ට ම ආවේණික වූ බස් වහර ප්‍රදේශීය භාෂා ව්‍යවහාරය වශයෙන් හැඳින්විය හැකි ය.

මෙහි දැක්වෙන්නේ මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාණන් විසින් රචනා කරන ලද ''සිංහල ජනවහර'' නමැති කෘතියෙන් උපුටාගත් කොටසකි. එමගින් මොනරාගල ප්‍රදේශයට ආවේණික වූ බස් වහර පිළිබඳ ව කරුණු රැසක් හෙළිවෙයි. එය හොඳින් කියවා අවබෝධ කරගන්න.

37

# මොනරාගලට අපි යමු වන්දනාවේ

එදා සිංහල රජ දරුවන්ගේ රජ දහනක්ව පැවත, අද වන සතුන්ට රජ දහනක් ව පවතින දිගාමඩුලු දනව්ව පැරණි සිංහල සිරිත් විරිත් අගේ කරන මිනිස් කොටසකටද වාසභූමියක් ව පවතී. පැරණි දිගාමඩුලු දනව්වේම කොටසක් වන මොනරාගල පළාත ඊටම විශේෂ වූ ජන වහරකින්ද සරුසාර වූ පෙදෙසක් වෙයි. මේ පළාතේ ජන වහර පොදු සිංහලයෙන් වෙනස් වන තැන් සමහරක් මේ පරිච්ඡේදයෙහි දැක්වෙයි.

මොනරාගල, හේන් ගොවිතැනින් සරුසාර වූ පෙදෙසකි. එහෙත් එහි ඉදිකෙරෙන හේන් වටා දක්නට ලැබෙන්නේ වැටවල් නොවේ. 'වැටං' ය. පොදු සිංහලයෙහි බහු අර්ථය දෙනු වස් යොදනු ලබන 'වල්' යන්න වෙනුවට මෙහි භාවිත වන්නේ 'ං' පමණි. මේ රටාව අනුව, මොනරාගලදී හමුවන්නේ දෙරවල් නොව '**දෙරං**' ය. ගොඩවල් නොව '**ගොඩං**' ය. ඇළවල් නොව '**ඇලං**' ය. ලිඳවල් හෝ ලිං නොව '**ලිඳං**' ය.

තරුණයන් සේම වයසක උදවියද මේ හේනවල වැඩ කරති. වයසක පිරිමියෙකුට ගරුසරු ඇතිව කතා කරන විට '**බූඩා**' යයි කීම මෙහි සිරිතය. එවැනි වයසක කාන්තාව '**බූඩි**' හෝ '**හොටී**' ය. පිරිමියෙකු හෝ පිරිමි සත්වයෙකු හඟවන වචනය අගට ඊ යන්නක් එක් කොට ගැනීමෙන් එම වර්ගයේ ගැහැනිය හෝ ගැහැනු සතා හැඳින්වීම මෙහි බහුලව කෙරෙන්නකි. මොනරාගල වැසියන් බල්ලා හඳුන්වන්නේ '**කෑටා**' යනුවෙනි. මේ අනුව බැල්ලියට කියන්නේ '**කෑටී**' කියාය. බළලා හැඳින්වෙන්නේ '**කුංචා**' යනුවෙනි. මේ අනුව බැළලිය '**කුංචි**' වෙයි. '**පැංචා**' යනු තරුණ ගැටයෙකි. එවන් ගැටිස්සිය '**පැංචි**' ය.

තමාගේම දරුවන් හැඳින්වීමේදී '**මා**' හෝ '**මය්**' යන්නක් යෙදීමද මොනරාගලට හුරු ව්‍යවහාරයකි. තමාගේම පුතා '**මා පුතා**' ය'. තමාගේම දුව '**මා දූ**' හෙවත් '**මය් දූ**' ය. තම පුතාගේ

බිරිඳට 'පුතා දූ' කියාත් තම දුවගේ පුරුෂයාට 'දූ පුතා' කියාත් ආදරයෙන් වහරනු ලැබේ.

'**මය් දූ**' යන්නෙහි '**මය්**' යන්න '**මගෙ**' යන්නම මේ පළාතේ භාවිත වන සැටියි. '**මගෙ**' යන වචනය '**මග**' කියාත් මෙහිදී ඇසිය හැකි ය. පොදු සිංහලයෙහි සම්බන්ධ අර්ථය දනවීම පිණිස යෙදෙන '**ගෙ**' වෙනුවට '**ග**' පමණක් යෙදීම මේ පළාතේ සුලභ සිද්ධියකි. මේ අනුව, තොගේ යනු '**තොග**' වෙයි. මහත්තයගෙ යනු 'මහත්තයග' වෙයි. හාමිනේගෙ යනු 'හාමිනේග' වෙයි.

කලින් සිදු වුණු යමක් ගැන කීමෙහි දී බැලුවා, කැඩුවා, වැපුරුවා වැනි වචනයක් යෙදීම පොදු සිංහලයෙහි රටාවයි. එහෙත් මෙහි භාවිත වන රටාව ඊට බෙහෙවින් වෙනස් ය. මෙහි යෙදෙන්නේ බැලුවා යන්න නොව '**බලච්චා**' යන්න ය. කැඩුවා යන්න නොව '**කඩච්චා**' යන්න ය. වැපුරුවා යන්න නොව '**වපුරච්චා**' යන්න ය. මොනරාගල වැසියන් '**කුදහච්චා**' කියන්නේ නිදගත්තාට ය. 'ගහමච්චා' යයි කියන්නේ විසි කළාට ය. '**පුන්නච්චා**' යයි කියන්නේ නිදි කෙරුවාට ය.

ඉර පායන විට හෝ අව්ව පායන විට, වෙනත් පළාත්වල කියනු ඇසෙන්නේ '**ඉර පෑව්වා**' හෝ '**අව්ව පෑව්වා**' වැනි වහරකි. එහෙත් එම වහර මෙහි යෙදෙන්නේ '**ඉර පෑය්යා**' හෝ '**අව්ව පෑය්යා**' යනුවෙනි. '**දැක්කා**' යන වචනය වෙනුවට '**දුටා**' යන්නක් ද මෙහි වහරනු ලැබේ. '**අම්මා දුටා පුත්තු**' යන වැකියෙන් කියවෙන්නේ අම්මා පුතුන් දුටු බවයි. වෙලා යන්න සඳහා '**විලා**' යයි යෙදීමද මොනරාගල වහරේ ලක්ෂණයකි. '**රෑ විලා**', '**මුවා විලා**' යනු විසිනි.

අතීතයෙහි සිදු වුණු ක්‍රියාවකට '**නෑ**' යන්නකුත් එකතු වන විට, එම අදහස පැවසෙන්නේ අමුතුම මුහුණුවරකිනි. '**ඉස්කෝලේ නාවෙ ඇය්ද?**' යි දරුවෙකුගෙන් ඇසුවහොත් '**ඊයෙ වපුරච්ච හන්ද ඉස්කෝලේ එන්නෙ නෑ**' යයි ඊට පිළිතුරු ලැබේ. මෙහි '**එන්නෙ නෑ**' යයි කීවේ '**ආවේ නෑ**' යන අරුතිනි. මේ අනුව, ගියෙ නෑ වෙනුවට 'යන්නෙ නෑ' කියාත්, බලච්චෙ නෑ වෙනුවට '**බලන්නෙ නෑ**' කියාත් මොනරාගල වැසියෝ යොදති.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

කිසිවෙකුට විධානයක් කිරීමේ දී '**කරපං**', '**බලපං**', '**බීපං**'
යනු විසින් ව්‍යවහාර කිරීම සාමාන්‍ය ජන වහරේ රීතිය වෙයි. මෙහි
එන '**පං**' වෙනුවට '**ප**' පමණක් යෙදීම මොනරාගල ජන වහරයි.
'**කරප**' '**බලප**' '**බීප**' යනුවෙනි. 'ගහමප' යයි කියන්නේ 'විසි කරපං'
යන අරුතිනි. 'කුදහප' යයි කියන්නේ බුදියගනිං යන අරුතිනි.

මෙවැනි විධානයක් තරමක් ආදරයෙන් යුතුව පළ කරන විට
'කොය්' යන්නක් එකතු කිරීම මෙහි සිරිතය. වරෙං යයි නොකියා
'**වරෙංකොය්**' කියාත්, 'බලපං' යයි නොකියා '**බලපංකොය්**' කියාත්
'දුවපං' යයි නොකියා '**දුවපංකොය්**' කියාත් යෙදෙන්නාක් සේය.

මොනරාගල වැසියෙකු '**මං එද්දී යාකොය්**' යනුවෙන්
කිවහොත් වෙනත් පළාතක වැසියෙකුට එය එක්වරම තේරුම්
ගැනීම තරමක් අපහසු වනු ඇත. මෙහි '**යාකොය්**' යන වචනයෙන්
කියවෙන්නේ '**පලයං**' හෙවත් '**යන්ටකෝ**' යන අරුතයි. '**එද්දිං**'
යනු යෙදෙන්නේ එන තුරු හෙවත් එන තෙක් යන තේරුමෙනි.
මේ අනුව '**මං එද්දිං යාකොය්**' යනු තමා එන තුරු යන ලෙස
මොනරාගල වැසියා තව එකෙකුට කී අයුරුයි. මෙසේම යන
තුරු යයි කීමට **යද්දිං** යනුත් කපන තෙක් යයි කීමට '**කපද්දිං**'
යනුත් යෙදේ.

'**වැස්ස වහින්ටත් වපුරව්වා**' යනුත් මොනරාගල පෙදෙසටම
සීමා වුණු ජන වහරක් සේ පෙනෙයි. මෙහි '**වහින්ටත්**' යනු
වහිද්දිත් යන අරුත් දෙයි. යට කී වැකියෙන් කියවෙන්නේ
වැස්ස වහිද්දීත් වැපිරූ බවකි. මේ අනුව '**කියන්ඩත්**' යනු
කියද්දිත් යන අරුතද, '**බලන්ටත්**' යනු බලද්දිත් යන අරුතද දෙයි.

නැතුව යන්න '**නැතුං**' සේද කැටුව යන්න '**කැටුං**' සේද
මොනරාගල පෙදෙසෙහි යෙදෙයි. '**කුදහන්නැතුව වරෙල්ලා**' යයි
කියන්නේ පමා නොවී හෙවත් නිදා ගන්නේ නැතිව ආ යුතු බව
කීමටය. '**මොක්කු කැටුං පනං උනේ?**' යන ප්‍රශ්නයෙන් ඇසෙන්නේ
කවුරුන් කැටුව ගියාද යන වගයි. මේ ප්‍රශ්නයට පිළිතුරක්
නොදන්නා කල '**කවුද්දං**' යයි කියනු ඇසේ. එහි අරුත
'කවුද දන්නේ' හෝ 'අනේ මන්දන්නෑ' වැන්නකි. '**නැත්නං**'
යන වචනය '**නැට්ටං**' යනුවෙන්ද මෙහිදී අසන්නට ලැබේ.
ප්‍රශ්නයක් ඇසීමෙහිදී 'ද' යන වචනය යොදා 'ගියාද'

'මොකද?' වැනි වහර භාවිත කිරීම පොදු සිංහලයෙහි රීතිය වුවත් මොනරාගල රීතිය ඊට මඳක් වෙනස් වෙයි. එවැනි 'ද' යන්නක් යොදනු වෙනුවට කට හඬ උස් පහත් කිරීමෙන්ම එම වැකිය ප්‍රශ්නයක විලාසයෙන් ඇසීමට මොනරාගල වැසියෝ සමත්තු ය. 'අප්පච්චි හේනට ගියාද?' යයි අසනු වෙනුවට '**අප්පච්චි හේනට ගියා?** යනුවෙන් උච්චාරණය ධ්වනිය උස්කොට කතා කිරීම මෙහි බොහෝවිට සිදුවෙයි. 'කොහේද' යනු මෙහිදී '**කොහා?**' වන්නාක් සේම 'මොනවද?' යනු '**මොනා?**' වෙයි.

පොදු සිංහලයෙහි යෙදෙන සමහර වචන මොනරාගල පළාතේ යෙදෙන්නේ වෙනස් වෙනස් අරුත් දනවමිනි. මොනරාගල වැසියන් '**ඉඟුරු**' යයි කියන්නේ '**ඉරිඟු**' සඳහාය. එබැවින් එහි '**ඉරුං ගස්**' පමණක් නොව '**ඉඟුරු කරල්**' ද හමු වෙයි. මෙහි '**අඹ**' යනුවෙන් හැඳින්වෙන්නේ '**පැපොල්**' හෙවත් '**ගස් ලබු**' ය. '**පුහුල්**' යන්නෙන් '**වට්ටක්කා**' ද '**කොකිස්**' යන්නෙන් '**කිරි අල**' ද අදහස් කෙරේ.

වෙනත් පළාත්වල වැසියන් උදේ හවස යොදන සමහර වචන මෙහි වැසියන් සලකන්නේ අසභ්‍ය අර්ථයක් ජනිත කරවන වහර හැටියටය. එබැවින් '**කුරුල්ලා**' යන වචනය වෙනුවට මෙහි යෙදෙන්නේ '**සකලයා**' යනුයි. හේන්වලට එන කුරුල්ලන් පැන්නීම මෙහි හැඳින්වෙන්නේ '**සකලයො අඹනවා**' යනුවෙනි. පොඩි දරුවන් ලවා '**සකළයන්ට ඕගාන්ට**' හෝ '**කීගාන්ට**' සැලැස්වීමෙන් උන් එළවීම සිදු කෙරේ. '**ලෙල්ල**' යන වචනයද මෙහිදී භාවිත කළ යුත්තේ පරිස්සෙමිනි. මෙහි වැසියන් '**පොල් ලෙල්ල**' යයි නොකියා '**පොල් කටුව**' හෝ '**පොල් පොත්ත**' යයි කියන්නේ '**ලෙල්ල**' ගැන සඳහන් කිරීමට අකැමති හෙයිනි. '**ලෙලි ගහනවා**' යන්න සඳහා '**ඔයනවා**' යනු යෙදෙන්නේද මේ හේතුවෙනි.

මෙහි '**කය්ය**' යනු සමූහයයි. හේන් පාළු කරන්නේ '**ඌරු කය්ය**' යි. '**කුට්ටම**' යයි කියන්නේ රැස්වීමටයි. '**අම්මංඩි**' යනු නැන්දම්මාට නම්. මොණරාගල පෙදෙස්හි භාවිත ජන වහර, ඊටම විශේෂ වූ මුහුණුවරක් දරමින් සිංහල ජන වහර වඩාත් පොහොසත් කිරීමට හේතු වෙමින් පවතියි.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

## ක්‍රියාකාරකම 14.1

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. අදහස් සන්නිවේදනය සඳහා මිනිසා විසින් පරිහරණය කරනු ලබන ප්‍රබලතම මාධ්‍යය කුමක්ද?
2. භාෂාවක ප්‍රධාන ප්‍රභේද දෙකක් වශයෙන් මෙහි දැක්වෙන්නේ මොනවාද?
3. 'වියත් වහර' හා 'ජන වහර' අතර වෙනස පහදන්න.
4. ප්‍රදේශීය භාෂා ව්‍යවහාරය, පොදු ජන ව්‍යවහාරයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි නිදසුනක් ඇසුරින් පෙන්වා දෙන්න.
5. ප්‍රදේශීය භාෂා ව්‍යවහාරය ඉගෙනීමෙන් අපට ලද හැකි ප්‍රයෝජන මොනවාදැයි දක්වන්න.

## ක්‍රියාකාරකම 14.2

පහත සඳහන් වචන මොනරාගල ප්‍රදේශයේ දී භාවිත වන්නේ කවර අර්ථයක් දීම සඳහා ද යි ලියා දක්වන්න.

| | |
|---|---|
| සකලයා | අඹ |
| කැටා | බුඩා |
| ඉගුරු | බුඩී |
| පුහුල් | කුංචී |
| කොකිස් | මා පුතා |

## ක්‍රියාකාරකම 14.3

පහත දැක්වෙන වගුව මොනරාගල ප්‍රදේශීය භාෂා ව්‍යවහාරය ඇසුරින් සම්පූර්ණ කරන්න.

| අප්‍රාණවාචී බහු වචන නාම පද යෙදෙන අයුරු | අතීත කාල ක්‍රියාපද යෙදෙන අයුරු | විධි ක්‍රියාපද යෙදෙන අයුරු | නැත යන අර්ථයේ අතීත කාලක්‍රියාපද යෙදෙන අයුරු |
|---|---|---|---|
| වැටං | බලව්වා | කරප | එන්නෙ නෑ |
| | | | |

දැනුමට :-

## උඩරට ජන වහර

| | | |
|---|---|---|
| බිං කරුවල | - | ඇඳිරි වැටෙන වෙලාව. |
| පොත් කරනවා | - | ඇඳුම් නවනවා. |
| හේලංකඩ | - | අගුපිල. |
| උදූහැනැක්ක | - | උදෑසන. |
| දූගල | - | මිරිස්ගල. |
| මිටුවන්ගල | - | අත්ගල. |
| ඇලි මෝලංකඩ | - | උළුවස්ස. |
| ඇට්ටකුණාවෙනවා | - | හොඳහැටි නොතැම්බීම. |
| අම්මණ්ඩි | - | මව. |
| අප්පච්චි | - | පියා. |
| කිරි අම්මා | - | ආච්චි. |
| කිරි අත්තා | - | සීයා. |

## සබරගමු ජන වහර

| | | |
|---|---|---|
| ගගුල බානවා | - | වැස්ස. |
| මඩම | - | විශ්‍රාමශාලාව. |
| දෙයියන්ගෙ රට | - | සිරිපාඅඩවිය. |
| හිමේ නගිනවා | - | සිරීපාදේ වන්දනා කරනවා. |
| පත්මය | - | සිරිපතුල. |
| පේවීම | - | පිරුවට ඇඳ සූදනම් වීම. |
| සැහැල්ලුව | - | වන්දනාකරුවන් ගෙනයන බැගය. |
| කිරිකෝඩු | - | පළමුවරට සිරීපාදේ යන ළමයි. |
| නඩේගුරා | - | වන්දනා කණ්ඩායමේ නායකයා |
| පැලපදියම් වෙනවා | - | පදිංචි වෙනවා |
| කෝඩෙ | - | වැස්සකට පෙර අඳුරු අහස. |

## සතර කෝරළේ ජන වහර

| | | |
|---|---|---|
| සෝමාරියා | - | කම්මැළියා. |
| කුම්මැහියා | - | ලෝභයා. |
| කොක්කනිය | - | බුලත්මල්ල. |
| තාන්තුවාගෙදර | - | මඟුල්ගෙදර. |
| ඉළවු ගෙදර | - | මළගෙදර. |
| සංගෙට නැති | - | නැහැදිච්ච. |
| සෝලිය | - | කරදරය. |
| විරසක වීම | - | තරහ වීම |
| ගිනි කුන්දම | - | හදිසිකරදරය. |
| අංකර ඇල්ලීම | - | රණ්ඩු දබර වීම. |
| හද්දික්කරාවේ යාම | - | නන්නත්තාරේ යාම. |
| අල්ල පනල්ලෙ | - | අතරතුර. |

## දකුණු පළාතේ ජන වහර

| | | |
|---|---|---|
| ඇට්ටමුරුත්තාවීම | - | බාගෙට තැම්බීම |
| අම්මණ්ඩි | - | අම්මා |
| තාත්තණ්ඩි | - | තාත්තා |
| මාළු ඒදනවා | - | ව්‍යංජනවලට තුනපහේ දමනවා. |
| ලූනු හොඳකරනවා | - | ලූනු ශුද්ධ කරනවා. |
| පොල් ඔයනවා | - | පොල් ලෙලි ගහනවා. |
| හෙරලි | - | කොස් |
| මුත්තා | - | සීයා |
| මුගුනි ඇන්න | - | මුගුණු වැන්න. |
| රට පුහුල් | - | වට්ටක්කා |
| පත්තක්කා | - | පැණිකොමඩු |
| ජූල් | - | දිවුල් |
| වැවර | - | කුරුම්බා |

## රජරට බස් වහර

| | | |
|---|---|---|
| අත්තප්පා | - | සීයා |
| අප්පල්ලෙ | - | ඇතිලිය. |
| අව් රබහ | - | මඳ අව්ව. |
| අන්ද බීතෙ | - | වැහි අඳුර. |
| ආල පාලුව | - | වගා පළදුවට වන හානිය. |
| හිරිකඩවැස්ස | - | පොද වැස්ස. |
| පූනම්මා | - | පුංචි අම්මා. |
| පෙස්සං කොල | - | කඩදසි. |
| බිතක්කන | - | අගුපිල. |
| හද්දැව | - | නොනැවතී වසින වැස්ස. |
| ඇබිත්තී | - | කුඩා දූරිය. |
| ඕසෙ | - | අඬහැරය. |

**දකුණු පළාත**

* ''කෝ දෙන්න, මං පොල්ගෙඩිය ඔයන්නම්.....''
* ''ඔහෙට ලූනු හොඳ කරන්නත් ඇහැක.....?''
* ''බලහං ඔය බත් මුට්ටිය ඇට්ට මුරුත්තා වෙයි,....''

**උඩරට පළාත**

* ''උදැහැනැක්කෙම කුඩප්පච්චි බෑරක් වගෙයි.''
* ''මං එද්දි දෙඹ සූරන වැස්ස !''
* ''හොඳටෝම තෙත බරියං වෙලා!''

**ඌව ජනවහර**

* ''කිරි අම්මායි, මාමණ්ඩියි, අයියණ්ඩියි, ගෙට ගොඩ වුණේ ඉරගල වැටුණටත් පස්සේ.........''
* ''පලිසම්පාඩුව හොට බරියගෙං තමා ........''

## ක්‍රියාකාරකම 14.4

ප්‍රදේශීය ව්‍යවහාරයන් භාවිතයෙන් මෙවැනි වැකි 05 ක් නිර්මාණය කරන්න.

## ක්‍රියාකාරකම 14.5

පහත දැක්වෙන ප්‍රදේශීය ව්‍යවහාරයන් සඳහා පොදු ජනවහරෙහි එන යෙදුම් සොයා ලියන්න.

| දකුණු පළාත | ඌව පළාත | උඩරට පළාත | රජරට |
|---|---|---|---|
| තියඹරා | කුංචා | අප්පල්ලෙ | අරෝව |
| කළු කපා එළියෙන් | ගස්ගෝනා | හේලංකඩ | අවලාද |
| මාළු ඒදනවා | වන්නිකැට | බිංකරුවල | ඇබිත්ති |
| ජුල් | කෑහුලා | මුල්ඇඳුම | ආලපාලුව |
| මක්කැයි | පුරුමිරිස් | කුයිල | අවරවෙලා |
| හින්නා | බුඩුන්දෑ | වෛතාලෙන් | තුලාන |

**සංකල්පනා**

**තම යුතුකම් නොපිරිහෙලා ඉටු කරන්නට උරුමයේ දොරටුව විවර වන්නේ නිරායාසයෙනි.**

# 15 ප්‍රායෝගික ලේඛන

එදිනෙදා ජීවිතයේ දී භාවිත කිරීමට ලැබෙන විවිධාකාර ලේඛන **ප්‍රායෝගික ලේඛන** යනුවෙන් හැඳින්වේ. එදිනෙදා ජීවිතයට අදාළ ව තොරතුරු සන්නිවේදනය සඳහා ලැබෙන අවස්ථා බොහෝ ය. ඒ සෑම අවස්ථාවක දී ම භාවිතයට ගැනෙන ලේඛන විධිමත් ව සකස් වී තිබීම අත්‍යවශ්‍ය ය. එසේ නොවුවහොත් සන්නිවේදන කාර්යයට බාධා පැමිණේ. ඒ සෑම ලේඛනයක් ම සකස් කිරීම සඳහා ආකෘතිකමය වශයෙන් හා අන්තර්ගතමය වශයෙන් ප්‍රමිතියක්, ක්‍රමවේදයක් පවතී. ප්‍රායෝගික ලේඛන අතර, **ආකෘති පත්‍ර** හා **න්‍යාය පත්‍ර** පිළිබඳ ව අධ්‍යයනය කිරීම මේ පාඩමෙන් සිදු කෙරේ.

## ආකෘති පත්‍ර

රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන සඳහා, යම් පුද්ගලයෙකුගෙන් හෝ පොදු සංවිධානයකින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට භාවිත කරන ලියවිල්ල ආකෘති පත්‍රයක් ලෙස හැඳින්වේ.

ආකෘති පත්‍රයකින් පෞද්ගලික තොරතුරු ඉදිරිපත් කරන අවස්ථා, කීපයක් පහත දැක්වේ.

- පිරිවෙනකට/ පාසලකට ඇතුළත් කිරීමේ දී,
- උපසම්පදාව ලියාපදිංචි කිරීමේ දී,
- රැකියාවකට අයදුම් කිරීමේ දී,
- පෞද්ගලික බැංකු ගිණුමක් ආරම්භ කිරීමේදී,
- මුදල් ඇණවුමකින් මුදල් යැවීමේ දී.
- උප්පැන්න, විවාහ, මරණ සහතික ලබා ගැනීමේදී,
- පාඨමාලා හැදෑරීමට අයදුම් කිරීමේ දී,
- ග්‍රාම සේවක සහතිකයක් ලබා ගැනීමේ දී,
- විවිධ පදවි/ තනතුරු සඳහා අයදුම් කිරීමේ දී,
- විභාගවලට අයදුම් කිරීමේ දී,

ආකෘති පත්‍රයකින් පොදු තොරතුරු ඉදිරිපත් කරන අවස්ථා කීපයක් පහත දැක්වේ.

- සමිතියක් සංවිධානයක් ලියාපදිංචි කිරීමේ දී
- පොදු බැංකු ගිණුමක් ආරම්භ කිරීමේ දී
- දේශීය හා විදේශීය වශයෙන් සංචාරයක යෙදෙන විටක දී

ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමේ දී අවධානයට ලක් කළ යුතු කරුණු.

☆ දී ඇති උපදෙස් කීප වතාවක් හොඳින් කියවීම.

☆ අසා ඇති සෑම කරුණකට ම තොරතුරු සැපයීම.

☆ අදාළ නැති තැන්වල හිස් ව නොතැබීම.

☆ අදාළ නැති තැන්වල "අදාළ නැත" යනුවෙන් ලිවීම.

☆ සෑම විට ම සැබෑ වූත් නිවැරදි වූත් තොරතුරු සැපයීම.

☆ නම් ලිවීමේ දී උප්පැන්න සහතිකයට අනුව/ පැවිදි සහතිකයට අනුව ලිවීම.

☆ සම්පූර්ණ නම ලිවීමේ දී පෙළපත් නාමය සහිත ව ලිවීම. පැවිදි නාමයක දී ගමේ නාමය ලිවීම.

☆ අයදුම්කරුගේ අත් අකුරින් පිරවිය යුතු යැ යි උපදෙස් දී ඇති විටක තම අත් අකුරින් ම ලිවීම.

☆ ආකෘති පත්‍රය මගින් ලබාදෙන තොරතුරු පරිගණක ගත කිරීම වර්තමානයේ බොහෝ දුරට සිදුවන නිසා ඊට අදාළ උපදෙස් අනුව කටයුතු කිරීම.

උදා:- 1. එක කොටුවක එක අකුරක් වන සේ සම්පූර්ණ නම ලියන්න.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉ | ඩ | මේ | ගෙ | ද | ර | ශා | න් | ත | කු | මා | ර | ප්‍රේ | ම |ච | න් | ද්‍ර |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පු | ව |ක් | පි | ටි | යේ | සු | ධ | ම් | ම | හි | මි |

2. මුල’කුරු සහිත නම ලියන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඊ | ජී | එස් | කේ | ප්‍රේ | ම | ච | න් | ද්‍ර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පී | සු | ධ | ම් | ම | හි | මි |

## ක්‍රියාකාරකම 15.1

අංක 21, පන්සල පාර, නාපාන පදිංචි දෙරවක ලේකම්ලාගේ චමින්ද රත්නායක නම් අවිවාහක තරුණයා ඔබ යැයි සිතා පහත සඳහන් අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

**ජාතික අත්කම් භාණ්ඩ පුහුණු ආයතනයේ**
**අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්‍රය.**

1. සම්පූර්ණ නම : ..................................................................

2. මුලකුරු සහිත නම : ...........................................................

3. සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :
   (එක කොටුවක එක අකුරක් ඇතුළත් වන සේ ලියන්න.)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

4. ස්ථිර ලිපිනය : ..................................................................
..................................................................

5. ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් -
(එක කොටුවක එක අකුරක් ඇතුළත් වන සේ ලියන්න.)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

6. ජාතික හැඳුනුම්පත් අංකය :

7. උපන් දිනය : වර්ෂය මාසය දිනය

8. 2014.06.01 දිනට වයස : අවු මාස දින

9. ස්ත්‍රී / පුරුෂ භාවය : ................................

10. විවාහක / අවිවාහක භාවය : ..........................

11. පුරවැසි භාවය : ................................

12. ජාතිය : ........................

13. ආගම : ...........................

14. අධ්‍යාපන සුදුසුකම්

1. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය

වර්ෂය .......................... මාසය .............. විභාග අංකය ..............................

| විෂයය | සාමර්ථ්‍යය |
|---|---|
| | |
| | |
| | |
| | |

| | |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

2. අ.පො.ස උසස් පෙළ විභාගය

වර්ෂය .......................... මාසය ............. විභාග අංකය ..............................

| විෂයය | සාමර්ථ්‍යය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

3. ලබා ඇති උපාධි.

| උපාධිය | වර්ෂය | විෂයයන් | විශ්ව විද්‍යාලය/ ආයතනය |
|---|---|---|---|
| ............................... | .............. | ................................................ | ....................................................... |
| ............................... | .............. | ................................................ | ....................................................... |
| ............................... | .............. | ................................................ | ....................................................... |
| ............................... | .............. | ................................................ | ....................................................... |
| ............................... | .............. | ................................................ | ....................................................... |

15. වෙනත් සුදුසුකම් : ..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

16. අයදුම් කරන තනතුරට අදාළ පළපුරුද්ද හා සුදුසුකම් :

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සඳහන් කරමි. මේ තොරතුරු යම් අයුරකින් අසත්‍ය වුවහොත් ආයතනය විසින් ගන්නා ඕනෑ ම තීරණයකට යටත් වීමට ද එකඟ වෙමි.මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසු ව වුව ද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

| | |
|---|---|
| ............................................ | ............................................ |
| දිනය | අයදුම්කරුගේ අත්සන |

## න්‍යාය පත්‍ර

**"කිසි කමකට නැති වැඩ, අගක් නෑ, මුලක් නෑ, පොල්තෙල් පහන පත්තු කරේ පන්සිලුත් දීල යි. ප්‍රධාන ආරාධිත අමුත්තා ගැන වගක්වත් නෑ, ස්තුති කතාව කරන්න වුණෙත් මූලාසනයේ හිටිය මට........."**

මේ කෑරගල ශ්‍රී ප්‍රඥප්‍රදීප පරිවේනාධිපති පූජ්‍ය විහාරගම දීපාලෝක පණ්ඩිත හාමුදුරුවන් වහන්සේ පාසලක ත්‍යාග ප්‍රදානෝත්සවයකට සහභාගී වී ආපසු වැඩමවා සිය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ඉදිරියේ ප්‍රකාශ කළ අදහස් කීපයකි.

මෙය අසා සිටි පිරිවෙනේ 4 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පොල්අඹේගොඩ සමිත ආයුෂ්මතුන් වහන්සේ, එම ත්‍යාග උත්සවය එසේ ව්‍යාකූල වීමට හේතු වූ කරුණු පණ්ඩිත හාමුදුරුවන් වහන්සේගෙන් විමසන්නට වූහ.

''පොඩි නම මුල ඉඳල ම ඒ උත්සවය අවුල් වුණේ වැඩසටහන් පිළිවෙළක් හදාගෙන තිබුණේ නැති නිසා යි. ''න්‍යාය පත්‍රය'' කියන්නෙ එහෙම සකස් කර ගන්න වැඩසටහන් පිළිවෙළට යි.''

''පණ්ඩිත හාමුදුරුවනේ වැඩසටහනකට එහෙම ''න්‍යාය පත්‍රයක්'' වුවමනා ම ද?''

නැවතත් සමිත ආයුෂ්මතුන් වහන්සේ පණ්ඩිත හාමුදුරුවන් වහන්සේගෙන් ප්‍රශ්න කරන්නට වූහ. ඊට පිළිතුරු දුන් පණ්ඩිත හාමුදුරුවන් වහන්සේ......

''ඔව් පොඩි නම යම් රැස්වීමක්, උත්සව සභාවක්, වැඩමුළුවක්, විවිධ ප්‍රසංගයක්, කාර්ය සැසියක් වැනි සංවිධානාත්මක ව කරන ඕනෑ ම වැඩසටහනක් සාර්ථක ව කරන්නට නම් ''න්‍යාය පත්‍රයක්'' අවශ්‍ය ම යි. නැත්තම් ඒ වැඩසටහන අවුල් වෙනවා එහෙම වුණාම.

ඊට සහභාගි වූ අයගේ පමණක් නෙවෙයි අහන දකින සැමගේ දෝෂ දර්ශනයට ලක්වෙනවා. 'න්‍යාය පත්‍රයක්' සකස් කරන්නේ වැඩසටහනට කලින් නිසා අඩුපාඩුවක් නැති ව සංවිධාන කටයුතු කර ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා පොඩි නම අපි යම් වැඩසටහනක් සංවිධානය කරනවා නම් අනිවාර්යයෙන් ම 'න්‍යාය පත්‍රයක්' හදාගන්න වග බලා ගන්න ඕනි. ඒ වගේ ම පොඩි නම යම් වැඩසටහනකට 'න්‍යාය පත්‍රයක්' හදන කොට අවධානය යොමු කළ යුතු කරුණු කීපයක් තියෙනවා, මෙහෙම.

1. ආරම්භක වේලාවේ සිට අවසානය දක්වා කාලය වෙන් කිරීම.
2. වැඩසටහනේ තේමාව ඉස්මතු වන පරිදි වැඩසටහන් පෙළ ගැස්ම.
3. සාම්ප්‍රදායික ව පැවතෙන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම.
4. විශේෂ දේශන/කතා ආදිය ඇතුළත් කිරීමේ දී ප්‍රමුඛතා ව පිළිබඳ සැලකිලිමත් වීම.
5. අදාළ කාරණා සඳහා සුදුසු පුද්ගල දායකත්වය පිළිබඳ සැලකිලිමත් වීම.

මේ ආකාරයට පණ්ඩිත හාමුදුරුවන් වහන්සේ න්‍යාය පත්‍රය පිළිබඳ විස්තර කිරීම සිදු කළහ.

**ආදර්ශ න්‍යාය පත්‍රයක්**

පේරාදෙණිය ශ්‍රී ශාස්ත්‍රෝදය මහ පිරිවෙනේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2013.05.20.

### න්‍යාය පත්‍රය

1. ප.ව. 01.00 - ආරම්භක ගාථා සජ්ඣායනය.
2. ප.ව. 01.05 - චිරාගත සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහන දැල්වීම.
3. ප.ව. 01.15 - මූලාසනය පිළිගැන්වීම.
4. ප.ව. 01.20 - ගිහි පිරිස පන්සිල්හි පිහිටුවීම.
5. ප.ව. 01.30 - පිළිගැනීමේ කතාව
6. ප.ව. 01.45 - පාරිවෙණික ප්‍රගති සමාලෝචනය
7. ප.ව. 02.10 - සිසු නිර්මාණ (පද්‍ය පන්තිය සිංහල)
8. ප.ව. 02.20 - ආරාධිත විශේෂ දේශනය
9. ප.ව. 03.00 - සිසු නිර්මාණ (සංස්කෘත කතාව).
10. ප.ව. 03.15 - ආචාර්ය මණ්ඩලය වෙනුවෙන් සිදු කෙරෙන කතාව.
11. ප.ව. 03.45 - ශිෂ්‍ය පිරිස වෙනුවෙන් පැවැත්වෙන කතාව.
12. ප.ව. 04.00 - සිසු නිර්මාණ (පාලි කතාව).
13. ප.ව. 04.10 - ත්‍යාග හා සහතික පත් ප්‍රදානය.
14. ප.ව. 04.45 - මූලාසනයේ කතාව.
15. ප.ව. 05.05 - ස්තුති කතාව.
16. ප.ව. 05.20 - වැඩසටහන් නිමාව.

## ක්‍රියාකාරකම 15.2

පහත සඳහන් වැඩසටහන් සඳහා න්‍යාය පත්‍ර සකස් කරන්න.

1. පිරිවෙනේ සාහිත්‍ය දින උත්සවය.
2. පරිවේනාධිපතීන් වහන්සේ සේවයෙන් විශ්‍රාම ගෙන සමුගැනීමේ උත්සවය.
3. ශිෂ්‍ය නායක පුහුණු වැඩසටහන
4. පාරිවේනික ශිෂ්‍ය සමිතියේ න්‍යාය පත්‍රය.

සංකල්පනා

**මොහොතක ඉවසීම දස වසරක සැනසුමකි.**

# 16 සාහිත්‍ය රසාස්වාදය

දැන ගැනීමට කියවීම, ඉගෙනීමට කියවීම, රස විඳීමට කියවීම යනුවෙන් කියවීමේ ප්‍රභේද තිබේ. සාහිත්‍ය පොත පත කියවිය යුත්තේ හුදෙක් ඉගෙනීමට නොවේ, රස විඳීමටත් අගය කිරීමටත් ය. ගද්‍ය, පද්‍ය සාහිත්‍යය රස විඳීම පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට මෙම පාඩමෙන් හැකියාව ලැබෙනු ඇත.

මිනිසා ස්වභාවයෙන් ම රසය සොයා යන අදහසින් යුක්ත ය. ඉඳුරන් පිනවීම සඳහා ඔහු නිතර වෙහෙසෙන්නේ එබැවිනි. ඇතැම් විට හේ මිනිසත් බව නොමිනිස් බවට ද හෙළා ඉඳුරන් පිනවීමට වෙර දරයි.

පියකරු රූපය ඇසට රසය ගෙන දෙයි. මිහිරි සුවඳ නාසය පිනවයි. රසවත් භාෂාව කන් ද සිත ද පිනවයි. එබැවින් භාෂාව රසවත් කරන්නෝ මේ දෙවැදෑරුම් රසය ගැන ම සැලකිලිමත් වෙති.

රසය මතු කෙරෙන ක්‍රම දෙකකි. එනම්,

1. ශබ්ද රසය.
2. අර්ථ රසය යනුවෙනි.

විසිතුරු වර්ණාලේප කළ පමණින් චිත්‍රයක් නොවන්නා සේ අර්ථ රසයෙන් පමණක් සමන්විත කාව්‍යය පලක් නොවේ. මහත් වූ ශබ්දයක් නැගුණු පමණින් ගීතයක් නොවන්නා සේ, ශබ්ද රසය පමණක් ඇති කවිය ද උසස් නොවේ. විශිෂ්ට නිර්මාණයක ශබ්ද රසය, මෙන් ම අර්ථ රසය ද ගැබ් විය යුතු ය.

රසය නම් භාවෝද්දීපනය යැ යි ද පැවසේ. ඒ අනුව පුරාණාචාර්යවරු නව වැදෑරුම් රසයක් ඇතැ යි කීහ. එනම්,



නොමිලේ බෙදා හැරීම පිණිසයි

- ශෘඞ්ගාර රසය
- හාස්‍ය රසය
- කරුණා රසය
- රෞද්‍ර රසය
- වීර රසය
- භයානක රසය
- බීභත්ස්‍ය රසය
- අද්භූත රසය
- ශාන්ත රසය

ව්‍යඤ්ජනයක් පිළියෙල කරන සූපවේදියා එය රසවත් කිරීම පිණිස දුරු, මිරිස්, ලුණු, එනසාල්, කරාබුනැටි වැනි කුළුබඩුත්, රම්ප, කරපිංචා ආදියත් මිශ්‍ර කරයි. ඒ ඒ ව්‍යඤ්ජනයට ගැළපෙන පරිදි යෝග්‍ය ප්‍රමාණයක් යෙදීම තුළින් රසවත් ව්‍යඤ්ජනයක් පිළියෙල කරයි. භාෂාව මූලික අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා කාව්‍ය නිර්මාපකයා ද සිය ප්‍රබන්ධය රස ගැන්වීම පිණිස අනුගමනය කරන ප්‍රයෝග කීපයකි,

- ✯ උචිත භාෂාවක් යොදා ගැනීම.
- ✯ අලංකාරෝක්ති භාවිතය.
- ✯ කවි සමයේ එන යෙදුම් භාවිතය.
- ✯ සිය අත්දැකීම් උපයෝගී කර ගැනීම.

ඒ අතර ප්‍රධාන වේ.

## කවියක් රස විඳින්නේ කෙසේ ද?

කවියක් රස විඳීමේ දී කාව්‍ය රචකයාගේ වස්තු විෂය, අරමුණ හඳුනා ගැනීම ඉතා ම වැදගත් වේ. ඇතැම් නිර්මාණවල වස්තු විෂය පහසුවෙන් හඳුනාගත හැකි වුවත් සමහර නිර්මාණවල වස්තු විෂය පහසුවෙන් හඳුනා ගැනීමට නුපුළුවන. පහත දැක්වෙන්නේ ආනන්ද රාජකරුණාගේ 'ගඟ' පද්‍ය පන්තියෙහි එන කවි කීපයකි.

ටිකෙන් ටිකම කඳු මුදුනෙන් බැස්ස නුඹයි
හැදී වැඩී ගම්මානෙට ගැලූ නුඹයි

ටික්කි ටිකිරි සුරතල් ළඳුරියක් වගෙයි
කැකිරි සිනාවෙන් බැස ආ ගමනෙ අගෙයි

මෙහි වස්තු විෂය ලෙස ගඟක් ගැන කියා තිබුණ ද ඒ තුළින් ජීවිතය පිළිබඳ යමක් අර්ථවත් කර තිබේ.

කවියා, කවියක යොදන වචනවල සැබෑ අරුත් අවබෝධ කර ගැනීමට ඒ කෘතිය පහළ වූ සමාජ, සංස්කෘතික හා ආගමික පසුබිම පිළිබඳ ව ද වැටහීමක් තිබීම අවශ්‍ය වේ.

මුනි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගිරි පෙදෙසින්නේ
මඳ සුළඟයි මේ එන්නේ
මගේ පුතා නැළැවෙන්නේ

මෙය නැළැවිලි ගීයකි. වසර දහස් ගණනක ඉතිහාසය පුරා පෝෂණය වූ බෞද්ධාගමික සංස්කෘතික පරිසරයේ අගනා උරුමය කවියා තම නිර්මාණයට මුසුකර තිබේ. එකී පරිසරයට නෑදෑකමක් නැතිකෙනෙකුට මෙය හුදු වචන රැසක් පමණි. හරයක් රසයක් නැත.

ප්‍රකාශ කළ යුතු දේ නවතාවකින් (පෙර නොවූ දෙයක් ලෙස) ඉදිරිපත් කිරීම කවියා තුළ විද්‍යමාන වන තවත් ලක්ෂණයකි. අපූර්වත්වය යනුවෙන් එය හැඳින්වේ. කවිත්වය, ප්‍රතිභානය යන නම්වලින් ද හැඳින්වෙන්නේ එය යි. නිර්මාණයක රස ජනනය කර ගැනීමෙහි ලා මේ අපූර්වත්වය හඳුනා ගැනීම ද ප්‍රයෝජනවත් වේ.

පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විළිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

හිරු නැගෙන, බැසයන අවස්ථා අප කොතෙකුත් දැක ඇත. එහෙත් එහි අපූරු බවක් අපට නොදනුණි. රක්ත වර්ණ වූ හිරු එක් වර ම අස්තයට යාම තොටගමුවේ සිරි රහල් හිමියන් දකින්නේ, අවරගිර නටුවෙන් ගිලිහී වැටෙන රත් පැහැයෙන් යුත් ඉදුණු පලයක් ලෙසිනි. එහි ඇත්තේ අපූර්වත්වයකි.

රසෝත්පත්තිය සඳහා කවීහු කාව්‍යාලංකාර ද යොදා ගනිත්, මේ එවැනි අවස්ථාවකි.

සිසි වන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින
නිසි පුළුලුකුල රිය සකයුරු තිසර තන
දිසි රණ ලියෙව් රූ සිරි යුත් මෙපුරගන
ඇසි පිය හෙළන පමණින් නොවෙති දෙවගන

කවියාගේ මුඛ්‍යාර්ථය පුරාංගනාවන් වර්ණනා කිරීම යි. පුර ස්ත්‍රීන්ගේ මුහුණ සඳ වැනි ය. මිටෙන් ගත හැකි තරම් වූ සිහින් ඉඟකි. පුළුල් උකුල රියසක වැනි ය. පියවුරු හංසයින් ම ය. ඇසිපිය නොහෙළන්නේ නම් ඔවුන් දෙවඟනන් ම ය. රූපක හා උපමා අලංකාර යොදා ගෙන ස්ත්‍රීන්ගේ ස්වභාවය පිළිබඳ ව කෙරෙන මේ වර්ණනය තුළින් පාඨකයා තුළ කදිම චිත්ත රූපයක් ගොඩ නගයි. කවියාගේ බස හා අලංකාර පිළිබඳ නොදත්තෙකුට එහි රසයක් කොයින් ද?

ඉහත දක්වන ලද්දේ රසාස්වාදයක් හෝ ඇගයීමක් කිරීමේ දී සැලකිලිමත් විය යුතු නිර්ණායක කීපයකි. සාහිත්‍යයට ආවේණික වචන රාශියක් තිබේ.

උපකල්පනය, පරිකල්පනය, ප්‍රතිභානය, සහෘදයා, නිර්මාපකයා, ප්‍රබන්ධය, ස්වානුභූතිය, පාඨකයා, පාත්‍රවර්ගයා, ප්‍රේක්ෂකයා, නිර්ණායක, අපූර්වත්වය, වස්තු විෂය, ආත්මකථන, ප්‍රතිනිර්මාණය ආදී වශයෙනි. නිතර භාවිත වන මෙවැනි වචන හඳුනා ගෙන තිබීම ඇගැයීම සාර්ථක කර ගැනීමට ආධාර වේ.

## ක්‍රියාකාරකම 16.1

ඔබ අධ්‍යයනය කළ මූලධර්ම සැලකිල්ලට ගෙන පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ ගැන රසවිඳීමක් කරන්න.

(අ) පහ උනත් මැණික මුදුවෙන් අගේමය
බුදු උනත් දුදන අවගුණ කෙරේමය
බැස ගියත් ජලය අපලය නොවේමය
වෙන් උනත් හොඳය හොඳ අය පැතීමය

-ජනකවි-

(ආ) පැ සෙ යි නිබඳ සුවඳැල් කෙත් වත් අව ට
ඇ සෙ යි ළමා වසු පැටියන් හඬ දුර ට
දි සෙ යි වෙහෙර එහි සුර විමනක් ලෙස ට
ර සෙ යි අමා රසමය ඒ පියස දු ට

**-හංස සංදේශය-**

(ඉ) සැදි රත තඹර පෙළ රන තිසරුන් රුවැති
විදි දිය දහර ලෙළ දෙන දිගු නරු පටැති
රැඳි රළ රළැති හොය දියවන්නා නමැති
ඇඳි පුර අඟන පටසළු සිරි රැපැයි නිති

**-සැළලිහිණි සංදේශය-**

(ඊ) ''එක් දවසක් හිරු අස්ත පර්වත ගත වේලෙහි ශීලසමාධිප්‍රඥා ගුණාංග සංගත භික්ෂු සංඝයා වහන්සේ තමන් වහන්සේ වසන රාත්‍රි ස්ථානයෙන් අවුත් යුද්ධ භූමියකට රැස්වන්නා වූ සුවිනීත යොධ මුළක් සේ ද, මැණික් සන්නාහ සන්නද්ධ නානාලංකාරයෙන් සැදුම් ලද ගඳැත් මුළක් සේ ද, එකවර සිංහ සමූහයක් සේ ද, සැඳෑ වලා බඳු වූ සුරක්තවර පවුල් පෙරෙවැ, ගන්ධදම පුෂ්පද්‍රවාවලම්බිත කනක රජතමණි තාරකායෙන් විචිත්‍ර විතාන ඇති, නානාප්‍රභා සමුදය සමුජ්වලිත අලංකෘත ධර්ම සභායෙහි, ශක්‍රාගමනය බලමින් සුධර්මා නම් දිව්‍යා සභාවෙහි රැස් ව උන් දිව්‍ය සමූහයා සේ, ධර්ම රාජන් වූ, ධර්මාධිපති වූ, ධර්මස්වාමී වූ, තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වඩනා පෙර මග බල-බලා ධර්මාසනය පිරිවරා හිඳ, බුදුන් ගේ නුවණ පැරුම් වනන සේක්,''

**-උම්මග්ග ජාතකය-**

(උ) මුව ජාතියේම ද පළමුව උපන්නේ
එම ජාතියේ සිට නැරම මම එන්නේ
කොයි ජාතියේ උපනත් මෙහෙසුන් වන්නේ
මේ ජාතියේ ඇයි මා තනිකර යන්නේ

සිතා ගෙනම වෙර වෑයම් කර දුනිමි
පතා පෙරුම් බලයෙන් නැරම ආමි
ගොතා දැත බැඳලා අප දන් දුනිමි
කතා මට නොකර වැඩියේ මන්ද හිමි

රුව ඇති පුතුන් වැදුවා මා වැරදී ද
රුව ගුණ තේජසක් මගේ අඩු වුණාව ද
ගරු සරු නැති කමක් මාතින් යෙදුණා ද
මරු බිඳ බුදුවෙන්ට හීනෙන් පෙනුණා ද

සුවඳ බොජුන් වැළඳූ මගෙ හිමි සඳුට
නිබඳ බොජුන් රසකර දුන් වළඳන්ට
සුවඳ පලාපල වැඩියන් හිමියන්ට
සුවඳ මල් නිතර පිපියන් රන් කඳට

කාරණාව බුදු වෙනවා ලකුණු දනේ
නෑර කැටුව ආවා මම සරණ ගෙනේ
බාවනාව තොර නොකරමි ඉතින් අනේ
මාළිගාව අද අඳුරුයි සුවාමිනේ

-යශෝදරාවගේ විලාපය-

(ඍ) ඒ මිහිරිරුව ඇසැ හෙත් මැ, ඒ මිහිරි හඬ කණැ හෙත් මැ දකුණතින් ගත් කඩුව බිමැ වැටී හෙනබව් නො දනැ, වමතින් ගත් පලඟය වැටී හෙනබව් නො දනැ, දෙක දෙඅතින් හෙළා ශ්‍රීපාදයෙහි වැඳ වැතිරැ ගොස් ''දතිමි ස්වාමීනී, හැඳින්නෙමි ස්වාමිනී, මහාමායා දේවීන් වහන්සේගේ පුතණුවන් වහන්සේ නුඹ ද? සුද්ධෝදන රජ්ජුරුවන් වහන්සේගේ පුතණුවන්වහන්සේ නුඹ ද? ගැත්තවු කරන පව් ස්වාමීන් ඇසට පැණිනි ද? මෙතෙක් තැන් වැඩියේ හුදකලා ගැත්තවූ කෙරෙහි කළ කරුණායෙන් ද? දිව්පමණින් සරණ වන්මි, ඇස නිවී ගියේ. සිත සැනහී ගියේ, කළ පව් ගෙවී ගියේ. ගැත්තවුට කරුණා කොට වදළ මැනවැ''යි යත් හි,

-බුත්සරණ-

(එ) කියමින් ගී රස මියු රූ
තබමින් පදතල අනු රූ
බඳිමින් දන මන නුව රූ
කෙළිමින් යෙති බැඳ බහුරූ

සුරඟන රඟ රඟ හළුවෝ
දුටු දන මන නෙත් වෙළුවෝ
මනයොන සර කුසුමළුවෝ
තැන තැන රඟදෙති නළුවෝ

රැගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්
පුවත් නොදන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

සුවඳ කුසුම් වරලසෙහි
පැලැඳ කපුරු හර උරෙහි
නොමද බරණ ලා සැරහී
නිබඳ කෙළිති ලියො පුරෙහී

-ගුත්තිල කාව්‍යය-

## සංකල්පනා

**"ඔබේ", "මගේ" යන වචන දෙක නැති නම් ලෝකය ස්වර්ගයකි.**

# 17 සාහිත්‍ය විචාර මූලධර්ම

භාෂාව විචිත්‍ර ලෙසත් සුන්දර ලෙසත් යෙදූ කල මැවෙන්නේ සාහිත්‍යය යි. සෞන්දර්යය හා මුසු වූ පූර්ණ මිනිස් ජීවිතයකට ඉන් ලැබෙන්නේ සුවිසල් මෙහෙයකි. ඒ සුවිසල් මෙහෙය සාහිත්‍යයෙන් ලබන්නට නම් එය මනාව පරිශීලනය කළ යුතු ය, එය මනාව සොයා බැලිය යුතුය. එහි මනාව හැසිරිය යුතු ය. සාහිත්‍ය විචාරය යනුවෙන් හැඳින්වෙන්නේ ඒ මනා සොයා බැලීම යි. එය, සාහිත්‍ය පරිශීලනය කරන්නන්ගේ අභිමතය පරිදි සිදුකළ හැක්කක් නොවේ. අපූරු නිරීක්ෂණයක් ඊට අවශ්‍ය ය. නැතහොත් ක්‍රමවේදයක් ඊට අවශ්‍ය ය. සාහිත්‍යය විචාර මූලධර්ම යනු ඒ ක්‍රමවේදය යි. මේ පාඩමෙන් අවධානයට ලක් කෙරෙන්නේ එම මූලධර්ම පිළිබඳව ය.

## සාහිත්‍යය කාව්‍යය

චිත්‍ර, නැටුම්, සංගීතය සේ ම සාහිත්‍යය ද කලාවකි. සාහිත්‍ය කලාව හැඳින්වීම සඳහා ''කාව්‍ය'' යන්න පෙරාපරදිග ම යෙදී ඇත. ගද්‍ය සහ පද්‍ය වශයෙන් කාව්‍ය කොටස් දෙකකි. ගද්‍ය වේවා පද්‍ය වේවා කාව්‍ය යන අපූරු සංකල්පයෙන් හැඟෙන අරුත් සොයා ගිය පෙරාපර දෙදිග විචාරකයින් ඉදිරිපත් කළ අදහස් මෙසේ ය.

## පෙරදිග විචාරක අදහස්

### වාක්‍යම් රසාත්මකං කාව්‍යම්

''රසය ආත්මය කොටගත් වාක්‍ය කාව්‍යය යි.''

-විශ්වනාථ-

### නනු ශබ්දාර්ථෞ කාව්‍යම්

''එක්තැන් වූ ශබ්දය හා අර්ථය කාව්‍යය යි''

-රුද්‍රට-

**ශබ්දාර්ථෞ නිර්දොෂෞ සගුණෞ ප්‍රායඃ සාලංකාරෞ කාව්‍යම්**

"දොස් රහිත වූත් ගුණ සහිත වූත් අලංකාරවලින් ශෝභා සම්පන්නවූත් ශබ්දාර්ථ දෙදෙනා කාව්‍ය වන්නේ ය."

-වාග්භට-

**රමණීයාර්ථ ප්‍රතිපාදකඃ ශබ්දඃ කාව්‍යම්**

"රමණීය අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍යය යි."

-ජගන්නාථ-

## අපෙරදිග විචාරක අදහස්

"කවිය වනාහි හොඳම වචන හොඳම පිළිවෙලට යෙදීම යි."

-එස්.ටී. කොල්රිජ්-

"කවිය යනු අනුත්සාහකව ගලා එන ප්‍රබල හැඟීම් ය."

-විලියම් වර්ඩ්ස්වර්ත්-

"කවිය වූ කලී ජීවිතය පිළිබඳ මිනිසාගේ ප්‍රතික්‍රියා සටහන් කරවන සූක්ෂම උපකරණයකි."

-ලුවී මැක්නීස්-

"කවිය යනු ස්මරණීය වාගාලාපය යි."

-ඩබ්ලිව්.එච්. ඕඩන්-

මේ සියලු අදහස් කාව්‍යය යන්නට නිර්වචනයන් ය. ඉදිරිපත් ව ඇති මේ නිර්වචනවලින් කාව්‍ය පිළිබඳ ව එක් පාර්ශවයක් පමණක් අර්ථවත් වේ. එම නිසා කාව්‍ය හැඳින ගැනීම සඳහා එක් එක් නිර්වචන පමණක් ගැනීම ප්‍රමාණවත් නො වේ.

කාව්‍ය යනු සංකීර්ණ කලා මාධ්‍යයකි. එමෙන් ම එය සියුම් ප්‍රකාශන මාධ්‍යයකි. කවියා නිරන්තරයෙන් උත්සාහ ගන්නේ අපූරු අත්දැකීමක් සූචනය කොට සහෘදයා තුළ චමත්කාරයක් දනවීමට ය. එසේ වූ කාව්‍ය විචාරයට ලක් කළ යුතු කරුණු කීපයක් පෙරා' පර දෙදිග විචාරකයින් පෙන්වා දී ඇත.

## 1. භාෂාව

කවියාගේ මාධ්‍යය භාෂාව යි. සිය සිතැඟියාවන් සහෘදයා වෙත රැගෙන යන්නේ භාෂාව මගිනි. කවියා කෙතරම් ප්‍රබල ව භාෂාව භාවිත කරන්නේ ද, ඒතරමට ම සිය අත්දැකීම සහෘදයාට සම්ප්‍රේෂණය කිරීමට හැකියාව ලැබේ. කාව්‍යකරණයට ආවේණික වූ විශේෂ භාෂාවක් කවියාට නැත. ඇත්තේ සාමාන්‍ය ව්‍යවහාර ලෝකයේ භාෂාව ම ය. ඒ භාෂාව කවියා විශේෂ ආකාරයෙන් යෙදා ගනියි.

භාෂාවෙන් ප්‍රකට වන අර්ථ දෙකකි. ඒ මතුපිට අර්ථය හෙවත් වාච්‍යාර්ථය හා සැඟවුණු අර්ථය හෙවත් ව්‍යංග්‍යාර්ථය යි. කාව්‍යයේ භාවිතවන්නේ මෙයින් ව්‍යංග්‍යාර්ථය යි. ශෝභා-සම්පන්න භාෂාව ලෙස ආනන්දවර්ධන නම් විචාරකයා දක්වන්නේ ඒ ව්‍යංග්‍යාර්ථවත් භාෂාව යි. ''ධ්වන්‍යාලෝක'' නම් කෘතියේදී සිය ධ්වනිවාදය පැහැදිලි කරමින් ආනන්දවර්ධනයන් තවදුරටත් දක්වා ඇත්තේ ඒ ව්‍යංග්‍යාර්ථවත් භාෂාව තුළ ධ්වනිතාර්ථවත් භාෂාව පවතින බව යි. කාව්‍යයක පැවතිය යුතු ඒ ධ්වනිතාර්ථවත් භාවය කාව්‍යයේ ආත්මය වන බව ද ඔහුගේ පිළිගැනීම යි.

''කාව්‍යස්‍යාත්මා ධ්වනිඃ''

**සඳ බැස ගියේ ය.**
**ඉර බැස ගියේ ය.**

යන වාච්‍යාර්ථය ප්‍රකට කරන යෙදුම් කවියා ව්‍යංග්‍යාර්ථවත් ව යොදන්නේ,

**''සඳ ගිලුනේ ය.''**
**''ඉර එළිය හැකිලුණේ ය.''**

යනුවෙනි. එවිට බැස ගියේ ය යන්නෙන් ප්‍රකාශ වූ දෙයට වඩා ගැඹුරු වූ ත් සුන්දර වූ ත් අරුතක් ''ගිලුණේ ය'', ''හැකිළුණේ ය'' යන වචනවලින් මතුවේ.

**''තෙරක් නොමැති සිතිවිලි සයුරක් මැද**
**සරන විටදි රැය ගෙවෙන තුරාවට''**

මෙහි වචනාර්ථය වන්නේ තමන්ගෙන් ඈත්ව ගිය පෙම්වතියක පිළිබඳ ව පෙම්වතෙකු රැය එළිවන තුරු කල්පනා කරමින් සිටි අකාරයක් ගැන ය. එහෙත් කවියා එය ව්‍යංග්‍යාර්ථවත් ව ප්‍රකට කර ඇත්තේ සිතිවිලි නැමති සයුරක රැය ගෙවන තුරු ඇවිද ගිය බව යි. ඉන් වාච්‍යාර්ථයට වඩා ඉදිරියට ගිය අරුතකට සහෘදයා කැඳවාගෙන යයි.

නාලාගිරි දමනයේ දී බුදුරජාණන් වහන්සේ ඉදිරියට නාලාගිරි ඇතා පැමිණි සාමාන්‍ය සංසිද්ධිය, භාෂාව අපූරු ලෙසත් විශේෂ ලෙසත් යොදා ගෙන බුත්සරණ කතුවරයා ඉදිරිපත්කර ඇති ආකාරය මෙසේ ය.

**''............ඈත ධූලින් වැසී ගිය ඇත් රජයැ. මෑත සවනක් ඝන බුදු රැසින් සැදී ගිය බුදු රජාණෝයැ. ඈත කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජයැ. මෑත කරුණාවෙන් තෙත්ව ගිය නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදුරජාණෝයැ. ඈත එබු-එබු පයින් මහ පොළව පලා පියන්නාක් සේ දිවෙන ඇත් රජයැ. මෑත එබු-එබු පයින් මිහිකත සනහ සනහා වඩනා බුදුරජාණෝයැ. ඈත බැලු-බැලුවන් ''අනේ අනේ !'' යි කියවන ඇත් රජයැ. මෑත බැලු - බැලූවන් ''සාධු! සාධු!'' යි කියවන බුදුරජාණෝයැ. එවේලෙහි ඒ ඇතු ළංවත් ළංවත් සැදූහැත්තෝ ළෙහි අත් ගසන්නට වන්හැ. මුහුණැ අත් දෙන්නට වන්හැ. බලා සිටියැ නො හෙම්හයි' යි මුහුණින් හෙන්නට වන්හැ.....''**

නාට්‍යයක ආකාරයෙන් බුදුරජාණන් වහන්සේත් ඇතාත් දෙපසක තබා වර්ණනාවට ලක් කිරීමෙන් සහෘදයා තුළ විටක වීර රසයත් විටක කරුණා රසයත් ආදිය මවන්නට කවියා සමත්වී ඇත.

දරුණු නියඟයක් පිළිබඳ චිත්‍රයක් සහෘද සිතෙහි මවන්නට ව්‍යංග්‍යාර්ථවත් භාෂාව යොදාගෙන ඇත්තේ මේ අයුරෙනි.

**සුදට වියලුණු තොල් විවර කර**
**වැස්ස වළාහක හද තෙමන තුරු**
**පොළව උඩුබැලියෙන් සිටී බලාගෙන**

මෙහිද විශේෂ වූ භාෂාවක් නොයෙදී ඇති අතර ප්‍රස්තුතයට අනුකූල ව භාෂාව විශේෂ ව යොදාගෙන ඇති බව පෙනේ.

කාව්‍යයක මේ විශේෂ භාෂා භාවිතය පෙරදිග විචාරකයින් හඳුන්වන්නේ ''රීතිය'' යනුවෙනි. රීති වාදය ඉදිරිපත් කළ විශ්වනාථ නම් විචාරකයා ''කාව්‍යාලංකාර සූත්‍රයේ දී'' රීතිය යනු අපූරු ලෙස පද ගැළපීම ලෙස දක්වා ඇත. බටහිර කාව්‍ය විචාරක අයි. ඒ. රිචඩ්ස් ද මේ සුවිශේෂී පද ගැළපීම කාව්‍යයක අනිවාර්යය අංගයක් බව දක්වා ඇත.

## 2. සංකල්ප රූප

කාව්‍ය විචාරයේ දී අවධානයට ලක් කළ යුතු තවත් අංගයක් ලෙස සංකල්ප රූප දැක්විය හැකිය. සහෘදයාගේ පසිඳුරන් මාර්ගයෙන් ඔහුගේ සිතට ඇතුළු වී භාව ප්‍රබෝධයක් ඇති කිරීමට සමත්වන, වචනවලින් මැවූ චිත්‍රය සංකල්ප රූප නම් වේ. සංකල්ප රූපවලින් සිදුකෙරෙන්නේ යම්කිසි අවස්ථාවක් හෝ මනෝ භාවයක් සහෘද සිතෙහි උත්කර්ෂවත් ව තැන්පත් කිරීම යි. ඉන් ඔහුට සාමාන්‍ය ලෝකයෙන් කාව්‍ය ලෝකයට ඇතුළුවීමට අවස්ථාව සැලසේ.

කාව්‍යයක් විචාරයේ දී ඉන් සහෘද සිත පුබුදුවාලන අදහසක් මතු ව ඇත් ද යන්න සොයා බැලිය යුතු ය. කවියා සංකල්ප රූප නම් මෙවලම භාවිත කරන්නේ ඒ සඳහා ය. සංකල්ප රූප යන්නෙහි සරල අදහස රමණීය වූ අදහස යන්න යි. රමණීය වූ අදහසක් නොමැත්තේ නම් එහි කාව්‍යයක් නැත.

කවියා සංකල්ප රූප භාවිත කිරීමේ දී යොදා ගන්නේ විවිධාකාර අලංකාර යි. ලලනාවක් විවිධ ආභරණවලින් පළඳවා අලංකාර කළ විට මනමාලියක් වී සියල්ලන්ගේ සිත් පැහැර ගන්නේ යම්සේ ද කාව්‍යයේ ශරීරයට අලංකාර යෙදීමෙන් සහෘද සිත පැහැර ගැනේ.

පෙරදිග (භාරත) අලංකාරවාදය ඉදිරිපත් කළ භාමහ (කාව්‍යාලංකාරය) රුද්‍රට (කාව්‍යාලංකාර සංග්‍රහ) දණ්ඩින් (කාව්‍යාදර්ශය) වැනි පෙරදිග කාව්‍ය විචාරකයන් ද හර්බට් රීඩ්, මිඩ්ල්මන් මරී වැනි අපරදිග විචාරකයන් ද කාව්‍යයක රමණීය බව ඇතිකරලීම සඳහා අලංකාර භාවිතය අවශ්‍ය බව පෙන්වා දී ඇත. දණ්ඩින් සිය කාව්‍යාදර්ශයේ දී කාව්‍යයේ ශෝභාව වඩවන ධර්ම අලංකාර බව පෙන්වා දීමෙන් එය තහවුරු වේ.

> ''කාව්‍යශොභාකරාන් ධර්මාන්
> අලංකාරාන් ප්‍රචක්ෂතෙ''

කාව්‍යකරණයේ දී බහුල වශයෙන් යොදා ගන්නා අලංකාර කීපයක් ඇත. උපමාලංකාරය හා රූපකාලංකාරය වඩාත් ප්‍රකට අලංකාර දෙකකි. කිසියම් වස්තුවක් තවත් වස්තුවකට මෙන්, සේ වැනි නිපාත පද යොදා සමාන කර දැක්වීම උපමාලංකාරය යි.

**''සපුමල් කැලෙව් තුඩ මද රතිනි මනහර''**

තොටගමුවේ සිරි රාහුල හිමියන් සැළලිහිණියාගේ හොට සපුමල් කැකුළකට උපමා කර ඇත. සැළලිහිණියාගේ හොට හා සපුමල් කැකුල ප්‍රමාණයෙන් හා පැහැයෙන් සමනාත්මතාවක් ගන්නා නිසා ඒ උපමාව භාවිත කර ඇත.

මෙන්, සේ ආදී උපමාවාචී නිපාත පද භාවිත නොකොට ඍජුව ම යම් වස්තු දෙකක්, එකක් ලෙස දැක්වීම රූපකාලංකාරයයි.

**''වැඳ ඔහු පද කමල**
**තමා ආ තතු කීය මූසිල''**

මෙහි ගුත්තිල පඬිතුමාගේ දෙපා නෙළුමක් හා සමාන යැයි නොපවසා මූසිලයන් ගුත්තිලයන්ගේ ''පාද පද්ම'' වඳින ලද බව දක්වා ඇත.

කාව්‍යාලංකාර අතරින් උත්ප්‍රේක්‍ෂාලංකාරයට ද විශේෂ තැනක් හිමිවෙයි. ලෝකයේ ස්වභාවයෙන් පවත්නා දෙයක් වෙනත් ආකාරයකින් දැකීම උත්ප්‍රේක්ෂාලංකාරය යි.

**නුපුබුදු තැඹිලි මල්**
**ඇගේ දඟ යුගට මන කල්**
**පැරද සැඟවුණු තුල්**
**කොළපු ඇතුළට පිවිසි හැම කල්**

තැඹිලි මල පිබිදෙන්නට පෙර කොළපු තුළ තිබීම ස්වාභාවික සිද්ධියකි. මෙය කවියා වෙනත් ආකාරයකින් දකියි. පිබිදීමට ආසන්න වූ තැඹිලි මල වසා තිබෙන කොළපුව ඇගේ (කාව්‍යශේඛරයේ-බමුණු කුමරියගේ) දඟ යුවළට (දෙකලවාවලට) පරදියි. ඉන් ලැජ්ජාවට පත්වූ තැඹිලිමල හැම විට ම කොළපුව

තුළ ම රැඳී සිටින්නාක් වැනි ය. කවියාගේ මේ අපූරු දැකීම නිසා සහෘදයාගේ සිතේ රමණීය සිතුවමක් මැවෙයි.

මේ අලංකාරවලට අමතරව දීපක, අතිශයෝක්ති, සමාසෝක්ති ආදී රාශියක් අලංකාරවලින් කවිය සරසන්නට කවීහු වෙහෙසෙති. තමන් ඉදිරිපත් කරන අලංකාර නවතාවකින් හා අන්තර්ගතයට උචිත පරිදි ඉදිරිපත් කිරීමට වගබලාගත යුතු බව හර්බට් රීඩ් නම් බටහිර විචාරකයා තරයේ පවසා ඇත.

සංකල්ප රූප භාවිතයේ දී අලංකාරවලට අමතර ව සංකේත භාවිතය ද කවියා විසින් සිදුකරන බව විචාරක පිළිගැනීම යි. සංකේතයක් යනු එක් වස්තුවක් මගින් වෙනත් වස්තුවක්, අදහසක් හැඟවීම යි. එක් උපාසිකාවක් මිය ගොස් ඇති බව සංකේත කීපයක් ඇසුරෙන් ඉදිරිපත් කර ඇති ආකාරය යි මේ.

**පිරුවානා පොත් වහන්සේ**
**කනප්පුවෙහි පෙරලී ඇත**
**මිදුල පුරා වියළුණු කොළ**
**ඒ මේ අත විසිර තිබේ**
**මිදුලෙ පහන් පැලේ නිතර**
**සැළුණු දැල්ල නිවී ගොස් ය**
**ඉඳ හිට ගේ පිළිකන්නේ**
**බල්ලෙකු උඩු බුරනු ඇසේ.**

## 3. පරිකල්පන ශක්තිය

කාව්‍ය විචාරයේ දී අවධානයට ලක්වන තවත් අවස්ථාවකි පරිකල්පන ශක්තිය. ''කල්පන'' යනු සිතීමයි. පරිකල්පන යනු විශේෂයෙන්, හාත්පසින් මනාව සිතීම යි. එසේ නම් කාව්‍යයක් යනු විශේෂයෙන් සිතන ලද්දකි, හාත්පසින් සිතන ලද්දකි, මනාව සිතන ලද්දකි.

ඒ යටතේ කවියා සිය අත්දැකීම පෙර නොවූ විරූ දෙයක් බවට පත් කරයි. සාමාන්‍ය ලෝකයේ පවතින දේ කාව්‍යලෝකයට සුදුසුවන ආකාරයෙන් සකස් කරන්නේ මේ පරිකල්පන ශක්තිය විසිනි. මෙය පෙරදිග කාව්‍ය විචාරයේ දී

''ප්‍රතිභානය'' යනුවෙන් හඳුන්වා ඇත.

**''අපූර්ව වස්තු නිර්මාණක්ෂමා ප්‍රඥා ප්‍රතිභා''**

යම් වස්තුවක් අපූරු ලෙස නිර්මාණය කිරීමේ ප්‍රඥාව ප්‍රතිභාවයි.

**සමන්පිච්ච මල් ඉහිරුණු**
**නිල් තණකොළ පිට්ටනියක්**
**වගෙයි අහස අන්න බලනු**
**කොච්චර ලස්සනද රෑට**

තරු පැයූ ආකාශය කවියෙකු විශේෂයෙන් සිතා ඉදිරිපත්කර ඇති ආකාරයකි එය. ඒ තුළින් සහෘදයාට මැවෙන්නේ රාත්‍රී ආකාශයක් පමණක් ම නොවේ. ඊට එහා ගිය චිත්‍රයක් ඔහුගේ සිතෙහි මතුවේ.

ආලෝකය විහිදෙන සඳක් ගැන කවියා සිය පරිකල්පන ශක්තිය දිග හැර ඇත්තේ මෙසේ ය.

**කන්ද දිගේ ලන්ද දිගේ සළුපොට වැටුණා**
**නින්ද යෙදී නිඳන දියේ දිය මත වැටුණා**
**බැද්ද දිගේ තුරු මුදුනේ වැටී විසුරුණා**
**ඇන්ද සළුව සඳ කුමරී බඳෙන් ගිළිහුණා**

සඳ එළිය විහිදී යන ආකාරය කවියා දක ඇත්තේ සඳ කුමරිය ඇඳ සිටි සළුපොට ගිලිහීයාමක් ලෙස ය. ශෘංගාර රසය ද මවමින් සහෘදයා අපූරු ලොවකට කැඳවාගන්නට කවියාට හැකි වූයේ ඔහු තුළ වූ පරිකල්පන ශක්තිය හේතුවෙනි.

## 4. ශබ්ද ධ්වනිය

කාව්‍යයකට අර්ථ ධ්වනිය මෙන් ම ශබ්ද ධ්වනිය ද එකසේ ම වැදගත් වේ. ඊට හේතුව කාව්‍යය වූ කලී ශබ්දයේත් අර්ථයේත් එකතුව වන බැවිනි.

**''ශබ්දාර්ථෞ සහිතෞ කාව්‍යම්''**

කාව්‍යයක රසය පැතිකඩ දෙකකින් මතුවේ. ඒ ශබ්ද රසය හා අර්ථ රසය වශයෙනි. කාව්‍ය විචාරයේ දී සොයා බැලිය යුත්තේ මේ පැතිකඩ දෙකම කාව්‍යයක පවතී ද යන්න යි. එසේ නොවී අර්ථ රසය යෝ ශබ්ද රසය පමණක් ඇති කාව්‍යය පැවතිය නො හැකි ය.

කාව්‍යයක ශබ්දය වූ කලී අර්ථයේ දෝංකාරය යි. ඒ අනුව කාව්‍යයක ශබ්දය, අර්ථය උද්දීපනය කිරීමට හේතු වේ. ටී. එස්. එළියට් නම් විචාරකයා දක්වන්නේ කාව්‍යයක ශබ්දයෙන් මතු කරන ගීතවත් බව අර්ථයෙන් වෙන් කළ නොහැකි බවයි.

| | |
|---|---|
| වළඳින අදහසින් මෙන් සුර ගඟ | අඟන |
| නල බල සසල දළ රළ පෙළ නුබ | නැගෙන |

මහා සාගරය නැමැති පුරුෂයා අහස් ගඟ නැමැති ප්‍රියාව වැළඳගන්නා අදහසින් අහසට නැගෙන්නේ සුළඟින් සෙලවෙන දෙ අත් නැමැති මහ රළ පෙළින් යුක්තවය. ලකාර බහුල ව යෙදීමෙන් මතුවන අනුප්‍රාස ලක්ෂණය නිසා මෙහි අර්ථයට අනුකූල ව ශබ්ද රසය මතු වී ඇත.

| | |
|---|---|
| මසෙක් ගොදුරු | පතා |
| මෙවුලෙහි මිණි | ගතා |
| නිල් සෙවෙලැයි | සිතා |
| සරල් වරල් | ගතා |

මේ පද්‍යය කියවනවිට ද එහි අර්ථය උද්දීපනය කිරීම සඳහා ශබ්දය අපූරුව ඉවහල් වී ඇති බව පෙනේ. මත්ස්‍යයන්ගේ හැසිරීම් රටාවට ගැළපෙන සේ පද භාවිත කර තිබීම ඊට හේතුව යි.

බුත්සරණ කතුවර විද්‍යාචක්‍රවර්තීන් විසින් වෙස්සන්තර ජාතකයේ විරූපී ස්වරූපයක් ගත් පූජකයාගේ දර්ශනය නිසා ජාලිය-ක්‍රිෂ්ණජිනා සිත් තුළ හට ගත් මහත් කම්පනය, භීතිය පිළිබිඹු කිරීමට ඉතා දක්ෂ ලෙස කැඩි-කැඩි යන කෙටි වාක්‍ය රිද්මය උපයෝගී කරගෙන ඇත්තේ මෙසේ ය.

"උගේ හිස කේ තඹ වනැ. ඇස් පිඟුවමි. බුන් නාසයැ. කන රොම්බුයැ. පිටින් වකැ. බඩින් උසයැ. බඩ මහතයැ. පා බකලයැ. නිය පිරිතියැ.

මෙසේ අවලක්ෂණ වූ යකුට අප නොදෙන්නේ නොවැලැකැ දන් දෙන බැවින් මා දෙන්නේ. මා නැගැණියෝ ඉතා සියුමැලියෝ ය."

මෙහි සරල කෙටි වැකි භාවිතය නිසා අර්ථ උද්දීපනය ශබ්දය ඔස්සේ සිදුව ඇති බව දක්නට ඇත.

## 5. හැඟීම් දනවීම

කවියා නිරන්තරයෙන් ම සහෘදයාගේ බුද්ධියට මෙන් ම හදවතට අමතන්නෙකි. සහෘදයාගේ හදවතට සංවේදී බව ඇතුළු කිරීම කවියාගේ යුතුකමක් ද වන්නේ ය. ඒ නිසා ම කවියා හා හැඟීම් අතර සබඳතාවක් ඇත.

කවියා සිය වාචනා මාර්ගයෙන් භාව හෙවත් හැඟීම් සහෘදයාගේ හදවතට පිවිසවමින් එහි කම්පනයක් ඇති කරලයි. හැඟීම් දනවීම යන්නෙන් අදහස් කරන්නේ එය යි. කාව්‍යයක ඒ ගුණය පවතින්නේදැයි සොයා බැලීම ද විචාර ලක්ෂණයක් ලෙස දැක්විය හැකි ය.

මෙයින් අදහස් කරන්නේ සහෘදයා ඊර්ෂ්‍යාව, වෛරය වැනි පහත් සිතිවිලි හා මුසුකොට හැඟීම් ඇවිස්සීම නො වේ. සහෘද සිතේ හැඟීම් පුබුදුවාලීම යි. පිබිදෙන්නේ කැකුළු ය. ඒ කරුණාව, මෛත්‍රිය, ඉවසීම වැනි සිතිවිලි කැකුළු ය. ඒ සිතිවිලි ඔස්සේ සුපුෂ්පිත උසස් චින්තනයකට මග පාදා දීම කාව්‍යයකින් විය යුතු ය. අපරදිග කාව්‍ය විචාරක පී.ග්‍රේ මහතාගේද අදහස එය යි.

| | |
|---|---|
| ඉඳ ඉඳ එක | වෙහෙර |
| විඳ විඳ දහම් | මනහර |
| සිඳ බිඳ දුක් | සසර |
| අනේ දෙව්දත් නො දිටි | මොක්පුර |

ගුත්තිල කාව්‍යයේ සඳහන් මේ පද්‍ය කියවීමේ දී සාම්ප්‍රදායික දේවදත්ත චරිතය පිළිබඳ ව බුදුන් වහන්සේට එරෙහි වීම සම්බන්ධ ව සහෘද සිතේ වෛරයක්

ක්‍රෝධයක් උපදින්නේ නැත. එහි අවසාන පාදය කියවෙත් ම ඉන් උපදින්නේ සානුකම්පික සිතැඟියාවකි.

කැලේ තිබෙන කොයි දේ වත් රස වේවා
මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා
අච්චේ තියෙන රැස්මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේ වා

යසෝදරාවතේ සඳහන් මේ පද්‍යය කියවන විට සහෘද සිත සැබවින් ම යසෝදරාවන් පිළිබඳ ව දයාබරිත සිතිවිල්ලකට විවර වීම ස්වාභාවික ය. සිදුහත් බෝසතාණන් තමන්ගෙන් වෙන්ව යාම පිළිබඳ ව යසෝදරාවන් තුළ වෛරයකට ඉඩ නොතබා උපේක්ෂාවකට විවර වන පරිදි අවස්ථාව දැක්වීම ඊට හේතුව යි.

පෙරදිග කාව්‍ය විචාරයේ දී රසවාදීන් ''කාව්‍ය රස'' සංකල්පය හඳුන්වා දී ඇත්තේ කාව්‍යයක හැඟීම් දනවීම පිළිබඳ අවධාරණය කිරීමට ය. සහෘද සිතේ කෘත්‍රිම ලෙස ගොඩනැගෙන ප්‍රතික්‍රියා ආස්වාදනීය ලෙස ඉදිරිපත් කළ විට රස උපදී. සාමාන්‍ය ලෝකයේ දී සහෘද සිතේ උපදින රති, හාස්‍ය, ශෝක ආදී හැඟීම් ශෘංගාර, හාස්‍ය කරුණ ආදී රස බවට පත්වී ආනන්දය ලබා දීම රස ඔස්සේ සිදුවේ. හැඟීම් ප්‍රබෝධජනක වන්නේ ඒ රස හා මුසු වූ විට ය.

## 6. චින්තනය

කාව්‍ය විචාරකයා කාව්‍යයක හැඟීම් දනවීම පමණක් නොව එහි යම් චින්තනයක්, දෘෂ්ටියක් පවතීද'යි සොයා බැලීම ද කළ යුතු ය. ඕනෑ ම කාව්‍ය රචකයෙකුට සිය නිර්මාණයට සුදුසු කිසියම් චින්තනයක් මූලාශ්‍රය වේ. ඒ ඔස්සේ ඔහු සහෘදයාගේ බුද්ධියට අමතයි. ගද්‍ය වේවා පද්‍ය වේවා කාව්‍ය නිර්මාණය අත්විඳින සහෘදයා එහි අවසානයේ අපූරු චින්තකයෙකු බවට පත්විය යුතු ය. බුද්ධිමය වශයෙන් ශුභවාදී වෙනසකට ඉන් ඔහුට පත්විය හැකි ය.

ටජ්මහල් සොහොන් කොතේ
සඟවා ඇත්තේ
සාජහන්ගේ අපූරු ප්‍රේමය නොව
අහස උසට නැගි
ඔහුගේ ආඩම්බර යයි.

ප්‍රේමයේ මනරම් ස්මාරකය ලෙස ලෝ ප්‍රකට ටජ්මහල පිළිබඳ ව පැවති සාම්ප්‍රදායික අදහස සහෘද සිතින් ඈත් කොට එමගින් නව චින්තනයක් සහෘදයාට දායාද වීම මේ පද්‍ය නිර්මාණයේ දී සිදුව ඇත.

## 7. ආකෘතිය

කවියා සිය අත්දැකීම් සහෘදයා වෙත රැගෙන යාම සඳහා භාවිත කරන හැඩය නැතහොත් ස්වරූපය ආකෘතිය යි.

කාව්‍යයේ අන්තර්ගතයට අනුකූල වන සේ කවියා සිය ආකෘතිය සකසා ගනී. එය බොහෝ විට ''විරිත'' (වෘත්තය) වැනි සංකල්ප ඔස්සේ කළ හැකි බව විචාරක පිළිගැනීම යි. ආකෘතිය අන්තර්ගතයට අභේදනීය ව පවතින්නකි.

අධික ව සුරා පානය කොට වෙරිමත් වූ අයෙකුගේ හැසිරීම් රටාව ගෙන හැර පානු වස් ඉදිරිපත් කර ඇති සිවුපද ආකෘතිය යි මේ.

රැගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්
පුවත් නොදන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

බියෙන් හා සැකයෙන් යුතු ව තම හිස-රැවුල් බාමින් සිටින කරණවෑමියා දකින රජු තුළ හටගන්නා සංවේගය පළ කිරීම සඳහා, ''පින් නැත්තෙමි'' පද්‍ය පන්තියේ දී ජී. බී. සේනානායක ශූරීන් භාවිත කළ නිසඳැස් ආකෘතිය මෙසේ ය.

''කරණෑමි
තුටු සිතින් අනුන්
බිය සැකින්
මා
දළ රවුළු කපා
පින් නැත්තෙමි මම...''

මීට අමතර ව අපරදිග කාව්‍ය විචාර මූලධර්මවල කාව්‍යයක් විචාරය කිරීමේ දී විචාරකයා පිහිටිය යුතු පදනම් කීපයක් දක්වා ඇත.

* සදාචාරාත්මක විචාරය
* මනෝ විද්‍යාත්මක විචාරය
* සමාජ විද්‍යාත්මක විචාරය

ආදි වශයෙන් දැක්වෙන්නේ ඒවා ය.

කාව්‍යයකින් දෙන පණිවිඩය තුළින් සදාචාරය ඔස්සේ ජීවන අත්දැකීම් පුළුල් කරගන්නට නම් එවැනි මගක් කාව්‍යයක ඇත්දැ'යි සොයා බැලීම සදාචාරාත්මක විචාරය යි. ප්ලේටෝ, මැතිව් ආර්නෝල්ඩ්, ආචාර්ය සැමුවෙල් ජොන්සන් වැනි අය කාව්‍ය විචාරයේ දී මේ පදනම යොදා ගත්හ.

සිග්මන් ෆ්‍රොයිඩ්, යුං ඇඩ්ලර් වැනි මනෝ විද්‍යාඥයන්ගේ අදහස් හා මුසු වෙමින් පැතිර ගිය විචාර ක්‍රමයකි මනෝවිද්‍යාත්මක විචාරය, එයින් ඔවුන් මතු කිරීමට උත්සාහ ගත්තේ කාව්‍යයකින් මනෝ විද්‍යාත්මක විග්‍රහයක් සිදුවන්නේ ද යන්න යි.

සාහිත්‍ය හා සමාජය අතර ඇත්තේ අපූරු බැඳීමකි. ඒ අනුව කාව්‍යයකින් සිදුකෙරෙන සමාජ විග්‍රහය සැලකිල්ලට ගෙන ඩබ්. ඒ. ඕඩන්, ස්පෙන්ඩර් වැනි විචාර වාදීන් ඉදිරිපත් කළ විචාර ක්‍රමය සමාජ විද්‍යාත්මක විචාරය නම් වේ.

මේ ආකාර විචාර රටාවන් ඔස්සේ කාව්‍යයක සුළ මුල පමණක් නොව අන්තර්ගතයත්, ආකෘතියත් මැන බැලීමෙන් විචාරයේ නියැලීමට හැකියාව ඇත. ඒ තුළින් කාව්‍ය පිළිබඳ වූ නිර්වචන කොතෙක් දුරට කාව්‍ය සඳහා ගැළපේද යන්න සොයා බැලිය හැකි ය.

## ක්‍රියාකාරකම 17.1

විචාර මූල ධර්ම පාදක කරගනිමින් පහත සඳහන් ගද්‍ය-පද්‍ය කොටස් විචාරයට ලක් කරන්න.

1. හිමයේ ගොසින් මල් යහනක නිදනවද
කොමළ අනගි සිරිපා දෙක රිදෙනවද
හිගේ නැතිව දෙවියෝ මුර කරනවද
මගේ ඇත් රජුනි හිමි සඳ කොතනකද
-යසෝදරාවත-

2. රෝස මලේ - නටුවෙ කටු
වන බඹරෝ - ඔහොම හිටු
නටුව නොවේ - මල සිඹිමි
මම ළමයෝ - පැණි උරමි
වන බමරෝ - මෙහෙම මලක්
පැණි තොපටයි - මල අපටයි

3. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක්වන ලෙසේ අත් නාදනූ පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟ සුබා

4. අම්මා සඳකි ඔබ ඒ ලොව හිරුය රිදී
ඒ ඉර හඳින් ඔබේ ලෝකය එළිය වුනි
රැකුමට පුතුන් දිවියේ දුක් ගැහැට විඳී
පිය සෙනෙහසට කවි ගී ලිය වුණා මදී

5. ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා
ඒ හිරු එළියේ නැණ මල් පොඩි පිපුණා
ඒ මල් සුවඳේ අද ලොව්තුරු සුව විඳිනා
කලා වැවේ නිල් දියවර අපෙ අම්මා

## ක්‍රියාකාරකම 17.2

පහත සඳහන් පද්‍ය පන්ති පිළිබඳව විචාර සටහන් ඉදිරිපත් කරන්න.

### 1. අන්ධ ළමයා

1. මල් ලස්සනයි හොඳ හොඳ පාටයි කීවා
පෙනෙනවා දකිනවා කියනා ඒවා
මොනවද අම්මේ මම අහගන්නට ආවා
තෝරා දෙන්න මම දන්නේ නැහැ මේවා

2. මල්වල හොඳ සුවඳ මිස පාටක් කොහෙද
ඒවා මොළොක් බව තේරෙනවා මටද
එළියක් කියා මොනවත් හෙම තියෙනවද
මට තේරුම් ගන්න අම්මේ බැරි මොකද

3. උණුසුම දැනේ දහවල මට රැයට වඩා
වෙනසක් හෙම තියෙනව ද එහි මෙයට වඩා
මට නොදැනෙන්නෙ මම කණ කොලුවෙක්ලු කුඩා
ලොකු වෙන කොට දැනේවි ද මම අසමි අඬා

4. ඇඟිලි තුඩට මල් පෙතිවල ඇති මෙළෙක
මට දැනෙනවා එය අල්ලන හැම විටක
පාටක් කියා ඇත්නම් ගතියක් මලක
අම්මේ අත නොගෑවෙන එක තමයි දුක

5. ලස්සන කියන දේ නැහැයට වත් කනට
මගේ දිවට හරි මගෙ අත පයවලට
නොදැනෙන්නේ මොකද තෝරා දෙන කලට
ඉවසා ගෙන ඉන්ට අම්මේ බැරිය මට

6. ඇයි අම්මේ අඬන්නේ මේ කඳුලු සලා
මට දැනෙනවා යයි මගෙ අත දිගට ගලා
නාඬන් අම්මෙ නාඬන් මම විහිළු කළා
එන්නද ගොසින් බොරු කී කොල්ලන්ට තළා

-සුදෝ සුදු-
-කේයස්-



නොමිලේ බෙදා හැරීම පිණිසයි

## 2. ඕ මට හමුවෙයි.

| | | |
|---|---|---|
| 1. | නිල් අතු රිකිලි බිඳ නැඹුල් සුවඳ | හැමූ |
| | ආලෝකය දිගේ සුළඟට එකතු | වෙමූ |
| | ළඟදිම අපේ ජය බිම විය හැකිය | හමූ |
| | මේ හෙල් මැදින් අපි තව ඉදිරියට | යමූ |
| 2. | අත්පොඩි දෙකක සියුමැලි බව ගෙලට | දැනී |
| | උණුසුම් හැඟීමක් හදවත වැළඳ | ගනී |
| | එකෙණෙහි ආදරය පෙළහර නගනු | වැනී |
| | සංගීතයක් තොල් අතරින් පිටට | පනී |
| 3. | කවි රජදහන්හීබැඳි කොටු පවුරු | වගේ |
| | ඇතින් පෙනෙන දම් පැහැ කඳු වළලු | දිගේ |
| | සැන්දෑ වලාවක් යෙහෙළිය නොදක | ඇගේ |
| | විමසා බලන්නට අහසෙහි ඉහළ | නැගේ |
| 4. | පෙම් සිතුවම් මවා හද රජ දහන් | මැද |
| | පන්ගස් මැදින් එන සීතල සුළං | රොද |
| | කුමරිය ඔබේ ගන නිල් කෙස් රොදින් | ඇද |
| | ඇවටිලි කළේ මං සලකුණු කියන් | නද |
| 5. | මුළු ලොව යස ඉසුරු මදි බව සිතෙන | විට |
| | ඉරහඳ කනක තරු පොදි බැඳ එකතු | කොට |
| | පෙම් පඬුරකට ලැබුණත් ඇස් ඉදිරි | පිට |
| | ඔබගේ සුසුමකට නොවටී සොඳුර | මට |

-එච්. එම්. කුඩලිගම-

## ක්‍රියාකාරකම 17.3

පහත සඳහන් ගද්‍ය පාඨ පිළිබඳව විචාර සටහන් ඉදිරිපත් කරන්න.

1. ''මෙසේ එක්ව යන කලට නොකල් නොවේලා කොටලා මහ වැස්සක් නැඟීය. ඒ වේලාට ගසන විදුලියෙන් හා මේඝ නාදයෙන් හා වස්නා වැස්සෙන් ආකාශය අතුරු සිදුරු නැතිවිය. ඒ වෙලාවට ම පිට පිට හෙළා විදුලිය ගසන්නාසේ විළිත් පහරන්නට වන. ආස ගුගුරන්නා සේ හඬ ගසන්නටත් වන. වස්නා වැසි බෝවා සේම ප්‍රසව දුකත් බෝ විය. සමුණාණන් බණවාලා......''

   -පටාචාරා වස්තුව-

   -සද්ධර්මරත්නාවලිය-

2. ''........නැවත නැවතත් කියනලදුව ඉදින් තොප හැමට අභිප්‍රාය වීනම් යම්හ'යි ගිවිස පිරිවර හා සමග එවිලට ආකාශයෙන් බස්නාහු පය මලෙහිම එළාගෙන බටුවාහු ය. එකල බෝධිසත්ත්වයන්ගේ පය යපටකින් මැසූ කලක් පරිද්දෙන් ඇසිර ගියේ ය. ඉක්බිති මල කඩා ගනිම්'යි සිතා ඇදී ඇදී සේ පළමුකොට කකුලේ සම් කැඩී ගියේ ය. දෙවෙනිව මස් කැඩී, තුන් වෙනිව ඇට කැඩී ඇටෙයෙහි ඇසිර සිට ලේ වැහෙන්නට පටන්ගෙන බලවත් වූ දුක්ඛ වෙදනා පැවැත්තේ ය. එකල බෝධිසත්ත්වයෝ ඉදින් මම බැගෑපත්ව ඇඬීම් නම් මාගේ බන්‍ධූහු භයපත්ව ගොදුරු නොකා දුකින් පලා යන්නාහු දුර්වල ව සමුද්‍රයෙහි වැටී යන්නාහ'යි බන්ධූන් කෙරෙහි කරුණායෙන් දුක්ඛයෙන් වෙදනාව ඉවසා හංස සමූහයා කැමති පරිද්දෙන් කා බී කෙළින්ට පටන්ගත් කල්හි බෝධිසත්ත්වයෝ බඳධරාවයෙන් මහ හඬින් හැඬූහ.....''

   -චුල්ලහංස ජාතකය-

   -ජාතක පොත-

### සංකල්පනා

**දුර දිග සිතා බලන්නා යම් තැනකට ඇතුළු වන්නේ**
**ඉන් පිටවන අන්දම ද දැනගෙන ය.**